

වාර්ෂික වාර්තාව 2019

IPS
ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය

අන්තර්ගතය

01 අප ගැන
දැක්ම
මෙහෙවර
පාලක මණ්ඩලය

02 2019 වර්ෂයේ විශේෂ අවස්ථා

06 සභාපතිතුමාගේ පණිවුඩය

07 විධායක අධ්‍යක්ෂතුමියගේ වාර්තාව

09 පර්යේෂණ වැඩසටහන

10 සාර්ව ආර්ථිකය, වෙළඳාම සහ තරගකාරීත්වය

21 සංක්‍රමණය සහ නාගරීකරණය

26 සෞඛ්‍යය, අධ්‍යාපනය සහ ශ්‍රමය

33 දරිද්‍රතාවය සහ සමාජ සුභසාධනය

38 කෘෂිකර්මාන්තය සහ කෘෂි ව්‍යාපාර සංවර්ධනය

41 පරිසරය, ස්වභාවික සම්පත් සහ දේශගුණික විපර්යාස

46 පර්යේෂණ කණ්ඩායම් නායකයින්

47 පර්යේෂණ කාර්ය මණ්ඩලය

48 12 වැනි දකුණු ආසියානු ආර්ථික සමුළුව 2019

50 සහායක සේවා

51 සංනිවේදන සහ ජනවිහිදුම්කරණය

52 තොරතුරු පද්ධති

53 පුස්තකාලය

55 2019 වර්ෂයේ ප්‍රකාශන

56 අභ්‍යන්තර සම්මන්ත්‍රණ

57 ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ සීමාවාසික පුහුණු වැඩසටහන 2019

58 මූල්‍ය වාර්තා

අප ගැන

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය යනු පාර්ලිමේන්තු පනතක් මඟින් ස්ථාපනය කර ඇති, ශ්‍රී ලංකාවේ තිබෙන ඉහළම ආර්ථික ප්‍රතිපත්ති පර්යේෂණ ආයතනය යි. ප්‍රතිපත්ති සම්පාදනය සඳහා සහ සියලු ශ්‍රී ලාංකිකයින්ගේ ජීවිත වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය වන ප්‍රබල සාක්ෂි සපයා දීම පිණිස ඉහළ ගුණාත්මකභාවයෙන් යුතු, ස්වාධීන ප්‍රතිපත්ති සම්බන්ධ පර්යේෂණ සිදු කිරීම අපගේ මෙහෙවර වේ.

වසර විසි පහකට (25) අධික කාලයක් පුරා ස්වකීය ආයතනය විසින් සිදු කරන ලද විශිෂ්ඨ ස්වාධීන පර්යේෂණ රාශිය නිසා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය ආර්ථික ප්‍රතිපත්ති පර්යේෂණ ක්ෂේත්‍රයෙහි විශිෂ්ඨතා මධ්‍යස්ථානයක් ලෙස පිළිගැනමට ලක්වී තිබේ. මෙම ආයතනයෙහි පර්යේෂණ වැඩසටහන මඟින් ශ්‍රී ලංකාවේ සහ ආසියානු කලාපයේ වර්තමාන සමාජ-ආර්ථික ප්‍රතිපත්ති සම්පාදනයට අදාළ ඉතා වැදගත් ක්ෂේත්‍ර ගණනාවක් ආවරණය කෙරෙයි. වාර්තා, පර්යේෂණ පත්‍රිකා, සඟරා, ලිපි සහ ප්‍රසිද්ධ ඉදිරිපත් කිරීම් හරහා පුළුල්ව ප්‍රචාරණය කරනු ලබන ආනුභවික-පාදක පර්යේෂණ මඟින් ආර්ථික ප්‍රතිපත්ති සම්පාදනයට සහාය දීමේ ස්වකීය ජයග්‍රාහී වාර්තාව බිහි කිරීමට මූලික වූයේ ආයතනයේ ප්‍රබල අභ්‍යන්තර පර්යේෂණ කණ්ඩායමෙහි පරිපූර්ණ නිපුණත්වය යි.

දැක්ම

ශ්‍රී ලංකාවේ සමාජ-ආර්ථික පරිණාමය සඳහා උත්ප්‍රේරකයක් වන, ගෝලීය වශයෙන් ඒළිඟත් පර්යේෂණ ආයතනයක් බවට පත්වීම

මෙහෙවර

සමාජ-ආර්ථික ගැටළු පිළිබඳ විශ්වාසනීය, නියුණු දැක්මක් සපයා දෙන, ඉහළ ගුණාත්මක භාවයෙන් යුතු, ස්වාධීන, ප්‍රතිපත්ති සම්බන්ධ පර්යේෂණ සිදු කිරීම මඟින් අපගේ පාර්ශවකරුවන්ව දැනුවත් කිරීම සහ ප්‍රතිපත්ති න්‍යාය පත්‍ර හැඩගැස්වීම සහ එමඟින් සියලු ශ්‍රී ලාංකිකයින්ගේ ජීවිත කෙරෙහි සාධනීය බලපෑමක් ඇති කිරීම

පාලක මණ්ඩලය

මහාචාර්ය සිරිමල් අබේරත්න,
සභාපති
ආර්ථික විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය, කොළඹ විශ්වවිද්‍යාලය

ආචාර්ය ඉන්ද්‍රජීත් කුමාරස්වාමි,
සාමාජික
අධිපති ශ්‍රී ලංකා මහ බැංකුව (නිල බලයෙන්)

චාන්දනී විජේවර්ධන මහත්මිය,
සාමාජික
ලේකම්, ජාතික ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු අමාත්‍යාංශය (නිල බලයෙන්)

එස්. එස්. මුදලිගේ මහතා,
සාමාජික
අධ්‍යක්ෂ ජනරාල්, ජාතික කුමසම්පාදන දෙපාර්තමේන්තුව (නිල බලයෙන්)

ආචාර්ය සරත් රාජපක්‍රිරණ,
සාමාජික
ජනාධිපති ආර්ථික උපදේශක

ආචාර්ය රොෂාන් පෙරේරා,
සාමාජික
අතිරේක අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා මහ බැංකුව

අනුෂ්ක විජේසිංහ මහතා,
සාමාජික
උපදේශක, සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය

ආචාර්ය දුෂ්නි වීරකෝන්,
විධායක අධ්‍යක්ෂ
ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය

විශේෂ අවස්ථා

ජනවාරි

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන - මොනෑෂ් සමුළුව දකුණු ආසියාවේ ආර්ථික සංවර්ධනය පිළිබඳ පර්යේෂණ ඉස්මතු කරයි



ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය ඔස්ට්‍රේලියාවේ මොනෑෂ් විශ්වවිද්‍යාලයේ සංවර්ධන ආර්ථික විද්‍යාව සහ තිරසරභාවය පිළිබඳ මධ්‍යස්ථානය සහ දකුණු ආසියා පර්යේෂණ ජාලය සමග එක්ව සමසංවිධානය කරන ලද "දකුණු ආසියාවේ ආර්ථික සංවර්ධනය" පිළිබඳ සමුළුව 2019 ජනවාරි 0708 යන දින වල කළුතරදී පවත්වන ලදී

මෙම සමුළුවෙහිදී දළිඳුකම සහ අසමානාත්මතාවය, ව්‍යවසායකත්වය, කෘෂිකර්මය,පරිසර තිරසරභාවය ශ්‍රමය සහ සංක්‍රමණය, අධ්‍යාපනය, සාර්ව ආර්ථික වර්ධනය සහ මූල්‍ය වෙළඳපොළ යන ක්ෂේත්‍ර පිළිබඳව අවධානය යොමු කරන ලදී. එමගින් අහඹු ක්ෂේත්‍ර පරීක්ෂණ, පරිභෝජනයෙහි අවකාශීය ව්‍යාප්තිය, සහ දිළිඳුභාවයෙහි බහුමාන සහසම්බන්ධයන් සහ ක්ෂුද්‍ර ආර්ථිකමිතික විශ්ලේෂණ වැනි නවතම පර්යේෂණ ක්‍රම භාවිතා කරමින් එම කලාපයෙහි සංවර්ධනය දිරිමත් කිරීම සඳහා වන නව්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවල සංවර්ධන බලපෑම විමසා බලන ලදී

පෙබරවාරි

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය දකුණු ආසියාවේ බාහිර අවදානම්පාත්‍රතා පිළිබඳ කලාපීය සමුළුවකට සමසත්කාරකත්වය සපයයි



ලෝක බැංකුව, ශ්‍රී ලංකා මහ බැංකුව, සහ කොළඹ විශ්වවිද්‍යාලය සමග එක්ව ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය 2019 පෙබරවාරි 28 මාර්තු 01 යන දිනවල පැවති 'දකුණු ආසියාවේ බාහිර අවදානම්පාත්‍රතා නැමති කලාපීය සමුළුවට' සමසත්කාරකත්වය සපයා දුන්නේය

ශ්‍රී ලංකාව ඉදිරි වර්ෂ කිහිපය තුළදී ගෙවිය යුතුව ඇති විදේශ ණය සැලකිය යුතු ප්‍රමාණයක් ගෙවීමට සූදානම් වෙමින් සිටින අවස්ථාවක රට විදේශ ණය සහ වර්ධනය මන්දගාමී වීම යන තර්ජන දෙකට මුහුණ දෙමින් සිටින බව මෙම සමුළුව ඇමතූ ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ විධායක අධ්‍යක්ෂ දුෂ්නි වීරකෝන් මහත්මිය නිරීක්ෂණය කළාය. එමෙන්ම සාර්ව ආර්ථික කළමනාකරණය සඳහා ප්‍රතිපත්ති සංගතභාවයක් සහ සම්බන්ධීකරණයෙන් යුතු ප්‍රවේශයක් තිබීමේ වැදගත්කම ද ඇය තවදුරටත් අවධාරණය කළාය

මාර්තු

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂකයින් 2019 අයවැය සඳහා ප්‍රතිචාර දක්වත



2019 මාර්තු මස 05 වැනි දින ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේදී 2019 වර්ෂයේ අයවැය ඉදිරිපත් කරමින් තිබූ අවස්ථාවේදී ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂකයින් එම අයවැය යෝජනා පිළිබඳ තම දැක්ම ට්විටර් හරහා ඉදිරිපත් කළහි සාර්ව ආර්ථික වර්ධනය, බදුකරණය, වෙළඳාම, අධ්‍යාපනය, සංක්‍රමණය, ශ්‍රම බලකා සහභාගිත්වය, තිරසර සංවර්ධනය සහ සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම වැනි විවිධ ගැටළු පරාසයක් පිළිබඳව ඔවුහු අදහස් දැක්වූහි

2019

අප්‍රේල්

මහනුවර නගරයේ රථවාහන තදබදය පිළිබඳ පර්යේෂණය වාර්ෂික සමන් කැලේගම අනුස්මරණ පර්යේෂණ ප්‍රදානය හිමිකර ගනියි



ආචාර්ය සමන් කැලේගම මහතාගේ ස්වාධීන පර්යේෂණ සහ රාජ්‍ය ප්‍රතිපත්ති නියැළීම් උරුමයට ගරු කරමින් ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ සමන් කැලේකම අනුස්මරණ පර්යේෂණ ප්‍රදානය 2019 මගින් කොළඹ විශ්වවිද්‍යාලයේ කණිෂ්ක වැරැල්ල ශිෂ්‍යයාට රු 150,000 ක මුදලක් ප්‍රදානය කරන ලදී. එම ශිෂ්‍යයා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ මාස තුනක සීමාවාසික පුහුණුව ලබන කාලය තුළදී සිදු කිරීමට යෝජිත මහනුවර නගරයේ පවතින රථවාහන තදබදයෙහි පිරිවැය තක්සේර කිරීම සහ 'හරිත මගී ගමනාගමනයට' බලපාන සාධක පිළිබඳ පර්යේෂණය සඳහා මෙම ප්‍රදානය ලබා දෙන ලදී.

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ විධායක අධ්‍යක්ෂතුමිය ගෝලීය ඒකාබද්ධවීම සඳහා වෙළඳ ප්‍රතිපත්ති යොදා ගැනීම පිළිබඳ කථා කරයි

මැයි



ප්‍රධාන ගෝලීය ආර්ථික ප්‍රවනතා සැලකිල්ලට ගනිමින් සහ මහා පරිමාණ සම්බන්ධතා ව්‍යාපෘතිවල තිබෙන අභියෝග කෙරෙහි අවධානය යොමු කරමින් ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ විධායක අධ්‍යක්ෂ දුෂ්නි වීරකෝන් මහත්මිය 'යටිතල පහසුකම් මූල්‍යකරණය සහ එක් තිරුවක්එක් මාවතක් වැඩසටහන: නැගී එන ආර්ථිකයන් සඳහා ඇති අභියෝග' යන මාතෘකාව යටතේ පත්‍රිකාවක් ඉදිරිපත් කළාය.

පොදු රාජ්‍ය මණ්ඩලයෙහි සහ දකුණු ආසියානු අධ්‍යයන ආයතනයෙහි සමසංවිධානයෙන් 2019 මැයි මස 28-29 යන දිනවල සිංගප්පූරු ජාතික විශ්වවිද්‍යාලයේදී ගෝලීය ඒකාබද්ධවීම සඳහා වෙළඳ ප්‍රතිපත්ති යොදා ගැනීම යන මාතෘකාව යටතේ පැවති ආසිය පැසිෆික් කලාපය සඳහා වන පොදු රාජ්‍ය මණ්ඩලීය උපදේශන සැසියේදී ඒ මහත්මිය කථාවක් පැවැත්වූවාය.

අෂානි අබයසේකර මහත්මිය ශ්‍රී ලංකාවේ විශ්‍රාම වැටුප් ආවරණය පිළිබඳ කථා කරයි

ජූනි



ආර්ථික සහයෝගිතාවය සහ සංවර්ධනය සඳහා වන සංවිධානයේ කොරියානු ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් සත්කාරකත්වය දරන ලද 2019 ජූනි මස 13-14 යන දිනවල දකුණු කොරියාවේ සෝල් නගරයේ පැවති 14 වැනි විශ්‍රාම වැටුප් විශේෂඥයින්ගේ හමුවේදී ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂණ නිලධාරී අෂානි අබයසේකර මහත්මිය "ශ්‍රී ලංකාවේ විශ්‍රාම වැටුප් ආවරණය" පිළිබඳ ඉදිරිපත් කිරීමක් සිදු කළාය. ශ්‍රී ලංකාවේ වයස්ගත ජනගහනයෙහි සීඝ්‍ර ඉහළ යාමක් පවතින සංදර්භය තුළ විවිධ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම මගින් විශ්‍රාම වැටුප් ලැබීමට සුදුසුකම සහිත ජනගහනය ආවරණය කිරීම වර්තමානයේ ඒ සම්බන්ධයෙන් මුහුණ දෙනු ලබන ගැටළු සහ අන්තර්ජාතික යහපරිචයන් ගෙන් ඉගෙන ගනිමින් වඩා විශාල ආවරණයක් සඳහා පහසුකම් සැලසිය හැකි පරිදි ක්‍රියාත්මක කළ හැකි ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ආදියට මෙම ඉදිරිපත් කිරීම තුළින් ආමන්ත්‍රණය කරන ලදී.

ජූලි

ගංගා තිලකරත්න මහත්මිය වැඩිහිටියන් ශ්‍රම බලකායට සහභාගීවීම කෙරෙහි බලපාන සාධක අවධාරණය කළාය



2019 ජූලි මස 12 වැනි දින ඇමරිකා එක්සත් ජනපදයේ වොෂිංටන් ඩීසී හි පිහිටි ලෝක බැංකු මූලස්ථානයේ දී පවත්වන ලද 'ඉස්මතු වෙමින් පවතින ගෝලීය අභියෝග සහ දකුණු ආසියාවේ සංවර්ධන උපාය මාර්ග පිළිබඳව වූ ආර්ථික ආදර්ශකරණය පිළිබඳ දකුණු ආසියානු ජාල 7හැඒ*ලෝක බැංකු තුන් වැනි උතුරු ඇමරිකානු සාකච්ඡා සංසදයේදී වැඩිහිටි ශ්‍රම බලකාය සහ ශ්‍රී ලංකාවේ ආර්ථකය කෙරෙහි එයින් ඇතිවන බලපෑම අවධාරණය කරමින් ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂණ සාමාජික ගංගා තිලකරත්න මහත්මිය 'විශ්‍රාම ගැනීමේ වයසෙන් ඔබ්බට වැඩකිරීම: වැඩිහිටියන් ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකායට සහභාගීවීමේ රටා සහ එයට බලපාන සාධක' නැමති මාතෘකාව යටතේ පත්‍රිකාවක් ඉදිරිපත් කළායි

අගෝස්තු

මනෝජ් තිබ්බොටුවාව මහතා තේ දළු නෙළන්නන් සඳහා ජීවත්වීමට සරිලන වැටුපක් ලැබීම සහතික කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කළේය



තේ කර්මාන්ත අංශයේ සේවකයින් සඳහා ජීවත් වීමට සරිලන වැටුපක් ලැබීම පිළිබඳ ශ්‍රී ලංකාවේ සිද්ධි අධ්‍යයනයෙන් ලබා ගත් අත්දැකීම් සමාලෝචනය කරමින් ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂණ සාමාජික මනෝජ තිබ්බොටුවාව මහතා 2019 අගෝස්තු මස 0709 යන දිනවල නිව්යෝර්ක් නගරයේ පිහිටි සෝෂල් එකවුන්ටබිලිටි ඉන්ටර්නැෂනල් සංවිධානයේ මූලස්ථානයේදී පවත්වන ලද ජීවත් වීමට සරිලන වැටුප පිළිබඳ ගෝලීය සංධානයේ පළමු වැනි පර්යේෂණ ජාල වැඩමුළුවට සහභාගි වූයේයි ඒ මහතා තේ දළු නෙළන්නන් සඳහා ජීවත් වීමට සරිලන වැටුපක් ලැබීම සහතික කිරීම පිණිස තේ අගය දාමයන්ට අයත් සියලුම පාර්ශ්වකරුවන් සමග ඒකාබද්ධව කටයුතු කිරීමේ ඇති වැදගත්කම අවධාරණය කළේයි

සැප්තැම්බර්

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය 12 වැනි දකුණු ආසියානු ආර්ථික සමුළුවට සත්කාරකත්වය සපයයි



ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය 'හතරවැනි කාර්මික විප්ලවය තුළ දකුණු ආසියාවේ ආර්ථිකය හැඩගැසීම' යන තේමාව අවධාරණය කරමින් 2019 සැප්තැම්බර් 2627 යන දිනවල කොළඹදී පැවති 12 වැනි දකුණු ආසියානු ආර්ථික සමුළුවට සත්කාරකත්වය සපයා දුන්නේයි එම සමුළුවේදී දකුණු ආසියාවේ පවතින විවිධ ගැටළු සඳහා තාක්ෂණය□ ආර්ථිකය සහ දේශපාලනය එකට බැඳීම අවධාරණය කරන ලදී මෙම සමුළුව ආරම්භ වූ 2008 වර්ෂයේ සිටම සමුළුව මගින් දකුණු ආසියානු කලාපය මුහුණ දී ඇති සමාජආර්ථික අභියෝග සාකච්ඡා කිරීම සහ විවාද කිරීම සඳහා සහ දකුණු ආසියානු රටවල් අතර කලාපීය ඒකාබද්ධතාවය සහ සහයෝගිතාවය පෝෂණය කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා කලාපීය වේදිකාවක් සපයා දී ඇති

ඔක්තෝබර්

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ ප්‍රමුඛතම වාර්තාව වන 'ශ්‍රී ලංකාව: ආර්ථිකයෙහි තත්ත්වය 2019' නැමති වාර්තාව මගින් ආයතනය "හතර වැනි කාර්මික විප්ලවය (4IR) තුළ ශ්‍රී ලංකාවේ ආර්ථිකය පරිවර්තනය කිරීම" කෙරෙහි අවධානය යොමු කරයි



ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය සිය ප්‍රමුඛතම වාර්ෂික වාර්තාව වන 'ශ්‍රී ලංකාව ආර්ථිකයෙහි තත්ත්වය 2019' නැමති වාර්තාව "හතර වැනි කාර්මික විප්ලවය තුළ ශ්‍රී ලංකාවේ ආර්ථිකය පරිවර්තනය කිරීම" යන තේමාව යටතේ 2019 ඔක්තෝබර් මස 16 වැනි දින කොළඹ දී එළිදැක්වූයේයි හතර වැනි කාර්මික විප්ලයෙහි තාක්ෂණයන් ශ්‍රී ලංකාවේ අනාගත ආර්ථික අභිවෘද්ධිය තීරණය කෙරෙන ලක්ෂණ ලෙස ක්‍රියා කරන ක්ෂේත්‍ර වන වැඩ ලෝකය, අධ්‍යාපනය, සංක්‍රමණය, ස්ත්‍රීපුරුෂ සමාජභාවය, සෞඛ්‍යය, මූල්‍ය අන්තර්කරණය, වෙළඳාම, කෘෂිකර්මය සහ දේශගුණික විපර්යාස ඇතුළු අනෙකුත් සාධක යන ශ්‍රී ලංකා ආර්ථිකයේ බොහෝ ක්ෂේත්‍ර මෙම වාර්තාව මගින් විමසා බලා ඇති

සැප්තැම්බර්

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය දුම්කොළ ආශ්‍රිතව සිදුවන හානිය අඩු කිරීම සඳහා ඉලක්කගත ප්‍රතිපත්ති තිබීමේ අවශ්‍යතාවය අවධාරණය කරයි



2019 වර්ෂයේදී ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය ශ්‍රී ලංකාව තුළ දුම්කොළ භාවිතය පාලනය කිරීමේ ප්‍රතිපත්ති තිබීමේ අවශ්‍යතාවය අවධාරණය කෙරෙන පර්යේෂණ අධ්‍යයන මාලාවක් දියත් කළේයි කිවු ඉන්ටර්නැෂනල් (Kivu International) සහ එක්සත් රාජධානියේ කැන්සර් රිසර්ච් යන සංවිධානවල අරමුදල් සැපයීම යටතේ පවත්වන ලද මෙම දෑවුරුදු වැඩසටහන මගින් ඉලක්කගත ප්‍රතිපත්ති විකල්ප හරහා මෙරට පවතින දුම්කොල භාවිතය ආශ්‍රිත හානිය අඩු කිරීමට අරමුණු කෙරෙයි

මෙම වැඩසටහනෙහි කොටසක් ලෙස ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය 2019 නොවැම්බර් මස 06 වැනි දින කොළඹ දී දුම්කොළ භාවිතය පාලනය කිරීමේ වැඩමුළුවක් සංවිධානය කළේයි මෙම වැඩමුළුවේදී ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂණ අධ්‍යක්ෂ නිශා අරුණතිලක මහත්මියගේ ප්‍රධානත්වයෙන් යුත් ආයතනයේ පර්යේෂකයින් 2019 ජනාධිපතිවරණය ආසන්නයේ තිබියදී දුම්කොළ භාවිතය පාලනය කිරීමේ ප්‍රතිපත්ති පිළිබඳව ආයතනය සිදු කළ පර්යේෂණය පිළිබඳ තොරතුරු පෙළඹවීමේ කණ්ඩායම් සහ ප්‍රජාමූල සංවිධාන සමග බෙදා ගත්තේය

ගෝලීය මානුෂීය ප්‍රතිපත්ති සංසදයේදී බිලේෂා වීරරත්න මහත්මිය සංක්‍රමණයෙහිදී සහ නාගරීකරණයේදී ඇති අභියෝග අවධාරණය කරයි



ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂණ සාමාජික බිලේෂා වීරරත්න මහත්මිය එක්සත් ජාතීන්ගේ මානුෂීය කටයුතු සම්බන්ධීකරණය සඳහා වන කාර්යාලය :ඔහධඤ්* සහ එක්සත් ජාතීන්ගේ පදනම විසින් සංවිධානය කර 2019 දෙසැම්බර් මස 13 වැනි දින නිව්යෝර්ක් නගරයේදී පවත්වන ලද ගෝලීය මානුෂීය ප්‍රතිපත්ති සංසදයට සහභාගී වූවායි

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ සංක්‍රමණය සහ නාගරීකරණය තේමාව භාර ප්‍රධානී ලෙස කටයුතු කරන ඒ මහත්මිය මෙහිදී ශ්‍රම සංක්‍රමණය සහ නාගරීකරණය සම්බන්ධ ගැටළු අතරෙහි මානුෂීය ප්‍රතිචාරවල අනාගතය හැඩගැසීමෙහිදී ඇති අභියෝග සහ ප්‍රධාන ප්‍රවනතා අවධාරණය කළායි

සභාපතිතුමාගේ පණිවුඩය



Professor Sirimal Abeyratne

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය මෙරට තිබෙන අනෙකුත් පර්යේෂණ ආයතන අතරින් ප්‍රමුඛ පෙළේ ප්‍රතිපත්ති පර්යේෂණ ආයතනයක් බවට වර්ධනය වී තිබේ. පසුගිය වසර ගණනාව පුරාම මෙම ආයතනය ස්වකීය අධ්‍යයන ධාරිතාවය සහ ආර්ථික ස්ථාවරත්වය පවත්වාගෙන ගොස් තිබේ. දකුණ ආසියානු කලාපයේ හොඳින් ස්ථාවර වී ඇති සහ ඉහළ පිළිගැනීමක් සහිත පර්යේෂණ ආයතනයක් ලෙස මෙම ආයතනය ලබා ඇති ප්‍රගතිය දැකීමට සහ වියට දායක වීමට අවස්ථාව ලැබීම 2019 වර්ෂයේ මෙම ආයතනයේ සභාපතිවරයා වශයෙන් සේවය කළ මා හට ඉමහත් සතුටකි.

ගෝලීය වශයෙන් පිළිගත් පර්යේෂණ ආයතනයක් බවට පත්වීමේ ස්වකීය දැක්ම සාක්ෂාත් කර ගැනීම උදෙසා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය සමාලෝචිත කාල පරිච්ඡේදය තුළදී ද ස්වකීය සංවර්ධනාත්මක ගමන් මගෙහි අඛණ්ඩව ම පිය මැන්නේය. මෙම ගමනෙහිදී ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය පළ කළ පර්යේෂණ ප්‍රකාශන මෙන්ම මහජනතාව අතර දැනුම බෙදා දීම සඳහා පවත්වන ලද වැඩමුළු තුළින් ද ආයතනය ප්‍රතිපත්ති සංවාදයට අදාළව මෙරට තුළ පමණක් නොව විදේශයන්හි පවා අවධානයට ලක්වූ ආයතනයක් බවට පත්වී තිබේ.

ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රතිපත්ති සම්පාදන කාර්යයේදී කාලීන වශයෙන් වැදගත් වන ක්ෂේත්‍ර ආවරණය කරමින් සිදු කර ඇති ගැඹුරු ප්‍රතිපත්ති පර්යේෂණ සම්බන්ධ ප්‍රධාන කරුණු මෙම වාර්තාවෙහි අඩංගු වේ. කොවිඩ්-19 වසංගතය හේතුවෙන් විල්ල වූ අභියෝග හමුවේ පවා ආයතනයේ ප්‍රමුඛතම ප්‍රකාශනය වන 'ශ්‍රී ලංකාව: ආර්ථිකයෙහි තත්ත්වය' නැමති ප්‍රකාශනය බාධාවකින් තොරව සම්පාදනය කිරීමට හැකිවීම මගින් දැඩි අවිනිශ්චිත තත්ත්වයන් තුළ පවා ආයතනයේ කාර්ය මණ්ඩලයෙහි ඇති අධික කැපවීම පෙන්නුම් කරයි. 2019 වර්ෂයේදී ද ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය ආර්ථික ප්‍රතිපත්ති පර්යේෂණ වලට දායක වන අතර ම 'සමන් කැලේගම අනුස්මරණ පර්යේෂණ ප්‍රදානය' හරහා මීළඟ පර්යේෂක පරපුර බිහි කිරීම උදෙසා ආයතනය ගෙන ඇති ක්‍රියාමාර්ගය අඛණ්ඩව ඉදිරියට ගෙන ගියේය. මෙම පණිවුඩය අවසන් කිරීමට පෙර, සමාලෝචිත කාල පරිච්ඡේදය තුළදී ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය අත් කර ගෙන ඇති මෙම වැදගත් ජයග්‍රහණ වෙනුවෙන් ආයතනයේ කළමනාකාරිත්වයට සුභ පැතීමටත්, ආයතනයේ ක්‍රියාකාරකම් පරිපාලනය කරමින් අධීක්ෂණ කාර්යභාරයක් ඉටු කළ පාලක මණ්ඩලයේ දායකත්වය ඇගයීමට ලක් කිරීමටත් මම මෙය අවස්ථාව කර ගනිමි.

ආයතනයේ විධායක අධ්‍යක්ෂ ආචාර්ය දුෂ්නි වීරකෝන් මහත්මිය දේශීය මෙන්ම අන්තර්ජාතික වශයෙන් ද ආයතනයේ කීර්තිනාමය ඉහළ නැංවීම සඳහා ආයතන කළමනාකාරිත්වයට නායකත්වය ලබා දී ඇත. එමෙන් ම, ආයතනයේ සාර්ථකත්වයට ඉමහත් දායකත්වයක් සපයා දී ඇති පර්යේෂණ සහ පරිපාලන කාර්ය මණ්ඩලයෙහි කැපවීම ද මම දැඩි ඇගයීමට ලක් කරමි. ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය මෙරට මීළඟ ආර්ථික පර්යේෂක පරපුර දිරිමත් කරන අතර ම, විශ්වාසනීය ප්‍රතිපත්ති පර්යේෂණ ආයතනයක් ලෙස ස්වකීය කාර්යභාරය තව දුරටත් පුළුල් කරනු ඇති බව මාගේ නිසැක විශ්වාසයි.

Professor Sirimal Abeyratne
Chairman

විධායක අධ්‍යක්ෂතුමියගේ වාර්තාව



Dr. Dushni Weerakoon

පර්යේෂණ සහ රාජ්‍ය ප්‍රතිපත්ති නියැළීම් ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ ප්‍රධානතම කර්තව්‍යයන් වේ අපගේ පර්යේෂණ මඟින් අපි සියලු ශ්‍රී ලාංකිකයින්ගේ ජීවිත ධනාත්මක ලෙස වෙනස් කිරීම පිණිස තිරසර□ නව්‍ය සහ පුළුල් පදනමක් සහිත සංවර්ධනය හරහා ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික දියුණුව ප්‍රවර්ධනය කිරීමට අරමුණු කරන්නෙමු.

2019 වර්ෂයේදී ද අපි අපගේ පර්යේෂණ ක්‍රියාකාරකම් මඟින් ආයතනයේ 2018 - 2021 පර්යේෂණ වැඩසටහනෙහි දක්වා ඇති තේමාත්මක ක්ෂේත්‍ර හය පිළිබඳව තවදුරටත් අවධානය යොමු කළෙමු (1) සාර්ව ආර්ථිකය, වෙළඳාම සහ තරගකාරිත්වය; (2) ශ්‍රමය□ අධ්‍යාපනය සහ සෞඛ්‍යය; (3) සංක්‍රමණය සහ නාගරීකරණය; (4) දරිද්‍රතාවය සහ සමාජ සුභසාධනය; (5) කෘෂි කර්මාන්තය සහ කෘෂි ව්‍යාපාර සංවර්ධනය; සහ (6) පරිසරය, ස්වාභාවික සම්පත් සහ දේශගුණික විපර්යාස වැනි තේමා හය වේ තුන් අවුරුදු පර්යේෂණ වැඩසටහනක පදනම සකස් කර ගැනීම පිණිස අපගේ ප්‍රධාන පාර්ශ්වකරුවන් සමඟ පුළුල් අදහස් විමසීමේ ක්‍රියාවලියක් සිදු කිරීමෙන් පසුව එක් එක් තේමාවෙහි ප්‍රතිපත්ති සලකාබැලීම් සඳහා වන ප්‍රමුඛතා ක්ෂේත්‍ර හඳුනාගෙන තිබේ මෙම විවිධ වූ ක්ෂේත්‍ර තුළින් අපි ප්‍රතිපත්ති සම්පාදනය සඳහා ලබා දෙන පර්යේෂණ ආදානයන් මඟින් ජනතාවට ශ්‍රී ලංකාවේ ආර්ථිකය සංවර්ධනයට සහභාගී වීමට, දායක වීමට සහ එයින් ප්‍රතිලාභ ලබා ගැනීමට උපකාර කිරීමට අරමුණු කෙරෙයි.

මෙම වර්ෂයේ දී ද ආයතනය වැම තේමාත්මක ක්ෂේත්‍ර හයෙහි සෑම ක්ෂේත්‍රයකම ගැඹුරු අධ්‍යයන රාශියක් ආරම්භ කර ඇති 2019 අප්‍රේල් මාසයේ දී විල්ල වූ පාස්කු ඉරිදා ත්‍රස්ත ප්‍රහාරය මඟින් ඒ වන විටත් ආර්ථික ක්‍රියාකාරකම්වල අනවරත මන්දගාමී බවක් පෙන්නුම් කරමින් තිබූ ආර්ථිකයකට තවත් පහරක් විල්ල වූ අතර□ එමඟින් වර්ධනය කෙරෙහි බලපාන ව්‍යුහාත්මක බාධාවන් පැවතීම පිළිබඳ අවධානය යොමු කරවීයි වයස්ගත ජනගහනයක් සිටින සහ ප්‍රමාණවත් පරිදි නිපුණතා සංවර්ධනයක් නොතිබෙන තත්ත්වයක් තුළ තාක්ෂණය මඟින් මෙහෙයවනු ලබන ඵලදායිතා වර්ධනයක් සඳහා වන අපේක්ෂාවන් පර්යේෂණවල සැලකිල්ල වර්ධනය කරවන ක්ෂේත්‍රයක් වී තිබේ අල්ප වශයෙන් පර්යේෂණය කර තිබූ මෙම ක්ෂේත්‍රය පිළිබඳ අවධානය යොමු කිරීම සඳහා 2019 වර්ෂයේදී ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය 'ශ්‍රී ලංකාව - ආර්ථිකයෙහි තත්ත්වය' නැමති සිය ප්‍රධානතම වාර්තාව හරහා මූලිකත්වය ගත්තේයී වැඩ ලෝකය, අධ්‍යාපනය, සංක්‍රමණය, ස්ත්‍රී පුරුෂ සමාජභාවය, සෞඛ්‍යය, මූල්‍ය අන්තර්කරණය, වෙළඳාම, කෘෂිකර්මාන්තය සහ දේශගුණික විපර්යාස ඇතුළු අනෙකුත් ක්ෂේත්‍රවල ඇති වී තිබෙන ඊනියා 'සිව්වන කාර්මික විප්ලවයෙහි' අති මහත් තාක්ෂණික ප්‍රගතිය මඟින් මුළුමහත් ආර්ථිකය පුරාවට ඇති කළ හැකි බලපෑම් විශ්ලේෂණය කිරීම සහ අවබෝධ කර ගැනීම මෙහි අරමුණ විය

වැමෙන්ම, දුම්කොළ භාවිතය මඟින් ජනතාවට සිදු වන හානිකර බලපෑම අඩුකිරීම පිණිස 2019 වර්ෂයේදී ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය ශ්‍රී ලංකාව තුළ දුම්කොළ භාවිතය පාලනය කිරීමේ ගැටළුව සම්බන්ධ දෑවුරුදු පර්යේෂණ වැඩසටහනක් සහ වැම ප්‍රතිපත්තියට පක්ෂව පෙනී සිටීමේ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කළේයී මෙම පර්යේෂණයේ පළමු වැනි අදියරේදී ක්‍රියාත්මක කරනු ලබන යම් නිශ්චිත අධ්‍යයන මඟින් දැනට සිටින දුම්පානය කරන්නන් සංඛ්‍යාව හඳුනා ගැනීමට, ඔවුන් තවමත් දුම්පානය කරන්නේ මන්ද යන්න සහ වඩාත්ම යෝග්‍ය ප්‍රතිපත්ති ප්‍රතිචාරය කෙරෙහි එයින් ඇති කළ හැකි ගම්‍යමාන මොනවාද යන්න අවබෝධ කර ගැනීමට මෙන්ම බලපෑමට ලක් විය හැකි දුම්කොළ ගොවීන් සඳහා විකල්ප භෝග හඳුනාගැනීමට අරමුණ කෙරෙයී මේ යටතේ සිදු කරනු ලබන ක්‍රියාකාරකම්වල කොටසක් ලෙස, ප්‍රතිපත්ති ක්ෂේත්‍රය පරීක්ෂාකාරීව සිතියම්ගත කිරීමෙන් අනතුරුව දුම්කොළ භාවිතය අඩු කිරීම ඉලක්ක කර ගත් ප්‍රතිපත්තිවලට පක්ෂව විවිධ පාර්ශ්වකරුවන් අතර පෙනී සිටීමට නියමිත ය

තවද, පර්යේෂණ අධ්‍යයන මාලාවක් මගින් ශ්‍රී ලාංකික සංක්‍රමණික සේවකයින් මුහුණ දෙන ඉතා වැදගත් ගැටළු සැලකිය යුතු සංඛ්‍යාවකට ද ආමන්ත්‍රණය කරන ලදී අනෙකුත් කරුණු අතර, ශ්‍රී ලාංකික තරුණයින් තම අනාගතය දකින ආකාරය සහ සංක්‍රමණය වීම සඳහා ඔවුන්ට තිබෙන අපේක්ෂාව, පවුල් පසුබිම් වාර්තාව වැනි නීති හේතුවෙන් සංක්‍රමණික සේවකයින් සඳහා ඇති රැකියා අවස්ථා වෙත ප්‍රවේශ වීම සඳහා තිබෙන ස්ත්‍රී පුරුෂ සමාජභාවී බාධක, සංක්‍රමණික සේවකයින් බඳවා ගැනීම සහ ඒ ආශ්‍රිත මෙහෙයුම් වියදම්, සහ සංක්‍රමණික සේවකයාගේ කුටුම්බයේ ඉතිරි සාමාජිකයින්ගේ ඉතිරිකිරීමේ සහ ණය ගැනීමේ චර්යාවන් කෙරෙහි සංක්‍රමණය මගින් ඇති කෙරෙන අනියම් බලපෑම ආදිය අවධානය යොමු කරන ලද ප්‍රධාන ක්ෂේත්‍ර වලින් කිහිපයක් විය

ජාතික වශයෙන් ඉහළ ප්‍රමුඛත්වයක් ලබා දී ඇති ගෝලීය තිරසර සංවර්ධන අරමුණු 2030 න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීම සලකා බැලීමේදී, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය චීනයේ එක් තීරයක් - එක් මාවතක් වැඩසටහන් ව්‍යාපෘතිය මගින් තිරසර සංවර්ධන අරමුණුවල ප්‍රතිඵල පිළිබඳව ඇති ගම්‍යමානයන් අවබෝධ කර ගැනීම සඳහා වූ ගවේෂණය කිරීම් ද ආරම්භ කරන අතරෙහි ම, කලාපීය කාර්ය රාමුවක කොටසක් ලෙස මෙරට මට්ටමෙන් තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය තක්සේරු කිරීම මගින් තිරසර සංවර්ධන අමාත්‍යංශය සඳහා ස්වේච්ඡා ජාතික සමාලෝචනය සකස් කිරීම පිණිස ආයතනය 2018 වර්ෂයේ දී ක්‍රියාත්මක කළ කාර්යය පිළිබඳ පසුවිපරම් සිදු කළේය

සමාජමය වශයෙන් අන්තර්කණය වූ සංවර්ධනයක් සඳහා වන ප්‍රතිපත්ති මැදිහත්වීම් වල සාර්ථකත්වය ශ්‍රීලාංකීය ජනතාවගෙන් බහුතරයකගේ ජීවනෝපාය වන කෘෂිකර්මාන්ත අංශය සමග දැඩි ලෙස බැඳී පවතී 2019 වර්ෂයේදී ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි පර්යේෂණ වලින් සමහරක් දේශීය කෘෂිකර්මාන්තයෙහි ලාභදායී බව, කාර්යක්ෂම බව සහ තරගකාරීත්වය සංකලිත වූ ආකාරයකට ඇගයීම පිණිස වන ප්‍රතිපත්ති විශ්ලේෂණ න්‍යාසයක් සකස් කිරීම පිණිස වියි වියට අමතරව, ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්ත අංශයේ තරගකාරීත්වය වැඩිදියුණු කිරීම සඳහා වන උපාය මාර්ග හඳුනා ගැනීම පිණිස කෘෂිකර්මාන්ත ශ්‍රම වෙළඳ පොළෙහි පවතින කාන්තාකරණය වීම, වයස්ගත වීම, බාහිරට සංක්‍රමණය වීම, සහ අර්ධ-කාලීන වශයෙන් ගොවිතැනෙහි නියැළීම ආදී වශයෙන් වූ ගැටළු අනෙකුත් පර්යේෂණ මගින් විමසා බලන ලදී

නාගරික වර්ධනයෙහි ඉහළ යමින් පවතින ඉල්ලුම හේතුවෙන් ඉඩම් සම්පත් මත ඇති කරන පීඩනය නිසා ශ්‍රී ලංකාව අලි-මිනිස් ගැටුමෙහි හානිකර බලපෑම වැඩි වෙමින් පැවතීමක් අත්විඳිමින් සිටියි මිනිසුන් සහ වන ජීවීන් මත ඇති කරමින් තිබෙන වැඩිවෙමින් පවතින හානිකර බලපෑම මගින් මෙන්ම ජීවනෝපායයන් විනාශ වීම මගින් ද වය ප්‍රතිපත්ති අවධානය යොමු කිරීම සඳහා වහා සලකා බැලිය යුතු ගැටළුවක් බවට පත් කර තිබේ ශ්‍රී ලංකාවේ මිනිස්-වනජීවී ගැටුමට පිළියම් යෙදිය හැකි එක් ක්‍රමයක් ලෙස, ක්ෂේත්‍රයේදී නියමු පරීක්ෂාවක් සිදුකිරීමට අපේක්ෂා කරනු ලබන, වාණිජ වශයෙන් ක්‍රියාත්මක වන රක්ෂණ යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමට ඇති හැකියාව තක්සේරු කර බැලීම සඳහා වන දෑවුරුදු පර්යේෂණ අධ්‍යයනයක් ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය විසින් ආරම්භ කරන ලදී.

මෙම වාර්තාවෙහි ඉතිරි කොටස මගින් සනාථ වන පරිදි, සමානයින් විසින් සමාලෝචනය කරනු ලබන ජාතික සහ අන්තර්ජාතික ප්‍රකාශන වැනි ශාස්ත්‍රීය වශයෙන් ස්ථාපිත වී ඇති සම්මතයන් හරහා අපගේ සාක්ෂි පදනම් කර ගත් පර්යේෂණ නිමැවුම්වල ඇති දැඩි විධිවත් බව අඛණ්ඩව පරීක්ෂා කරනු ලැබේ පශ්චාත් යුද වාතාවරණය තුළ සමාජ-දේශපාලන ප්‍රතිසංධානය සහ ආර්ථික සංවර්ධනය සඳහා ශ්‍රී ලංකාවේ පරිශ්‍රමය පිළිබඳව සම්පාදනය කරන ලද කලාපය 2019 වර්ෂයේදී පළ කරන ලද අන්තර්ජාතික ප්‍රකාශන අතර ප්‍රධානතම ප්‍රකාශනයක් වේ ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂකයින්ගේ සහ අනෙකුත් කීර්තිමත් ශ්‍රී ලාංකික ආර්ථික විද්‍යාඥයින්ගේ දායකත්වයන් සහිතව සම්පාදනය කර ඇති 'පශ්චාත් ගැටුම් අවධියේ සංවර්ධනය තුළ අභ්‍යන්තර සහ අන්තර්ජාතික අභියෝග සහ අවස්ථා කළමනාකරණය කර ගැනීම: ශ්‍රී ලංකාවෙන් උගත හැකි පාඩම්' නැමති මෙම කලාපය ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ හිටපු විධායක අධ්‍යක්ෂ ආචාර්ය සමන් කැලේගම මහතාගේ නමට පුද කර ඇති යුද්ධය අවසන් වීමෙන් පසුව දශකයක කාලයක් ගතවී තිබෙන අවස්ථාවේ, මෙම ප්‍රකාශනයෙහි විවිධ පරිච්ඡේද මගින් දීර්ඝ කාලීන සාමය සහ සමාජ ඒකාබද්ධතාවය පවත්වා ගැනීම සඳහා පුළුල්ව පැතිරුණු සහ අන්තර්කරණය වූ සංවර්ධනයක් තිබීමේ අවශ්‍යතාවය

අවධාරණය කෙරෙන වැදගත් විශ්ලේෂණයක් සපයා දෙයි.

2019 වර්ෂයේදී 12 වැනි දකුණු ආසියානු ආර්ථික සමුළුවට සත්කාරකත්වය ලබා දීම මගින් ශ්‍රී ලංකාවේ සහ විදේශයන්හි, විශේෂයෙන් ම සමස්ත දකුණු ආසියානු කලාපය පුරා සිටින අපගේ හවුල්කරුවන් සමග තිබෙන සහයෝගී නියැළීම නැවතත් ප්‍රදර්ශනය වියී දකුණු ආසියාව තුළ සාමූහික ක්‍රියාකාරීත්වය සඳහා සහ පාඩම් හුවමාරු කර ගැනීම සඳහා 'හතර වැනි කාර්මික විප්ලවය' යන්නෙන් කුමක් අදහස් වන්නේද යන්න පිළිබඳව වූ මුල්ම කලාපීය සාකච්ඡා වලින් එකක් ආරම්භ කිරීම සඳහා දකුණු ආසියානු ආර්ථික සමුළුව මගින් පර්යේෂකයින්, ප්‍රතිපත්ති සම්පාදකයින්, පෞද්ගලික අංශය සහ සංවර්ධන හවුල්කරුවන් එකට එක් කළේයී වඩාත් පොදුවේ ගත් කල, අපගේ පර්යේෂණ හරහා උත්පාදනය කරනු ලබන දත්ත, සාක්ෂි සහ දැනුම සංනිවේදන සහ ප්‍රතිපත්ති නියැළීම් ක්‍රියාකාරකම් මාලාවක් හරහා ප්‍රචාරණය කරනු ලබන බව සහතික කිරීම සඳහා වැදගත් ප්‍රයත්නයක් දරන ලදී.

මෙම වාර්තාවෙහි ඉතිරි කොටස මගින් අපි ක්‍රියාත්මක වන ආකාරය පැහැදිලි කෙරෙන අතර, 2019 වර්ෂය තුළදී අප විසින් සිදු කරන ලද යම් යම් ක්‍රියාකාරකම් සහ ඒවායෙහි ප්‍රතිඵල පෙන්වා දී ඇති

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ 2019 වර්ෂයේදී අලුතින් පිහිටුවන ලද පාලක මණ්ඩලයක් විසින් ආයතනයේ මෙහෙයුම් කාර්යයන්හිදී සහාය සහ සහයෝගය ලබා දෙන ලද අතර, ආයතනයේ පාලක මණ්ඩලයට මාගේ අවංක ස්තුතිය පිරිනැමීමට මම මෙම අවස්ථාව යොදා ගනිමී එමෙන්ම විවිධ වූ දක්ෂතාවයන්ගෙන් හෙබි අභ්‍යන්තර පර්යේෂණ කණ්ඩායමෙහි සහ සහායක කාර්ය මණ්ඩලයෙහි දායකත්වය නොතිබෙන්නට මෙම වර්ෂය පුරා අප අත්කර ගත් සාර්ථකත්වයන් සහ ජයග්‍රහණ යතාර්ථයක් කර ගැනීමට නොහැකි වන්නට තිබුණී අපි අප සඳහාම නියම කර ගෙන තිබෙන, 'සියලු ශ්‍රී ලාංකිකයින්ගේ ජීවිත ධනාත්මක ලෙස වෙනස් කිරීම පිණිස දත්ත, සාක්ෂි, සහ දැනුම උත්පාදනය කිරීම' නැමති දැක්ම සාක්ෂාත් කර ගැනීමට උපකාරී වනු පිණිස දැඩි කැපවීමෙන් යුතුව ක්‍රියා කළ මාගේ සහෝදර කාර්ය මණ්ඩලයේ සියලු දෙනාට මාගේ ස්තුතිය පුදු කරමි.

දුෂ්නි වීරකෝන්



පර්යේෂණ වැඩසටහන



සියලු ශ්‍රී ලාංකිකයින්ගේ ජීවිත වැඩිදියුණු කිරීමේ මෙහෙවර පෙරදැරිව ප්‍රාමාණික විශ්ලේෂණ සපයා දීම පිණිස සහ ශ්‍රී ලංකාවේ රාජ්‍ය ප්‍රතිපත්තියට අනුබලය ලබා දීම පිණිස පර්යේෂණ සිදු කිරීම ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ ප්‍රධානතම කාර්යය වේ. තිරසර□ නව්‍ය සහ පුළුල්ව පැතිරුණු සංවර්ධනයක් හරහා සමාජ ආර්ථික දියුණුව ප්‍රවර්ධනය කිරීමේ නිශ්චිත අරමුණු ඇතිව මෙම ආයතනයේ 2018-2020 පර්යේෂණ වැඩසටහන ක්‍රියාත්මක කරනු ලැබේ.

සමානයින් විසින් සමාලෝචනය කරන ලද ජාතික සහ අන්තර්ජාතික ප්‍රකාශන වැනි ශාස්ත්‍රීය වශයෙන් ස්ථාපිත වී ඇති සම්මතයන් මගින් පෙන්නුම් කරනු ලබන, පර්යේෂණ ගුණාත්මකභාවයෙහි විශිෂ්ඨත්වය හරහා ප්‍රතිපත්ති මත ආයතනය විසින් ඇති කරනු ලබන බලපෑම උපරිම මට්ටමට ඉහළ නැංවීමට ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය අරමුණු කරයි. එයින් පසුව, ක්‍රමානුකූල සංනිවේදන සහ ප්‍රතිපත්ති නියැළීම් ක්‍රියාකාරකම් හරහා ආයතනයෙහි පර්යේෂණවල ප්‍රතිපත්ති බලපෑම් විමසා බලනු ලැබේ.

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ 2019 වර්ෂයේ පර්යේෂණ වැඩසටහන මගින් ප්‍රධාන තේමාත්මක ක්ෂේත්‍ර හයක් කෙරෙහි අවධානය යොමු කර ඇති අතර, එම එක් එක් තේමාව ජ්‍යෙෂ්ඨ පර්යේෂකයෙකුගේ ප්‍රධානත්වයෙන් යුත් පර්යේෂකයින් කණ්ඩායමක් වටා සංවිධානය වී තිබේ. ප්‍රතිපත්ති තීරණ ගැනීම සඳහා දැනුම්වත් වීම පිණිස අවශ්‍ය සාක්ෂි සපයා දීම සඳහා සහ ප්‍රතිපත්ති සම්පාදකයින්ට විවිධ ප්‍රතිපත්ති විකල්පවල ගම්‍යමානයන් අවබෝධ කර ගැනීමට උපකාරී වීම පිණිස එක් එක් තේමාත්මක ක්ෂේත්‍රය තුළ විවිධ පර්යේෂණ මාතෘකා ගණනාවක් ගවේෂණය කර බලනු ලැබේ. අනෙකුත් කරුණු අතර ප්‍රතිපත්ති අනනුකූලතාවයන්□ යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවීම, සෞඛ්‍ය සහ අධ්‍යාපන ක්ෂේත්‍රවල මහජන සේවා සැපයීම දුර්වල වීම, පුහුණු කිරීම් වල හිඟයක් තිබීම, බලශක්ති පිරිවැය ඉහළ යමින් පැවතීම, සහ මූල්‍ය සහ ඉඩම් වෙත ප්‍රවේශවීම සඳහා තිබෙන බාධක වැනි වර්ධනය කෙරෙහි බලපාන ඉතා ප්‍රබල අවහිරතා පිළිබඳ දැඩි විශ්ලේෂණයක් සිදු කිරීම අවශ්‍ය වේ. ආදායමෙහි සහ ධනයෙහි අනවරතව පවතින අසමානතා, පරිසර හානි සහ ස්වාභාවික සම්පත් හායනය වීම, වැඩිහිටියන්ගේ සහ අනෙකුත් අවදානම්පාත්‍ර ජනගහනයන්ගේ සුභසිද්ධිය ආදිය මගින් ප්‍රතිපත්ති නැවත සම්පාදනය කිරීමේ අරමුණු ඇතිව ප්‍රධාන ආර්ථික සංකල්ප, ආකෘති සහ දර්ශක වල අඛණ්ඩ සමාලෝචනයක් සිදු කිරීමේ අවශ්‍යතාවය නිර්මාණය කෙරෙයි.



සාර්ව ආර්ථිකය, වෙළඳාම සහ තරඟකාරීත්වය

වර්ධනය සහ සංවර්ධනය කෙරෙහි බලපාන ආර්ථික සහ දේශපාලනික බාධක මැඩපවත්වා ගැනීමේදී ප්‍රතිපත්ති කාර්යක්ෂමතාවයට රුකුල් දෙන ක්‍රියාවලි සහ ආයතනික වැඩපිළිවෙළ ඉතා වැදගත් සාධක වේ. දුෂ්කර, එහෙත් අවශ්‍ය කරන ප්‍රතිසංස්කරණ හඳුනා ගැනීම, ඒවාට ප්‍රමුඛත්වය ලබා දීම, ආරම්භ කිරීම, ක්‍රියාත්මක කිරීම සහ අඛණ්ඩව පවත්වා ගැනීම සිදු කරනු ලබන බව ප්‍රතිපත්ති කාර්යක්ෂමතාවය මගින් සහතික කළ හැක.

ශ්‍රී ලංකාවේ වර්තමානයේ සිදුවෙමින් පවතින ජනවිකාශ සංක්‍රාන්තිය සැලකිල්ලට ගැනීමේදී, ආර්ථිකයෙහි තරඟකාරීත්වය සහ ආයතනික ධාරිතාවය ඉහළ නැංවීම පිණිස නියාමන ප්‍රතිසංස්කරණ පරාසයක් ඇතුළත් කරමින්, වැඩිදියුණු කළ ශ්‍රම ඵලදායීත්වයක් සහ කාර්යක්ෂමතාවයක් මගින් ඉහළ වර්ධනයක් ඇති විය යුතු වේ. මෙමගින් නිෂ්පාදන සාධක නැවත වෙන් කර දීම; නිෂ්පාදන සහ අපනයන කාණ්ඩ විවිධාංගීකරණය කිරීම, ඉහළ නැංවීම සහ පුළුල් කිරීම; සහ නව නිෂ්පාදන ක්‍රම සහ ක්‍රියාවලි සහ විවිධ වූ යෙදවුම් භාවිතා කිරීම සලකා බැලෙන ප්‍රතිපත්ති සකස් කිරීමේ අවශ්‍යතාවය මතු කරවයි.

සාර්ව ආර්ථික ප්‍රතිපත්තිය සහ ව්‍යූහාත්මක ප්‍රතිසංස්කරණ



ගෝලීය සංවර්ධන ජාලයෙහි (GDN) අරමුදල් සැපයීම යටතේ නිශා අරුණතිලක මහත්මිය සහ ප්‍රියංකා ජයවර්ධන මහත්මිය "**CEQ** අධ්‍යයනය සඳහා දත්ත සංයෝග කිරීම" පිළිබඳ අධ්‍යයනයක් සිදු කළහී සාධාරණ සහ කල්පවත්නා වර්ධනයක් සඳහා විවිධ රටවල තත්ත්වයන් සමග ප්‍රතිඵල සංසන්දනය කිරීමට පහසුකම් සැලසීම පිණිස සහ වඩා හොඳින් මූල්‍ය සම්පත් වෙන්කර දීමට සහාය වීම පිණිස රාජ්‍ය ආදායම් සහ වියදම් දත්තවල ව්‍යාප්ති විශ්ලේෂණය යාවත් කාලීන කිරීමට මෙම අධ්‍යයනය මගින් අරමුණු කරන ලදී.

බාධක ගණනාවකින් පසු අධික මන්දගාමීත්වයකින් යුතුව රට යළි යථා තත්ත්වයට පත්වෙමින් තිබෙන තත්ත්වයක් තුළ 2019 වර්ෂයේ ශ්‍රී ලංකාවේ සමස්ත ආර්ථිකයෙහි තත්ත්වය දුර්වල බව "ශ්‍රී ලංකාව: ආර්ථිකයෙහි තත්ත්වය 2019" නැමති වාර්තාවෙහි දක්වා ඇති පරිදි ශ්‍රී ලංකාවේ ආර්ථික දැක්ම සහ ප්‍රතිපත්ති ප්‍රමුඛතා විමසා බැලූ දුෂ්නි වීරකෝන් මහත්මිය අවධාරණය කළායී මෙය 2016 වර්ෂයේ මැද භාගයේ සිට මූල්‍ය, මුදල් සහ විනිමය අනුපාත ප්‍රතිපත්ති කළමනාකරණයෙහි සිදු කළ සාර්ව ප්‍රතිසංස්කරණ ක්‍රියාමාර්ග වලින් ලැබුණු වැදගත් ප්‍රතිලාභ පවා තිබියදී ඇතිවූ තත්ත්වයකි.

දකුණු ආසියානු කලාපයේ අනෙකුත් රටවලට සාපේක්ෂව සැලකිය යුතු මට්ටමක මන්දගාමී ප්‍රගතියක් වන 3.5% ට අඩු වර්ධනයක් සහිත අනුක්‍රමික කාර්තු 10 ක කාලයක් ගතවී තිබෙන තත්ත්වයක වර්ධනය නැවත පුබුදුවාලීම සඳහා වන ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග 2020 වර්ෂය සඳහා වන ප්‍රතිපත්ති න්‍යාය පත්‍රයෙහි ඉහළම ප්‍රමුඛත්වය ලබා දෙන කරුණ විය යුතු බව මෙම වාර්තාව මගින් වැඩිදුරටත් පෙන්වා දී ඇතී කෙසේ වෙතත්, ආර්ථික ප්‍රසාරණය ඇති කරවන සාර්ව ආර්ථික ක්‍රියාමාර්ග ඇතුළත් වැවැනි ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ශ්‍රී ලංකාවේ හදිසි මධ්‍ය කාලීන ණය තිරසරභාවය සම්බන්ධ ප්‍රතිසංස්කරණ වලට සමගාමී විය යුතු වේ

වෙළඳාම සහ කලාපීය ඒකාබද්ධ වීම

සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යංශය වෙනුවෙන් ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය විසින් භාර ගන්නා ලද තීරුබදු අඩුකිරීම්වල වෙළඳ බලපෑම් තක්සේරු කිරීම සඳහා වන SMART සමාකරණ කාර්යයෙහි දී ජනක විජයසිරි මහතා ශ්‍රී ලංකා - බංග්ලාදේශ නිදහස් වෙළඳ ගිවිසුම පිළිබඳ ඒකාබද්ධ දේශීය අධ්‍යයනයක් සිදු කළේයී එයට අමතරව, ජනක විජයසිරි මහතා සහ නුවන්ති සේනාරත්න මහත්මිය සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යංශය වෙනුවෙන් "යෝජිත ශ්‍රී ලංකා - තායිලන්ත නිදහස් වෙළඳ ගිවිසුමෙහි ප්‍රතිලාභ පිළිබඳ මූලික අධ්‍යයනයක්" ද සිදු කළහ.

චක්සත් රාජධානියේ අන්තර්ජාතික සංවර්ධනය සඳහා වන රජයේ දෙපාර්තමේන්තුවේ අරමුදල් සැපයීම යටතේ ක්‍රියාත්මක කරන ලද ජාත්‍යන්තර වෙළඳ මධ්‍යස්ථානයේ "SheTrades" ව්‍යාපෘතියට ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය සක්‍රීය ලෙස සම්බන්ධ වියී —SheTrades Outlook˜ යනු ජාත්‍යන්තර වෙළඳාම සඳහා කාන්තාවන්ගේ සහභාගීත්වයට උපකාරී වන ආයතනික පරිසර පද්ධතිය ඇගයීම, අධීක්ෂණය කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා වන නව්‍ය ප්‍රතිපත්ති මෙවලමකි; එමෙන්ම එය වෙළඳාම සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය යන දෙකටම අදාළව රටවල් අතර ප්‍රමාණනය කළ හැකි, මැනිය හැකි සහ සැසඳිය හැකි දර්ශක සපයා දෙන විස්තීර්ණ මෙවලමක් ද වේ මේ සඳහා ජනක විජයසිරි මහතා සහ නුවන්ති සේනාරත්න මහත්මිය ජාත්‍යන්තර වෙළඳ මධ්‍යස්ථානයෙහි පුළුල් වෑයමෙහි කොටසක් ලෙස අභියෝග, ප්‍රතිපත්ති අත්දැකීම් සහ යහපරිචයන් පිළිබඳ තොරතුරු රැස් කර ගැනීම සඳහා වූ සමීක්ෂණයක් සිදු කළහ.

ශ්‍රී ලංකා රජය සමග එක්ව යුරෝපා සංගමයේ අරමුදල් සැපයීම යටතේ ක්‍රියාත්මක වන "ශ්‍රී ලංකාවේ වෙළඳාම සම්බන්ධ සහාය" ව්‍යාපෘතිය වර්තමානයේ ක්‍රියාත්මක කරනු ලබන ආයතනය වන ජාත්‍යන්තර වෙළඳ මධ්‍යස්ථානය වෙනුවෙන් කිත්මිණි හේවගේ මහතා ශ්‍රී ලංකාවේ ඉදිකිරීම්, ගෘහ නිර්මාණ සහ ඉංජිනේරු අංශවල නියාමන අනුරූපණයක් සිදු කළේයී "ඉදිකිරීම්, ගෘහ නිර්මාණ සහ ඉංජිනේරු අංශවල නියාමන ඇගයීම" පිළිබඳ අධ්‍යයනය මගින් සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තවල අපනයන තරගකාරීත්වය සඳහා සහ ආර්ථික වර්ධනය හා සංවර්ධනය සඳහා ඉහළ විභව්‍යතාවයක් ඇති අංශවල අගය එකතු කිරීම සඳහා සහාය සපයා දෙන අතර ම ශ්‍රී ලංකාවේ අන්තර්කරණය වූ වෙළඳාම මූලික

වර්ධනය සහ කලාපීය ඒකාබද්ධවීම සඳහා දායක වීමට පරිශ්‍රමය දරන ලදී.

ආයෝජන සහ මූල්‍යය

ආසියානු ආර්ථිකයන් 15 ක් පුරා ජනහිතකාමී ක්‍රියාවලට සහ පුද්ගලික සමාජ ආයෝජනවලට පහසුකම් සලසන පරිසරය විමසා බලමින් කිත්මිණ හේවගේ මහතා හොංකොං හි පිහිටි පරාර්ථචර්යා සහ සමාජ කේන්ද්‍රයෙහි (Centre for Philanthropy and Society) අරමුදල් සැපයීම යටතේ "ජනහිතකාමී ක්‍රියා දර්ශකය 2020" සම්පාදනය කළේයී මෙම අධ්‍යයනය ක්ෂේත්‍ර හතරකින් සමන්විත විය - බදු සහ මූල්‍ය ප්‍රතිපත්තිය, නියාමන පටිපාටි, සමාජ-සංස්කෘතික පරිසර පද්ධති, සහ රජයේ ප්‍රසම්පාදනී ආසියානු ආර්ථිකයන් සංසන්දක සංදර්භයක් තුළ ජනහිතකාමී ක්‍රියාවන් උත්ප්‍රේරණය කරන ආකාරය අනාවරණය කිරීමට මෙම අධ්‍යයනය මගින් අරමුණු කළේය.

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය, කර්මාන්ත සහ ව්‍යවසායකත්වය

ශ්‍රී ලංකාව සංවර්ධනයේ මීළඟ අවධිය වන සේවා ඩිජිටල්කරණයට ප්‍රමුඛත්වය ලබා දෙනු ලබන අවධියට පියවර තබමින් සිටින නිසා ව්‍යාපාර කටයුතුවලට පහසුකම් සලසන්නන් ලෙස සමාජ මාධ්‍ය වේදිකාවල භූමිකාව පිළිබඳ සමීප ලෙස විමසා බැලීම අවශ්‍ය වේ විශේෂයෙන් ම, ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සහ තරුණයින් වැනි කණ්ඩායම්වලට වෙළඳ ප්‍රචාරණය, අලෙවිය සහ බෙදාහැරීම වැනි ව්‍යාපාර ක්‍රියාකාරකම් සඳහා සමාජ මාධ්‍ය වේදිකා යොදා ගැනීමෙහි වැදගත්කම වැඩිවෙමින් පවතී මෙම සංදර්භය තුළ, කිත්මිණ හේවගේ මහතා සහ හරිනි වීරසේකර මහත්මිය ප්‍රමාණාත්මක සහ ගුණාත්මක යන දත්ත සංරචක දෙකම යොදා ගනිමින් ව්‍යාපාර සඳහා සමාජ මාධ්‍ය පරිසරය (ෆේස්බුක් සහ ඉන්ස්ටග්‍රෑම් වලට පමණක් සීමා වී) පිළිබඳ "ව්‍යාපාර සඳහා සමාජ මාධ්‍ය" නැමති මූලික තක්සේරු කිරීමේ අධ්‍යයනය සිදු කළහ.

වර්තමානයේ මෙරට නිර්මාණාත්මක කර්මාන්තවල විශාලත්වය සහ පරිමාණය පිළිබඳ සමස්ත අදහසක් ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය කවුන්සිලයේ අරමුදල් සැපයීම යටතේ ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය "ශ්‍රී ලංකාවේ නිර්මාණාත්මක කර්මාන්ත සිතියම්කරණ අධ්‍යයනය" සිදු කළේයී නිර්මාණාත්මක කර්මාන්ත අංශයේ පිළිගැනීම, වර්ධනය සහ වැඩිදියුණුව සඳහා අවශ්‍ය මැදිහත්වීම් සැලසුම් කිරීමට සහ එමගින් එම අංශය ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති සහ උපාය මාර්ග සම්පාදනය කිරීමට මෙම අධ්‍යයනය උපකාරී වියී මෙම පර්යේෂණ කණ්ඩායම ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ මනෝජ් තිබ්බොටුවාව, දිලනි හිරිමුතුගොඩගේ සහ නිමේෂා දිසානායක යන මහත්ම මහත්මීන්ගෙන් සමන්විත විය.

බුද්ධිමය දේපළ

කර්මාන්ත හා වාණිජ අමාත්‍යංශයේ අරමුදල් සැපයීම යටතේ දිලනි හිරිමුතුගොඩගේ මහත්මිය "ශ්‍රී ලංකාව සඳහා ජාතික බුද්ධිමය දේපළ ප්‍රතිපත්තියක්" පිළිබඳ පර්යේෂණයක් සිදු කළේයී මෙරට සඳහා පරිපූර්ණ බුද්ධිමය දේපළ ප්‍රතිපත්තියක් සකස් කිරීම මෙහි පරමාර්ථය වියී ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සහ නවෝත්පාදන හැකියා ප්‍රවර්ධනය කිරීමට උපකාරී වන උසස්ම පරිචයන් ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැලසීමට මෙම අධ්‍යයනයෙන් අරමුණු කරන ලදී.

ප්‍රකාශන

'හතර වැනි කාර්මික විප්ලවය තුළ ශ්‍රී ලංකාවේ ආර්ථිකය පරිවර්තනය කිරීම' යන තේමාව යටතේ පළ කරන ලද ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ ප්‍රධානතම වාර්ෂික වාර්තාව වන "ශ්‍රී ලංකාව: ආර්ථිකයෙහි තත්ත්වය" නැමති වාර්තාව මගින් ශ්‍රී ලංකාවේ අනාගත ආර්ථික අභිවෘද්ධියෙහි ඉතාමත් වැදගත් ලක්ෂණ ලෙස හතර වැනි කාර්මික විප්ලවයෙහි තාක්ෂණයන් සක්‍රීය ලෙස ක්‍රියාත්මක වන විවිධ ක්ෂේත්‍ර වන වැඩ ලෝකය, අධ්‍යාපනය, සංක්‍රමණය, ස්ත්‍රී පුරුෂ සමාජභාවය, සෞඛ්‍යය, මූල්‍ය අන්තර්කරණය, වෙළඳාම, කෘෂිකර්මය, සහ දේශගුණික විපර්යාස ඇතුළු අනෙකුත් ක්ෂේත්‍ර පිළිබඳව විමසා බලන ලදී එමෙන්ම, මෙම ප්‍රකාශනය මගින් රටෙහි ආර්ථික කාර්ය සාධනය පිළිබඳ ඉතා වැදගත් තක්සේරුවක් ද, වර්ධනය සහ සාර්ව ආර්ථික ස්ථාවරත්වය සඳහා නුදුරු අනාගතය පිළිබඳ දැක්මක් ද සපයා දෙන ලදී "ශ්‍රී ලංකාව: ආර්ථිකයෙහි තත්ත්වය 2019" වාර්තාවට දායකත්වය ලබා දෙමින් දුෂ්නි වීරකෝන් මහත්මිය "ශ්‍රී ලංකාව: ආර්ථික කාර්ය සාධනය සහ

දැක්ම" පිළිබඳ ලිපියක් ලිව්වාය එයට අමතරව, ජනක විජයසිරි මහතා "ඩිජිටල් තාක්ෂණයන් සහ වෙළඳාමෙහි අනාගතය" පිළිබඳව ද, හරිනි වීරසේකර මහත්මිය "ගෝලීය ආර්ථික සංවර්ධනයන් සහ ශ්‍රී ලංකාව කෙරෙහි එමගින් ඇති කෙරෙන බලපෑම" පිළිබඳවද, කිත්මිණ හේවගේ මහතා "හතර වැනි කාර්මික විප්ලවය සඳහා සූදානම් වීම" පිළිබඳව ද ලිපි සම්පාදනය කළහ.

මෙම වර්ෂය තුළදී ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ හිටපු විධායක අධ්‍යක්ෂ, අභාවප්‍රාප්ත□ ආචාර්ය සමන් කැලේගම මහතා සිහිවීම පිණිස "පශ්චාත් ගැටුම් වාතාවරණය තුළ සංවර්ධනයේදී අභ්‍යන්තර සහ අන්තර්ජාතික අභියෝග සහ අවස්ථා කළමනාකරණය කර ගැනීම: ශ්‍රී ලංකාවෙන් උගත හැකි පාඩම්" පිළිබඳ අන්තර්ජාතික වශයෙන් ප්‍රකාශයට පත් කරන ලද ග්‍රන්ථයක් පළ කළේයි දුෂ්නි වීරකෝන් මහත්මිය සහ සිසිර ජයසූරිය මහතා විසින් සංස්කරණය කර, ස්ප්‍රින්ජර් ප්‍රකාශන ආයතනය විසින් ප්‍රකාශයට පත් කරන ලද මෙම ග්‍රන්ථයෙහි දේශීය සහ අන්තර්ජාතික කීර්තියක් දිනා ගෙන සිටින ශ්‍රී ලාංකික ආර්ථික විද්‍යාඥයින් විසින් දායක කරන ලද ලිපි අන්තර්ගත වේ සමාජ-දේශපාලනික ප්‍රතිසංධානය සඳහා පරිශ්‍රමයක් දරන, ආකූල ලෝක ආර්ථිකයක් තිබෙන, සහ දුෂ්කර වූ අභ්‍යන්තර සහ බාහිර දේශපාලනික අභියෝග තිබෙන සංදර්භයක පශ්චාත් ගැටුම් වාතාවරණය තුළ ශ්‍රී ලාකාවේ සංවර්ධන ප්‍රයත්නයන් පිළිබඳ කථාවෙන් උගත හැකි පාඩම් මෙම ප්‍රකාශනය මගින් උකහා දක්වා ඇති මෙය පර්යේෂකයින්ට, ප්‍රතිපත්ති සම්පාදකයින්ට සහ සංවර්ධන වෘත්තිකයින්ට ප්‍රයෝජනවත් ග්‍රන්ථයක් වේ.

මූල්‍ය ආධිපත්‍යය ශ්‍රී ලංකාවේ සාර්ව ආර්ථික භූ දර්ශනයෙහි අඛණ්ඩව පැවත ඇති ලක්ෂණයක් වේ ඉහළ සාර්ව ආර්ථික අස්ථාවරත්වය තුළ මෙය විද්‍යමාන වී ඇති අතර, රට ගෙවුම් ශේෂ හිඟයෙහි අර්බුද වලට නිතර මුහුණ දී තිබේ දුෂ්නි වීරකෝන්, උට්සව් කුමාර් සහ රොසෙල් ඩයිම් යන මහත්ම මහත්මීන් විසින් ආසියානු සංවර්ධන බැංකුවේ දකුණු ආසියා කාර්ය පත්‍රිකා මාලාව යටතේ "ශ්‍රී ලංකාවේ සාර්ව ආර්ථික අභියෝග: හිඟයන් දෙකක කතාවක්" නැමති ලිපිය මගින් ශ්‍රී ලංකාවේ රාජ්‍ය මූල්‍ය හිඟය සහ ජංගම ගිණුමේ හිඟය යන ද්විත්ව හිඟයන්හි මෑත ඉතිහාසය පිළිබඳ විස්තරයක් සපයන ලදී.

දුෂ්නි වීරකෝන් මහත්මිය සහ ජනක විජයසිරි මහතා "එක් තීරුවක් - එක් මාවතක් වැඩසටහන, ණය සහ රාජ්‍ය තාන්ත්‍රිකභාවය: චීන - ශ්‍රී ලංකා ආර්ථික සබඳතා සඳහා ඇති අභියෝග සහ අවස්ථා" පිළිබඳ කාලීන පත්‍රිකාවක් ඉදිරිපත් කළහී මෙම පත්‍රිකාව මගින් ශ්‍රී ලංකාව චීනය සමග ඇති කර ගෙන තිබෙන ආර්ථික සහ දේශපාලන සබඳතා වලට අනුබලය දෙන ජාතික, කලාපීය සහ ගෝලීය භූ-දේශපාලනික වෙනස්වීම් ගවේෂණය කර බැලෙන අතර, චීන ණය රාජෙය්පාය හෙවත් ණය උගුල යැයි කියනු ලබන චීන ණය පිළිබඳ වර්ධනය වෙමින් තිබෙන වෘත්තාන්ත වලට ආමන්ත්‍රණය කරයි.

චතුර්ගා කරුණානායක මහත්මිය ව්‍යාපාර සහ සමාජ පර්යේෂණ පිළිබඳ අන්තර්ජාතික සඟරාව සඳහා "විච්චූරණ පරිභෝජන මානයන් අතර පවතින අන්තර් බලපෑම: අත් ඔර්ලෝසු සහ නිවාස පිළිබඳ තත්ත්වයන් හරහා කැපී පෙනීම සහ පුනු උසස්කම පිළිබඳ ගැඹුරු විමසා බැලීමක්" නැමති ලිපිය සම්පාදනය කළේයි එමෙන්ම, ඒ මහත්මිය එච්චී කන්නන්ගර සමග එක්ව ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ විශ්වවිද්‍යාල ආර්ථික විද්‍යාඥයින්ගේ ශ්‍රී ලංකා සංසදය විසින් ප්‍රකාශයට පත් කරනු ලබන ආර්ථික සවිබල ගැන්වීම: අභියෝග සහ ඉදිරි මග පිළිබඳ වූ ප්‍රකාශනයක් සඳහා "ශ්‍රී ලංකාවේ විච්චූර්ණ පරිභෝජනයට හේතු වන සමාජ-ජනවිකාශ උත්තේජයන්: සුඛෝපභෝගී වාහන උදාහරණය" නැමති ලිපිය සම්පාදනය කළාය.

වැදගත් සිදුවීම්

සංවර්ධන ආර්ථික විද්‍යාව සහ තිරසරභාවය සඳහා වන මධ්‍යස්ථානය සහ ඔස්ට්‍රේලියාවේ මොනෑෂ් විශ්වවිද්‍යාලයේ දකුණු ආසියානු පර්යේෂණ ජාලය සමග සමසංවිධානයෙන් ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය "දකුණු ආසියාවේ ආර්ථික සංවර්ධනය" පිළිබඳ සමුළුවක් සංවිධානය කළේයි 2019 ජනවාරි 07-08 යන දිනවල කළුතරදී පවත්වන ලද මෙම සමුළුව දකුණු ආසියානු රටවල ශාස්ත්‍රඥයින් එකට එක් කළ අවස්ථාවක් වියි මෙම සමුළුව මගින් අහඹු ක්ෂේත්‍ර පරීක්ෂණ, පරිභෝජනයේ අවකාශීය ව්‍යාප්තිය, සහ බහුමාන දරිද්‍රතා සහසම්බන්ධිත හා අනෙකුත් ක්ෂුද්‍ර ආර්ථිකමිතික විශ්ලේෂණ වැනි නවතම පර්යේණ ක්‍රමවේද භාවිතා කරමින් කලාපයේ සංවර්ධනයට රුකුල් දෙන නව්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවල බලපෑම විමසා බලන ලදී කලාපයේ නව දැනුම හුවමාරු කර ගැනීම සහ පර්යේෂණ ක්‍රියාමාර්ග සඳහා සහෝයෝගීත්වය ලබා ගැනීම මෙම සමුළුවෙහි සමස්ත අරමුණ වියි
ලෝක බැංකුව, ශ්‍රී ලංකා මහ බැංකුව සහ කොළඹ විශ්වවිද්‍යාලය සමග එක්ව ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය විසින් සංවිධානය කරන ලද "දකුණු ආසියාවේ බාහිර අවදානම්පාත්‍රතා පිළිබඳ කලාපීය සමුළුව" පෙබරවාරි 28 - මාර්තු 01 යන දින වල ශ්‍රී ලංකා මහ බැංකුවේදී පවත්වන ලදී මෙම සමුළුව මගින් ශ්‍රී ලංකාව ඇතුළු දකුණු ආසියානු ආර්ථිකයන් මත බාහිර අංශවල විකසනයන් මගින් ඇති කෙරෙන සාර්ව ආර්ථික බලපෑම අවධාරණය කරන ලද අතර, මෑත කාලීන ගෝලීය විකසනයන්හි සංදර්භය තුළ දකුණු ආසියානු කලාපය සඳහා වන ආර්ථික දැක්ම සාකච්ඡා කරන ලදී

තවද, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය විසින් සංවිධානය කරන ලද —XII වැනි දකුණු ආසියානු ආර්ථික සමුළුව" 2019 සැප්තැම්බර් මස 26-27 යන දිනවල කොළඹදී පවත්වන ලදී මෙම සමුළුවෙහිදී 'හතර වැනි කාර්මික විප්ලවය තුළ දකුණු ආසියාවේ අනාගතය හැඩගැස්වීම' යන තේමාව පිළිබඳ අවධානය යොමු කරන ලදී හතර වැනි කාර්මික විප්ලවයෙහි ඵල නෙළා ගැනීමේදී සහ බහු-පාර්ශ්වකාර සංවාදයක් හරහා සහයෝගීතාවය සඳහා ඇති විභව්‍ය මාවත් සොයා යෑමේදී දකුණු ආසියාව සඳහා ඇති අපේක්ෂාවන් සහ අභියෝග මෙන්ම මෙම කලාපයට ස්වකීය ජනතාවන්ගේ පුද්ගලික සහ සාමූහික සුභසිද්ධිය වැඩිදියුණු කිරීම සඳහා හතර වැනි කාර්මික විප්ලවය තුළ අර්ථදායක ලෙස ස්වකීය අනාගතය හැඩගස්වා ගත හැකි ආකාරය මෙම සමුළුව මගින් ගවේෂණය කරන ලදී.

ප්‍රතිපත්ති නියැළීම්

කමිටු
2019 වර්ෂයේදී ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය පහත සඳහන් ප්‍රතිපත්ති කමිටු නියෝජනය කිරීම හරහා පර්යේෂණ යෙදවුම් සපයා දෙන ලදී:

දුෂ්නි වීරකෝන් මහත්මිය සහ නිශා අරුණතිලක මහත්මිය විද්‍යා, තාක්ෂණ සහ පර්යේෂණ අමාත්‍යාංශය විසින් කැඳවන ලද පර්යේෂණ අධීක්ෂණ කමිටුවට සහ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා ආර්ථික ප්‍රතිසංස්කරණ හා පොදු සැපයීම් අමාත්‍යාංශය විසින් ස්ථාපනය කරන ලද උපදේශක මණ්ඩලයට සහභාගී වූහ.

නිශා අරුණතිලක මහත්මිය සහ කිත්මිණි හේවගේ මහතා ආර්ථික ප්‍රතිසංස්කරණ සහ පොදු සැපයීම් අමාත්‍යාංශය විසින් ස්ථාපනය කරන ලද ජාතික ගිණුම් සම්පාදනය කිරීම වැඩිදියුණු කිරීම සඳහා වන කාර්ය සාධක බලකායෙහි සේවය කළහ.

එයට අමතරව දුෂ්නි වීරකෝන් මහත්මිය සංවර්ධන උපාය මාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශයේ වෙළඳ සහ ආලදායිතා කොමිසමේ සාමාජිකාවක් ලෙස ද, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ පත් කළ සාමාජිකාවක් ලෙස ද කටයුතු කළාය.

ජනක විජයසිරි මහතා සංවර්ධන උපාය මාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය විසින් කැඳවන ලද නිදහස් වෙළඳ ගිවිසුම් පිළිබඳ උපදේශක කමිටුවෙහි සේවය කළේය.

ඉදිරිපත් කිරීම් සහ සාකච්ඡා මණ්ඩල

දේශීය මෙන්ම කලාපීය වශයෙන් ද පවත්වන ලද වැඩසටහන් ගණනාවකදී ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි පර්යේෂකයින් ශ්‍රී ලංකාවේ සාර්ව ආර්ථික ප්‍රතිපත්තිය සහ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ සම්බන්ධ විවිධ ගැටළු පළිබඳව කථා කළහි

- ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලය විසින් සංවිධානය කරන කොළඹ දී පවත්වන ලද " ආර්ථිකය සහ අංශ සමාලෝචනය හා ඉදිරි දැක්ම 2019" පිළිබඳ සම්මන්ත්‍රණයේ දී දුෂ්නි වීරකෝන් මහත්මිය සාකච්ඡා මණ්ඩල සාමාජිකාවක් ලෙස කටයුතු කළාය (ජනවාරි)
- දුෂ්නි වීරකෝන් මහත්මිය "දකුණු ආසියාවේ බාහිර අවදානම්පාත්‍රතා පිළිබඳ කලාපීය සමුළුවෙහි" "දකුණු ආසියාවේ ද්විත්ව හිඟය පිළිබඳ ආනුභවික පරීක්ෂානයන්" නැමති සැසියේ මුලසුන දැරුවායී ලෝක බැංකුව, ශ්‍රී ලංකා මහ බැංකුව සහ කොළඹ විශ්ව විද්‍යාලය සමග එක්ව ප්‍රතිපත්ති අධ්‍යයන විසින් මෙම සමුළුව සංවිධානය කර කොළඹ දී පවත්වන ලදී (පෙබරවාරි / මාර්තු)
- දුෂ්නි වීරකෝන් මහත්මිය "අප ගමන් කරමින් සිටින්නේ කවර දිශාවකටද? 2019 අයවැය පිළිබඳ ප්‍රවීණයින්ගේ පරීක්ෂානයන්" නැමති සැසියේ සාකච්ඡා මණ්ඩල සාමාජිකාවක් ලෙස කටයුතු කළායී කොළඹදී පවත්වන ලද මෙම සැසියට දේශපාලන ආර්ථිකය පිළිබඳ ශ්‍රී ලංකා සංගමය විසින් සත්කාරකත්වය සපයන ලදී (මාර්තු)
- දුෂ්නි වීරකෝන් මහත්මිය වරලත් කළමනාකරණ ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් සංවිධනය කර කොළඹ දී පවත්වන ලද සාකච්ඡාවක "2019 අයවැයෙහි විශේෂ ලක්ෂණ: බදු යෝජනා සහ ව්‍යාපාර හා ආර්ථිකය කෙරෙහි එමගින් ඇති කෙරෙන බලපෑම" නැමති සැසියෙහි සාකච්ඡා මණ්ඩල සාමාජිකාවක ලෙස කටයුතු කළාය (මාර්තු)



- කිත්මිණ හේවගේ මහතා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් සංවිධානය කර කොළඹ දී පවත්වන ලද "ශ්‍රී ලංකාවේ ආර්ථිකය ගමන් කරමින් තිබෙන්නේ කවර දිශාවකටද?" නැමති සාකච්ඡාව මෙහෙයවූයේය (මාර්තු)
- දුෂ්නි වීරකෝන් මහත්මිය කොළඹ ෂැන්ග්‍රි ලා හෝටලයේ පැවති "එච්එසිබීසී විධායක හමුව: 2019 සහ ඉන් ඔබ්බට ගෝලීය ආර්ථික හා විදේශ විනිමය දර්ශනය" වැඩසටහනෙහි සාකච්ඡා මණ්ඩල සාමාජිකාවක ලෙස කටයුතු කළාය (අප්‍රේල්)
- කොළඹ දී "CT CLSA Asia Frontier සංසදය 2019" වැඩසටහනෙහ දී දුෂ්නි වීරකෝන් මහත්මිය "ශ්‍රී ලංකාවේ සාර්ව ආර්ථික දැක්ම" පිළිබඳ සැසියේ සාකච්ඡා මණ්ඩල සාමාජිකාවක් ලෙස කටයුතු කළාය (ජූනි)
- ආසියානු සංවර්ධන බැංකුව විසින් සංවිධානය කර ඉන්දුනීසියාවේ ජකර්තා නුවර දී පවත්වන ලද "ආර්ථික ගෝලීයකරණ සංඛ්‍යාලේඛන" පිළිබඳ කලාපීය වැඩමුළුවක දී හරිනි වීරසේකර මහත්මිය "බදු අනුපාත සහ බදු පැහැර හැරීම්: ශ්‍රී ලංකාවේ දේශසීමා බදු පැහැර හැරීම පිළිබඳ ආනුභවික විමර්ශණයක්" නැමති මාතෘකාව යටතේ ඉදිරිපත් කිරීමක් සිදු කළාය (ජූනි)
- දුෂ්නි වීරකෝන් මහත්මිය මාර්ග ආයතනය සහ ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය විසින් සංවිධානය කර කොළඹ දී පවත්වන ලද "රාජ්‍ය ණය" පිළිබඳ විද්වත් මණ්ඩල සාකච්ඡාවක් මෙහෙයවූවාය (ජූලි)
- ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය විසින් එම ආයතනයෙහිදී පවත්වන ලද දුම්කොළ භාවිතය පාලනය කිරීමේ වැඩසටහනෙහි "පෙළඹවීමේ කණ්ඩායම් වැඩමුළුව"



අතරතුරදී චාමිනී තිලංකා මහත්මිය "ආදායම සහ මිල ගණන් වලට සමගාමීව දුම්වැටි සඳහා අය කරන බදු වැඩි කළ යුතුය" යන මාතෘකාව යටතේ ඉදිරිපත් කිරීමක් සිදු කළාය (නොවැම්බර්)

- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ ආරාධනය පරිදි දුෂ්නි වීරකෝන් මහත්මිය "ශ්‍රී ලංකාවේ බදු ප්‍රතිපත්තිය, රාජ්‍ය මූල්‍ය ඒකාබද්ධ කිරීම සහ වර්ධනය සඳහා ඇති අභියෝග" පිළිබඳ 23 වැනි වාර්ෂික බදු දේශනය කොළඹ දී සිදු කළාය (දෙසැම්බර්)

විවිධ වැඩසටහන, සාකච්ඡා මණ්ඩල සහ සංසද වලදී ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂකයින් වෙළඳාම සහ කලාපීය ඒකාබද්ධතාවය සම්බන්ධ ගැටළු පිළිබඳ අවධාරණය කළහ

- දුෂ්නි වීරකෝන් මහත්මිය බංග්ලාදේශයේ ඩකා නුවර පැවති "ආර්ථික ආදර්ශකරණය පිළිබඳ දකුණු ආසියානු ජාලයේ (SANEM) ආර්ථික විද්‍යාඥයින්ගේ 4 වැනි වාර්ෂික සමුළුව - 2019" අවස්ථාවෙහිදී "නව අභියෝග පාලනය කිරීම: අන්තර්කරණය වූ සංවර්ධනය, වෙළඳාම හා මූල්‍යය - දකුණු ආසියානු දෘෂ්ටිකෝණයක්" යන තේමාව යටතේ පැවති සාකච්ඡාවේ සාකච්ඡා මණ්ඩල සාමාජිකාවක් ලෙස කටයුතු කළායි (පෙබරවාරි)
- ඉන්දියාවේ නවදිල්ලියේ දකුණු ආසියානු විශ්ව විද්‍යාලය විසින් සංවිධානය කරන ලද "දකුණු ආසියාවේ ආර්ථික සංවර්ධනය පිළිබඳ පස්වන ජාත්‍යන්තර සමුළුව" අවස්ථාවේදී දුෂ්නි වීරකෝන් මහත්මිය "සංවර්ධනය වෙමින් පවතින දකුණු ආසියාව: දැන් කුමන මාර්ගයේද" නැමති සැසියේ සාකච්ඡා මණ්ඩල සාමාජිකාවක ලෙස කටයුතු කළාය (පෙබරවාරි)
- "එක් තීරයක් - එක් මාවතක් වැඩසටහන සහ ශ්‍රී ලංකාවට එහි ඇති වැදගත්කම කුමක්ද යන්න පිළිබඳ සැබෑ අවබෝධයක් ලබා ගන්න" යන මාතෘකාව යටතේ පැවති වැඩසටහනෙහිදී ජනක විජයසිරි මහතා "එක් තීරයක් - එක් මාවතක් වැඩසටහන සහ ශ්‍රී ලංකාවට එයින් ඇති ගම්‍යමානයන්" යන මාතෘකාව යටතේ ඉදිරිපත් කිරීමක් සිදු කළේයි කොළඹ දී පවත්වන ලද මෙම වැඩසටහනට කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය සහ වරලත් සැපයුම්කරණ සහ ප්‍රවාහන ආයතනය විසින් සත්කාරකත්වය සපයන ලදී (පෙබරවාරි)
- "යෝජිත ශ්‍රී ලංකා-තායිලන්ත නිදහස් වෙළඳ ගිවිසුමෙහි ප්‍රතිලාභ ඇගයීම" පිළිබඳ ජාතික වැඩමුළුවට සහභාගී වූ ජනක විජයසිරි මහතා එහිදී "ශ්‍රී ලංකා-තායිලන්ත නිදහස් වෙළඳ ගිවිසුම පිළිබඳ SMART විශ්ලේෂණය" නැමති මාතෘකාව යටතේ ඉදිරිපත් කිරීමක් සිදු කළේයි කොළඹ වාණිජ දෙපාර්තමේන්තුව විසින් මෙම වැඩසටහනට සත්කාරකත්වය ලබා දුන්නේය (මාර්තු)
- කිත්මිණ හේවගේ මහතා තරුණ වෘත්තීයවේදීන්ගේ සංගමය විසින් සංවිධානය කර කොළඹ හැව් හි දී පවත්වන ලද, "බ්‍රිතාන්‍යය යුරෝපා සංගමයෙන් ඉවත්වීම සහ ශ්‍රී ලංකාවේ ආර්ථිකය කෙරෙහි එයින් ඇති වන ගම්‍යමානයන්" පිළිබඳ ප්‍රසිද්ධ දේශනයෙහි මුඛ්‍ය දේශනය පැවැත්වූයේය (මාර්තු)
- "ගෝලීය ඒකාබද්ධවීම සඳහා වෙළඳ ප්‍රතිපත්ති යොදා ගැනීම: ආසියා පැසිෆික් කලාපය සඳහා වන පොදු රාජ්‍ය මණ්ඩලීය උපදේශන සැසිය" නැමති සමුළුවේදී දුෂ්නි වීරකෝන් මහත්මිය "යටිතල පහසුකම්, මූල්‍යකරණය සහ එක් තීරයක් - එක් මාවතක් වැඩසටහන: නැගී එන ආර්ථිකයන් සඳහා පාඩම්" යන මාතෘකාව යටතේ පත්‍රිකාවක් ඉදිරිපත් කළායි සිංගප්පූරු ජාතික විශ්වවිද්‍යාලයේ පැවති මෙම වැඩසටහනට පොදුරාජ්‍ය මණ්ඩලීය මහලේකම් කාර්යාලය සහ දකුණු ආසියානු අධ්‍යයන ආයතනය විසින් සත්කාරකත්වය සපයා දෙන ලදී (මැයි)
- "7 වැනි චීන - දකුණු සහ අග්නිදිග ආසියානු බුද්ධි මණ්ඩල සංසදයේ" "චීනය



සහ ඉන්දියන් සාගර රටවල් අතර ආර්ථික සහයෝගිතාව" නැමති සැසියේදී දුෂ්නි වීරකෝන් මහත්මිය "එක් තීරයක් - එක් මාවතක් වැඩසටහන සඳහා අරමුදල් සැපයීම: ශ්‍රී ලංකාවෙන් පාඩම්" යන මාතෘකාව යටතේ ඉදිරිපත් කිරීමක් සිදු කළායී චීනයේ කුන්මිං හි පැවති මෙම සංසදය සඳහා යූනාන් සමාජ විද්‍යා විද්‍යාපීඨය විසින් සත්කාරකත්වය සපයන ලදී (ජූනි)

- "දකුණු-දකුණු හා ත්‍රිකෝණ සහයෝගිතාව: BAPA+40 සමුළුවෙන් පසු අවධියේ නව අවස්ථා සහ නව හවුල්කාරිත්වයන් ගවේෂණය කිරීම" පිළිබඳ සමුළුවෙහි දී දුෂ්නි වීරකෝන් මහත්මිය දකුණු ආසියානු සහයෝගී පරිසර වැඩසටහනෙහි (SACEP) "දකුණු ආසියානු සහයෝගී පරිසර වැඩසටහනෙහි දකුණු ආසියාව පිළිබඳ සාකච්ඡා මණ්ඩලයේ" සහ "සංවර්ධන සහයෝගීතා ඵලදායීත්වය සඳහා ඇති නව ප්‍රවේශයන් පිළිබඳ වට මේස සාකච්ඡාවෙහි" සාකච්ඡා මණ්ඩල සාමාජිකාවක ලෙස සහභාගී වූවායී ඉන්දියාවේ නවදිල්ලියේ පැවති මෙම සමුළුව රිසර්ච් ඇන්ඩ් ඉන්ෆොමේෂන් සිස්ටම්ස් නැමති පර්යේෂණ ආයතනය විසින් සංවිධානය කරන ලදී (අගෝස්තු)
- ජනක විජයසිරි මහතා සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යංශය විසින් කොළඹ දී සංවිධානය කරන ලද "ඉන්දියාවේ වෙළඳ පොළ ජයගැනීම" නැමති වැඩසටහනෙහි සාකච්ඡා මණ්ඩල සාමාජිකයෙක් ලෙස සහභාගී විය (අගෝස්තු)
- මියැන්මාරයේ යැන්ගොන් හි පැවති "ගෝලීය අගය දාම සහ ආර්ථික සංවර්ධනය" පිළිබඳ ආසියානු සංවර්ධන බැංකු - ආසියානු බුද්ධි මණ්ඩල සංවර්ධන සංසදය - 2019 වැඩසටහනෙහි දී දුෂ්නි වීරකෝන් මහත්මිය "ගෝලීය සහ කලාපීය අගය දාම කෙරෙහි කලාපීය ආර්ථික ඒකාබද්ධතාවයෙහි බලපෑම?" පිළිබඳ සැසියක් මෙහෙයවූවාය (ඔක්තෝබර්)
- "දකුණු ආසියාවේ තිරසර සංවර්ධනය සඳහා කලාපීය සහයෝගීතාව" පිළිබඳ ප්‍රතිපත්ති සංවාදයේ දී අතුල සේනාරත්න මහතා "නව ගෝලීය සන්දර්භය තුළ දකුණු ආසියාවේ කලාපීය ආර්ථික ඒකාබද්ධතාවය සඳහා ඇති විභවයන් සහ අභියෝග" පිළිබඳ සාකච්ඡාවේ සාකච්ඡා මණ්ඩල සාමාජිකයෙක් ලෙස කටයුතු කළේයී ආසියා පැසිෆික් කලාපය සඳහා වන චික්සත් ජාතීන්ගේ ආර්ථික සහ සමාජ කොමිසමෙහි දකුණු හා නිරිතදිග ආසියා කාර්යාලය සහ බංග්ලාදේශ ජාත්‍යන්තර සහ උපායමාර්ගික අධ්‍යයන ආයතනය ඒකාබද්ධව බංග්ලාදේශයේ ඩකා නුවර දී මෙම වැඩසටහන සංවිධානය කරන ලදී (දෙසැම්බර්)

කොළඹ විශ්වවිද්‍යාලය විසින් සංවිධානය කර කොළඹ දී පවත්වන ලද "එක් තීරුවක් - එක් මාවතක්" වැඩසටහන අවස්ථාවේදී ආයෝජන සහ මූල්‍යය පිළිබඳ අදහස් දක්වමින් කිත්මිණ හේවගේ මහතා "ශ්‍රී ලංකාවේ පශ්චාත් ගැටුම් වාතාවරණය තුළ සංවර්ධන මූල්‍යය" නැමති මාතෘකාව යටතේ පැවති විද්වත් මණ්ඩල සංකච්ඡාවකට සහභාගී විය (පෙබරවාරී) තායිලන්තයේ බැංකොක් නුවර පැවති ආසියා පැසිෆික් කලාපය සඳහා වන ආර්ථික සහ සමාජ කොමිසමේ " ආසියා-පැසිෆික් බුද්ධි මණ්ඩල සමුළුවෙහිදී" දුෂ්නි වීරකෝන් මහත්මිය "බුද්ධි මණ්ඩලවලට අරමුදල් සැපයීම සඳහා නව මූලාශ්‍ර සහ උපාය මාර්ග" පිළිබඳ සැසිය මෙහෙයවූවාය (නොවැම්බර්)

"ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ නව චින්තකයින්ගේ සමුළුව - 2019"

වැඩසටහනෙහිදී කිත්මිණ හේවගේ මහතා "තාක්ෂණය සහ ආර්ථික පරිවර්තනය" පිළිබඳ සාකච්ඡා මණ්ඩල සාකච්ඡාවක් මෙහෙයවූයේය (මාර්තු)
බ්‍රිතාන්‍ය කවුන්සිලයේ "නිර්මාණාත්මක ආර්ථික සංසදය" විසින් සංවිධානය කර කොළඹ බ්‍රිතාන්‍ය කවුන්සිලයේ දී පවත්වන ලද "ශ්‍රී ලංකාවේ නිර්මාණාත්මක කර්මාන්ත සිතියම් කිරීම" පිළිබඳ වැඩමුළුවෙහිදී දිලනි හිරිමුතුගොඩගේ මහත්මිය විසින් ඉදිරිපත් කිරීමක් සිදු කරන ලද අතර එහිදී සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට, කර්මාන්තවලට සහ ව්‍යවසායකත්වයට අදාළ ගැටළු සාකච්ඡා කරන ලදී.

බ්ලොග් ලිපි

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂකයින් අන්තර්ජාතික මෙන්ම දේශීය වේදිකාවලට ද කාලීන ගැටළු පිළිබඳ බ්ලොග් ලිපි සම්පාදනය කළහී දුෂ්නි වීරකෝන් මහත්මිය විසින් නැගෙනහිර ආසියා සංසදය සඳහා සාර්ව ආර්ථික ප්‍රතිපත්තිය සහ ව්‍යූහාත්මක ප්‍රතිසංස්කරණ පිළිබඳව සම්පාදනය කළ "ශ්‍රී ලංකාවේ දේශපාලන ගැටළු මගින් දුර්වල ආර්ථිකයක් අවදානමට පත් කරයි" (ජනවාරි); සිසිර ජයසූරිය සමග එක්ව සම්පාදනය කළ "ශ්‍රී ලංකාවේ ණය ගැටළුව චීනයේ සාදන ලද්දක් නොවේ" (පෙබරවාරි); "ශ්‍රී ලංකාවේ වරායන් සඳහා කලාපීය තරග කිරීම්" (ජූනි) සහ "ශ්‍රී ලංකාවට නව දිශාවක්" යන බ්ලොග් ලිපි ද, ටෝකිං ඉකොනොමික්ස් සඟරාව සඳහා සම්පාදනය කළ "ශ්‍රී ලංකා - චීන ආර්ථික සබඳතා කළමනාකරණය කිරීම: එක් තීරයක්-එක් මාවතක් වැඩසටහන, ණය සහ රාජෙය්පාය" (ජනවාරි) සහ "පිරිවැය ගණන් කිරීම: ත්‍රස්තවාදය සහ ශ්‍රී ලංකාවේ ආර්ථිකයට එයින් ඇති කර තිබෙන බලපෑම" (මැයි) යන බ්ලොග් ලිපි ද මෙයට ඇතුළත් වියී
ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂකයින් මෙම වර්ෂය පුරාම තාක්ෂණය සහ හතර වැනි කාර්මික විප්ලවය පිළිබඳ අවධානය යොමු කරමින් ටෝකිං ඉකොනොමික්ස් සඟරාවට දායකත්වය සපයා දුන්හ:

- නිපුණි පෙරේරා මහත්මිය සහ චින්තනී සූරියමුදලි මහත්මිය "තාක්ෂණය හරහා ශ්‍රී ලංකාවේ ආර්ථික පරිවර්තනයට ප්‍රතිපත්ති මගින් මග පාදා දෙයි" පිළිබඳ ලිපියක් සම්පාදනය කළහ (අප්‍රේල්)
- කිත්මිණ හේවගේ මහතා දම්ත්‍රි මුණසිංහ මහත්මිය සමග එක්ව "තාක්ෂණය සහ ආර්ථික පරිවර්තනය: ශ්‍රී ලංකාව හතර වැනි කාර්මික විප්ලව රැල්ල පැදයාමට සූදානම්ද?" යන මාතෘකාව යටතේ බ්ලොග් ලිපියක් සම්පාදනය කළහ (අප්‍රේල්)
- අශානි අබයසේකර මහත්මිය "හතර වැනි කාර්මික විප්ලව යුගයේ සමෘද්ධියට පැමිණීම: ශ්‍රී ලංකාව සඳහා ඇති අවස්ථා සහ අභියෝග" පිළිබඳ බ්ලොග් ලිපියක් ලිව්වාය (අප්‍රේල්)
- හරිනි වීරසේකර මහත්මිය සහ දිනුෂ්කා පරණවිතාන මහත්මිය එක්ව "ආර්ථික අවකාශය ඩිජිටල්කරණය කිරීම: ශ්‍රී ලාංකාවේ ව්‍යවසායකයිනි, ඇතුල් වෙන්න!" නැමති ලිපිය ලියූහ (අප්‍රේල්)
- "ගිලෙනවාද, නැතහොත් පිහිනනවාද? හතර වැනි කාර්මික විප්ලවය තුළ ශ්‍රී ලංකාව" නැමති මාතෘකාව යටතේ කිත්මිණ හේවගේ මහතා බ්ලොග් ලිපියක් ලිව්වේය (ජූනි)
- "My Way or the Huawei 5G තාක්ෂණයේ ආධිපත්‍යය සඳහා ඇති ගෝලීය සටන සහ ශ්‍රී ලංකාවට එයින් ඇතිවන බලපෑම" පිළිබඳ ලිපියක් ලියමින් දම්ත්‍රි මුණසිංහ මහත්මිය සිය දායකත්වය ලබා දුන්නාය (ජූනි)
- හරිනි වීරසේකර මහත්මිය "හතර වැනි කාර්මික විප්ලවයේ නව්‍යකරණ සහ බාධා අතරින් දකුණු ආසියාවේ ගමන් මග" නැමති ලිපිය ලිව්වාය (ඔක්තෝබර්) මලිත ගුණරත්න මහතා "21 වැනි සියවසේ නව මුදල්: ශ්‍රී ලංකාවට දත්ත විද්‍යාඥයින්ගේ අවශ්‍යතාව" (දෙසැම්බර්) සහ —A Block to be Unchained? - පද්ධතියෙහි දත්ත වෙනස් කළ නොහැකි ලෙස දත්ත වාර්තා කර තැබිය හැකි පද්ධතියක් ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීම" (දෙසැම්බර්) නැමති ලිපි ලිව්වේය

තවද, හරිනි වීරසේකර මහත්මිය "ශ්‍රී ලංකාවේ හොර දුම්වැටි ජාවාරම: අධික ප්‍රචාරණය සහ යථාර්ථය" යන මාතෘකාව යටතේ ද (ඔක්තෝබර්). නිශා අරුණතිලක මහත්මිය සහ චාමිනී තිලංකා මහත්මිය එක්ව "දුම්කොළ භාවිතය පාලනය කිරීමේදී බදුවල කාර්යභාරය: ශ්‍රී ලංකාව එය නිවැරදිව අවබෝධ කර ගෙන තිබේද?" යන මාතෘකාව යටතේ ද (දෙසැම්බර්) ලිපි සම්පාදනය කළහී
කිත්මිණ හේවගේ මහතා "බ්‍රිතාන්‍යයේ මහා වෙන්වීම: බ්‍රිතාන්‍යය යුරෝපා සංගමයෙන් වෙන්වීමේ විනාශය අවබෝධ කර ගැනීම" පිළිබඳ ලිපියක් ලිව්වේය (පෙබරවාරි)
දිලනි හිරිමුතුගොඩගේ මහත්මිය"කාට කුමක් හිමි වන්නේද? ශ්‍රී ලංකාවේ බුද්ධිමය

දේපළ අයිතිවාසිකම් පටිපාටිය හතර වැනි කාර්මික විප්ලවය සඳහා සූදානම්ද?" නැමති මාතෘකාව යටතේ බුද්ධිමය දේපළ සම්බන්ධ ගැටළුවලට ආමන්ත්‍රණය කෙරෙන බ්ලොග් ලිපියක් ලිව්වාය (සැප්තැම්බර්)
ෆෝකිං ඉකොනොමික්ස් බ්ලොග් අඩවිය සඳහා ලියන ලද සියලුම ලිපි ප්‍රධාන පෙළේ පුවත්පත්වල සහ සමාජ මාධ්‍ය වේදිකා වල පළ කරන ලදී

මාධ්‍ය

දුෂ්නි වීරකෝන් මහත්මිය තායිලන්තයේ ඡඡඔඩ රූපවාහනී සේවාවට "ශ්‍රී ලංකා - චීන සම්බන්ධතා සහ කොළඹ වරාය නගරය" යන මාතෘකාව යටතේ සම්මුඛ සාකච්ඡාවක් ලබා දුන්නායි The Frontier Post පුවත්පත වෙහි පළකළ "චීන ණය රාජ්‍යාපාය ශ්‍රී ලංකාවේ ආර්ථිකය සහ පරිසරය ගිල්වමින් සිටියි" නැමති ලිපියෙහි දී එක් තීරුවක් - එක් මාවතක් වැඩසටහන පිළිබඳ කිත්මිණ හේවගේ මහතා විසින් සම්පාදනය කරන ලද ලිපියකින් කරුණු උපුටා දැක්වීය (අප්‍රේල්).
2019 අයවැය සම්බන්ධයෙන් ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂකයින්ගේ ප්‍රවේශය දේශීය මුද්‍රිත මාධ්‍ය වල පළ කරමින් 'ඩේලි නිව්ස්' සහ 'ද අයිලන්ඩ්' යන පුවත්පත්වල "2019 අයවැය පිළිබඳ ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ අදහස් සහ ප්‍රතිචාර" නැමති ලිපි පළ විය (මාර්තු).
"බ්‍රිතාන්‍යය යුරෝපා සංගමයෙන් ඉවත් වීම සහ ශ්‍රී ලංකාවට එයින් ඇතිවන ගම්‍යමානයන්" පිළිබඳව කිත්මිණ හේවගේ මහතා විසින් ලියන ලද ලිපිය ඩේලි නිව්ස් පුවත්පතෙහි පළ කරන ලදී (අප්‍රේල්).
කිත්මිණ හේවගේ මහතා TV1 රූපවාහිනී නාලිකාවේ Biz 1st වැඩසටහනට සහභාගී වෙමින් "හතර වැනි කාර්මික විප්ලවය සහ ශ්‍රී ලංකාවට එයින් ඇතිවන බලපෑම්" පිළිබඳව සාකච්ඡා කළේය.



සංක්‍රමණය සහ නාගරීකරණය

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය සංක්‍රමණය සහ නාගරීකරණය පිළිබඳ සිදු කළ අධ්‍යයන මගින් සේවකයින්ට මෙන්ම රටට ද වාසිදායක වන විදේශ රැකියා අවස්ථා හඳුනාගෙන ප්‍රවර්ධනය කිරීම සහ තිරසර අභ්‍යන්තර සංක්‍රමණය සහ නාගරීකරණය සඳහා සැලසුම් කිරීම යන ද්විත්ව අභියෝග විමසා බලන ලදී.

සංක්‍රමණය සහ ප්‍රේෂණ



ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ සංක්‍රමණය සහ නාගරීකරණය සම්බන්ධ පර්යේෂණ කණ්ඩායම ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ අත්‍යාවශ්‍ය අංගයක් ලෙස සැලකෙන සංක්‍රමණය ක්ෂේත්‍රයට ආමන්ත්‍රණය කෙරෙන විවිධ පර්යේණ ක්‍රියාකාරකම් සිදු කළහ. රැකියා සොයා තම නිවසින් බැහැරව යාමට තීරණය කරන තරුණ පුද්ගලයින්ට ඔවුන්ගේ අනාගත ගමන් මග පිළබඳව තිබෙන සංකීර්ණ අපේක්ෂාවන් සහ සැලකිලිමත්වීම් පිළිබඳව විමර්ශනය කර බැලීම පිණිස බිලේෂා වීරරත්න මහත්මිය "සංකල්පිත අනාගතයන්" පිළිබඳ ගුණාත්මක අධ්‍යයනයක් සිදු කළාය. රට පුරා වන සංසන්දනාත්මක විශ්ලේෂණයක කොටසක් ලෙස සිදු කරන ලද මෙම අධ්‍යයනයට ශ්‍රම සංක්‍රමණය පිළිබඳ පර්යේෂණ සහ ආනුභවික විශ්ලේෂණය (REALM) විසින් අරමුදල් සපයන ලදී.

හරිණි වීරසේකර මහත්මිය සමග එක්ව බිලේෂා වීරරත්න මහත්මිය ඒ ආශ්‍රිත විවිධ ගැටළු සම්බන්ධ වැඩිදුර අධ්‍යයන සිදු කළාය."ප්‍රේෂණ මගින් පවුලේ මෙරට ඉතිරිවන සාමාජිකයින්ගේ ඉතිරිකිරීමේ සහ ණය ගැනීමේ චර්යාවන් වෙනස් වන්නේද?" නැමති අධ්‍යයනය මගින් නියෝජක - නියෝජිත ගැටළුව සහ ඒ ආශ්‍රිතව ඇතිවන සංක්‍රමණිකයා සහ මෙරට ඉතිරිවී සිටින පවුලේ සාමාජිකයින් අතර සදාචාර උවදුර සංක්‍රමණයේ පූර්ණ විභවය සාක්ෂාත් කර ගැනීමට බාධාකාරී වන තත්ත්වයක, සංක්‍රමණිකයාගේ මෙරට ඉතිරිවී සිටින පවුලේ සාමාජිකයින්ගේ ඉතිරිකිරීමේ සහ ණය ගැනීමේ චර්යාවන් කෙරෙහි සංක්‍රමණය මගින් ඇතිවන අනියම් බලපෑම විමර්ශනය කළාය. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් මෙම අධ්‍යයනයට අරමුදල් සපයන ලදී.

ප්‍රේෂණ පිරිවැය අඩුකර ගැනීමේ ක්‍රම හඳුනා ගැනීමට තීරණ ගන්නන්ට උපකාරී වීම පිණිස "සංක්‍රමණික සේවකයින් සඳහා ප්‍රේෂණ පිරිවැය අඩු කිරීමේ අරමුණ ඇතිව ප්‍රේෂණ රටා" පිළිබඳ සිදු කරන ලද අධ්‍යයනයක් සඳහා ලෝක කම්කරු සංවිධානය විසින් අරමුදල් සපයන ලදී.

බඳවා ගැනීමේ නියෝජිතයින් විසින් බඳවා ගැනීම සඳහා දරනු ලබන වියදම් ද ඇතුළුව බඳවා ගැනීමේ ව්‍යාපාර ක්‍රියාවලිය පිළිබඳව විමසා බැලෙන "බඳවා ගැනීමේ ව්‍යාපාර ක්‍රියාවලිය" පිළිබඳ අධ්‍යයනයක් සඳහා ද ලෝක කම්කරු සංවිධානය විසින් අරමුදල් සපයන ලදී. එක්සත් ජාතීන්ගේ විශ්වවිද්‍යාලය - සංවර්ධන ආර්ථික විද්‍යා පර්යේෂණ සඳහා වන ලෝක ආයතනය (UNU-WIDER). පවුල් පසුබිම් වාර්තාව ලබා දීමේ අවශ්‍යතාවය හඳුන්වාදීම විවිධ පුහුණු කාණ්ඩ වලට අයත් වන කාන්තාවන්ට ස්ත්‍රී පුරුෂ සමාජවාදී බාධකයක් ලෙස ක්‍රියා කරන්නේ කෙසේද යන්න සහ ආදායම් ඉපැයීමේ බර දැරීමේදී පිරිමින් සහ කාන්තාවන් ආදේශ කිරීම කෙරෙහි පවුල් පසුබිම් වාර්තාවෙන් ඇතිවිය හැකි බලපෑම පිළබඳ විමර්ශනය කර බැලීමට මෙයින් අරමුණු කරන ලදී.

නාගරීකරණය

නාගරීකරණය පිළිබඳ ගැටළු වලට ආමන්ත්‍රණය කරමින් බිලේෂා වීරරත්න මහත්මිය "උප-ජාතික මට්ටමේ මූල්‍යකරණය සහ ප්‍රාදේශීය සේවා බෙදා හැරීම: ශ්‍රී ලංකාවේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය කිරීමෙහි තත්ත්වය" නැමති මාතෘකාව යටතේ ලියන ලද පර්යේෂණ පත්‍රිකාව "දකුණු ආසියාවේ උප-ජාතික මට්ටමේ මූල්‍යකරණය සහ ප්‍රාදේශීය සේවා බෙදා හැරීම පිළිබඳ වූ හතර වැනි දකුණු ආසියානු ආර්ථික ජාල සමුළුව" අවස්ථාවේදී ඉදිරිපත් කරන ලදී. බංග්ලාදේශයේ ඩකා නුවර පැවති මෙම වැඩසටහනට ආර්ථික ආදර්ශකරණය සඳහා වන දකුණු ආසියානු ජාලය විසින් සත්කාරකත්වය සපයා දෙන ලදී (සැප්තැම්බර්).

ප්‍රකාශන

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ ප්‍රධානතම ප්‍රකාශනය වන "ශ්‍රී ලංකාව: ආර්ථිකයෙහි තත්ත්වය 2019" සඳහා බිලේෂා වීරරත්න මහත්මිය "සංක්‍රමණය සහ ප්‍රේෂණ: ශ්‍රී ලංකාවේ ඉතිරි වන පවුලේ සාමාජිකයින්ගේ මූල්‍ය චර්යාවන් කෙරෙහි ඇතිවන බලපෑම" (ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ ශ්‍රම සංක්‍රමණ පර්යේෂණ මාලා අංක 201, ජූලි), සහ "හතර වැනි කාර්මික විප්ලවය තුළ සංක්‍රමණය සහ අන්තර්ජාතික සංචාරය කිරීම්" නැමති ලිපි සම්පාදනය කළාය. ජනක විජයසිරි මහතා අන්තර්ජාතික ආර්ථික ප්‍රතිපත්තිය පිළිබඳ කොරියානු ආයතනයේ පර්යේෂණ සාමාජිකත්වය දරන අතරතුරදී එම ආයතනය සඳහා "දකුණු ආසියාවේ අඩු පුහුණු සංක්‍රමණිකයින්ගේ

පිරිවැය: ශ්‍රී ලංකාව පිළිබඳ තත්ත්වය" නැමති මාතෘකාව යටතේ පර්යේෂණ පත්‍රිකාවක් ලිව්වේය.

බිලේෂා වීරරත්න මහත්මිය නාගරීකරණය හා සම්බන්ධ ගැටළු අවධාරණය කරමින් දුෂ්නි වීරකෝන් මහත්මිය සහ සිසිර ජයසූරිය මහතා විසින් සංස්කරණය කරන ලද පශ්චාත් ගැටුම් වාතාවරණය තුළ සංවර්ධනයේදී අභ්‍යන්තර සහ අන්තර්ජාතික අභියෝග සහ අවස්ථා කළමනාකරණය කර ගැනීම: ශ්‍රී ලංකාවෙන් උගත හැකි පාඩම්, සිංගප්පූරුව: සප්‍රින්ජර් සඳහා "මැදි ආදායම් තත්ත්වයට පරිවර්තනය කිරීම සහ ඉන් ඔබ්බට: පශ්චාත් ගැටුම් වාතාවරණය තුළ ශ්‍රී ලංකාවේ නාගරීකරණය සම්බන්ධ ගැටළු" නැමති පර්ච්ඡේදයක් ද, සුමන බන්ඩ්‍යෝපාද්‍ය ඇතුළු පිරිස විසින් සංස්කරණය කරන ලද, සමාජ ආර්ථික ධාවක, පාරිසරක බලපෑම් සහ ප්‍රතිපත්ති ප්‍රතිචාර නැමති මාතෘකාව යටතේ දකුණු ආසියාවේ නාගරීකරණය සහ කලාපීය තිරසරභාවය, 1 වැනි මුද්‍රණය , 2020 සංස්කරණය, සිංගප්පූරුව: ස්ප්‍රින්ජර්, සඳහා "ශ්‍රී ලංකාවේ නාගරික නිවාස" නැමති පර්ච්ඡේදයක් ද සම්පාදනය කළාය.

ප්‍රතිපත්ති නියැළීම්

කමිටු

බිලේෂා වීරරත්න මහත්මිය විදුලි සංදේශ, විදේශ රැකියා සහ ක්‍රීඩා අමාත්‍යංශය විසින් කැඳවන ලද, ශ්‍රම සංක්‍රමණය පිළිබඳ ජාතික උපදේශක කමිටුව සඳහා ප්‍රතිපත්ති යෙදවුම් සපයා දුන්නාය. එමෙන්ම, ඒ මහත්මිය විදුලි සංදේශ, විදේශ රැකියා සහ ක්‍රීඩා අමාත්‍යංශය යටතේ විදේශ රැකියා කර්මාන්තය සඳහා බඳවා ගැනීමේ අතරමැදියන් නියමානුකූල කිරීම සඳහා වන කාර්ය පටිපාටි කෙටුම්පත් කිරීම සඳහා වන කාර්ය සාධක බලකායේ සාමාජිකාවක ලෙස ද කටයුතු කළාය.
එමෙන්ම, බිලේෂා වීරරත්න මහත්මිය සහ නිශා අරුණාතිලක මහත්මිය ලෝක කම්කරු සංවිධානය විසින් සංවිධානය කරන ලද සංශෝධිත ජාතික ශ්‍රම සංක්‍රමණ ප්‍රතිපත්තිය සම්පාදනය කිරීම සඳහා වන විශේෂඥ කණ්ඩායමේ සාමාජිකාවන් ලෙස ද කටයුතු කළහ.

ඉදිරිපත් කිරීම් සහ සාකච්ඡා මණ්ඩල

සංක්‍රමණය සහ ප්‍රේෂණ සමබන්ධ විවිධ ගැටළු සාකච්ඡා කෙරෙන පර්යේෂණ මගින් අනාවරණය කර ගත් කරුණු ප්‍රචාරණය කරමින් ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂකයින් පහත සඳහන් අවස්ථාවන්ට සහභාගී වූහ:

- කොළඹ පිහිටි විදුලි සංදේශ, විදේශ රැකියා සහ ක්‍රීඩා අමාත්‍යංශයේදී පවත්වන ලද "බඳවා ගැනීමේ අතරමැදියන් නියමානුකූල කිරීම සඳහා වන කාර්යසාධක බලකායේ" සමාරම්භක රැස්වීමේදී බිලේෂා වීරරත්න මහත්මිය "ශ්‍රී ලංකාවේ විදේශ රැකියා කර්මාන්තයේ බඳවා ගැනීමේ අතරමැදියන්" නැමති මාතෘකාව යටතේ ඉදිරිපත් කිරීමක් සිදු කළාය (ජනවාරි).
- කොළඹ පිහිටි ලෝක කම්කරු සංවිධානයේ පැවති "බඳවා ගැනීමේ අතරමැදියන් නියමානුකූල කිරීම" පිළිබඳ සාකච්ඡාවේදී බිලේෂා වීරරත්න මහත්මිය "ශ්‍රී ලංකාවේ විදේශ රැකියා කර්මාන්තයේ බඳවා ගැනීමේ අතරමැදියන්" නැමති මාතෘකාව යටතේ ඉදිරිපත් කිරීමක් සිදු කළාය (පෙබරවාරි).
- තුන් වැනි වාර්ෂික "ශ්‍රම සංක්‍රමණය පිළිබඳ පර්යේෂණ සහ ආනුභවික විශ්ලේෂණ වැඩමුළුව" අවස්ථාවේදී බිලේෂා වීරරත්න මහත්මිය "තාවකාලික සංක්‍රමණික සේවකයින් බඳවා ගැනීම සහ ශ්‍රී ලංකාවේ උප-නියෝජිතයින්ගේ විකසනය වෙමින් පවතින කාර්ය භාරය" පිළිබඳ ඉදිරිපත් කිරීමක් සිදු කළාය. මෙම වැඩමුළුව අබුඩාබි හි පිහිටි නිව් යෝර්ක් විශ්වවිද්‍යාලයේදී පවත්වන ලදී (මාර්තු).
- "ශ්‍රී ලංකාවේ සංක්‍රමණය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය: සංක්‍රමණය සඳහා වන ගෝලීය ගිවිසුම සඳහා වන ප්‍රවනතා සහ අවස්ථා" යන්න "සුරක්ෂිත, ක්‍රමවත් සහ විධිමත් සංක්‍රමණය සඳහා වන ස්ත්‍රී පුරුෂ සමාජභාව ප්‍රතිචාරී ගෝලීය ගිවිසුමක් ක්‍රියාත්මක කිරීම සඳහා වන ජාතික උපදේශක වැඩසටහන" අවස්ථාවේදී බිලේෂා වීරරත්න මහත්මිය සිදු කළ ඉදිරිපත් කිරීමෙහි තේමාව විය. එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් කොළඹ දී මෙම වැඩසටහන සංවිධානය කරන ලදී (මාර්තු).
- ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය (ජූනි) සහ ලෝක කම්කරු සංවිධානය (ජූලි) විසින් සංවිධානය කරන ලද සමුළු වලදී බිලේෂා වීරරත්න මහත්මිය " ප්‍රේෂණ" පිළිබඳ ඉදිරිපත් කිරීම් සිදු කළාය.
- ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය විසින් කොළඹ දී සංවිධානය කර සත්කාරකත්වය සපයන ලද "XII වැනි දකුණු ආසියානු ආර්ථික සමුළුව" අවස්ථාවේදී බිලේෂා



වීරරත්න මහත්මිය "හතර වැනි කාර්මික විප්ලවය තුළ ශ්‍රම සංක්‍රමණය කළමනාකරණය කිරීම" පිළිබඳ ඉදිරිපත් කිරීමක් සිදු කළාය (සැප්තැම්බර්).

- "දකුණු කොරියාවේ අඩු පුහුණු සංක්‍රමණිකයිගේ පිරිවැය: ශ්‍රී ලංකාව පිළිබඳ තත්ත්වය" යන්න දකුණු කොරියාවේ අන්තර්ජාතික ආර්ථික ප්‍රතිපත්තිය සඳහා වන කොරියානු ආයතනයේ "බාහිර ශාස්ත්‍රඥයින්ගේ සම්මන්ත්‍රණයේදී" ජනක විජයසිරි මහතා සිදු කළ ඉදිරිපත් කිරීමෙහි මාතෘකාව විය (ඔක්තෝබර්).
- රුවන් සමරවීර මහතා කැලණිය විශ්වවිද්‍යාලයේදී "ශ්‍රී ලංකාවේ ග්‍රාමීය අංශයේ කුටුම්බයන්හි වියදම් රටාව කෙරෙහි ප්‍රේෂණ සහ ස්ත්‍රී පුරුෂ සමාජභාව මගින් ඇති කරන බලපෑම" පිළිබඳ සමුළු පත්‍රිකාවක් ඉදිරිපත් කළේය (ඔක්තේබර්).
- රුවන් සමරවීර මහතා ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේදී "සංක්‍රමණය, ප්‍රේෂණ සහ දිළිඳුභාවය; ශ්‍රී ලංකාවේ ග්‍රාමීය අංශයෙන් ලැබෙන සාක්ෂි" පිළිබඳ පත්‍රිකාවක් ඉදිරිපත් කළේය (නොවැම්බර්).
- බිලේෂා වීරරත්න මහත්මිය "2019 ගෝලීය මානුෂීය ප්‍රතිපත්ති සංසදයෙහි" සාකච්ඡා මණ්ඩල සාමාජිකාවක් ලෙස කටයුතු කළාය. එක්සත් ජාතීන්ගේ මානුෂීය කටයුතු සම්බන්ධීකරණය සඳහා වන කාර්යාලය (UNOCHA) සහ එක්සත් ජාතීන්ගේ පදනම විසින් ඇමරිකා එක්සත් ජනපදයේ නිව්යෝර්ක් නුවරදී මෙම වැඩසටහන සංවිධානය කරන ලදී (දෙසැම්බර්).
- අතුල සේනාරත්න මහතා "සීමා ඉක්මවා යාම: අවදානම් සංවේදී නාගරික සංවර්ධනය" නැමති වැජමුළුවේදී නාගරීකරණය පිළිබඳ "අවදානම් සංවේදී නාගරික සංවර්ධනය" පිළිබඳ සැසියේ සංකච්ඡා මණ්ඩල සාමාජිකයෙක් ලෙස කටයුතු කළේය. කොළඹදී පවත්වන ලද මෙම වැඩසටහන එක්සත් රාජධානියේ සැල්ෆර්ඩ් විශ්වවිද්‍යාලය, මොරටුව විශ්වවිද්‍යාලය සහ මවුන්ට් ලැවීනියා හෝටලය ඒකාබද්ධව සංවිධානය කරන ලදී (දෙසැම්බර්).

බ්ලොග් අඩවි

බිලේෂා වීරරත්න මහත්මිය "තීරණාත්මක වෙනසක් ඇති කිරීම: ශ්‍රී ලංකාවට සේවකයින්ගෙන් ලැබෙන ප්‍රේෂණ අපි සිතන තරමට ම විශාලද?" (පෙබරවාරි), "ගුප්ත බව සැඟවී ඇත: ශ්‍රී ලංකාවේ ප්‍රේෂණ පිළිබඳ වඩාත් සමීප ලෙස විමසා බැලීමක්" (ජූලි), සහ "ශ්‍රී ලංකාවට ලැබෙන ප්‍රේෂණවල ස්ත්‍රී පුරුෂ සමාජභාවී මානයන්: වැඩියෙන් ප්‍රේෂණය කරන්නේ කවුද?" (දෙසැම්බර්) ආදී කරුණු ඇතුළු සංක්‍රමණයට අදාළ විවිධ ක්ෂේත්‍ර පිළිබඳව ටෝකිං ඉකොනොමික්ස් සඟරාවට බ්ලොග් ලිපි ලිව්වාය. ජනක විජයසිරි මහතා "ඉතිරි කර ගත් මුදල උපයා ගත් මුදලක් වේ: දකුණු කොරියාවේ සිටින ශ්‍රී ලාංකික සේවකයින්ට වඩාත් වැඩියෙන් ඉතිරි කිරීම සඳහා උපකාර කිරීම" නැමති බ්ලොග් ලිපිය ලිව්වේය (ඔක්තෝබර්).
බිලේෂා වීරරත්න මහත්මිය "සංක්‍රමණය සහ ත්‍රස්තවාදය අතර ඇති අනර්ථකාරී සම්බන්ධතාවය: ශ්‍රී ලංකාවේ දේශසීමා පාලනය කිරීම සඳහා ඇති ගම්‍යමානයන්" (අප්‍රේල්), සහ "සංචාරක ව්‍යාපාරය සහ ප්‍රේෂණ: ශ්‍රී ලංකාවේ විදේශ විනිමය ඉපැයීම්

කෙරෙහි පාස්කු දින ප්‍රහාරවල බලපෑම" (මැයි) යන ලිපි ද රචනා කළ අතර, ආසියා සංවාදය නැමති බ්ලොග් අඩවිය සඳහා, "රොබෝවක් විසින් ප්‍රතිස්ථාපනය කරනු ලැබුවේද? බුද්ධි යුගයේ ශ්‍රී ලංකාවෙන් සිදු වන ශ්‍රම සංක්‍රමණය " නැමති ලිපිය රචනා කළාය (ජූලි).

එමෙන්ම, නිමේෂා දිසානායක මහත්මිය එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනෙහි (UNDP) UNLOCKED අවකාශය සඳහා "නාගරික ප්‍රතිපත්ති සහ සැලසුම්කරණයේදී ජල පාලනය" පිළිබඳ ලිපියක් ලිව්වාය (ජූලි).

ටෝකිං ඉකොනොමික්ස් බ්ලොග් අඩවියට ලියන ලද සියලුම ලිපි ප්‍රධාන පෙළේ පුවත්පත් සහ සමාජ මාධ්‍ය වේදිකාවල පළ කරන ලදී.

මාධ්‍ය

බිලේෂා වීරරත්න මහත්මිය ඔඩ 1 රූපවාහිනි නාලිකාවේ විකාශය කරන ලද Biz 1st in Focus නැමති වැඩසටහන සඳහා "ශ්‍රී ලංකාවේ ශ්‍රම සංක්‍රමණයෙහි විකසනය සාකච්ඡා කිරීම" නැමති රූපවාහිනී සාකච්ඡාවකට සහභාගී වූවාය (ජූලි).







සෞඛ්‍යය, අධ්‍යාපනය සහ ශ්‍රමය

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය විසින් 'තිරසර සංවර්ධනය සඳහා මානව සම්පත්' පිළිබඳව සිදු කරන ලද පර්යේෂණ මගින් තාක්ෂණය විසින් අඛණ්ඩව නැවත හැඩගස්වමින් තිබෙන, ගෝලීයකරණය වූ ආර්ථිකයක වෙනස්වෙමින් පවතින ඉල්ලුම් සපුරාලීම සඳහා ශ්‍රී ලංකාවේ මානව සම්පත් ශක්තිමත් කිරීම කෙරෙහි බලපාන බාධක වලට ආමන්ත්‍රණය කරයි. උසස් තත්ත්වයේ තෘතීයික මට්ටමේ අධ්‍යාපනය සඳහා ප්‍රවේශය වැඩිදියුණු කිරීම, සාමාන්‍ය අධ්‍යාපනයෙහි ගුණාත්මක භාවයෙහි සහ ඒ සඳහා ඇති ප්‍රවේශයෙහි තිබෙන අඩුපාඩු සම්පූර්ණ කිරීම, සහ පෝෂණය හා බෝ නොවන රෝග පැතිරීම වැනි සෞඛ්‍ය ගැටළුවලට විසඳීම අධ්‍යාපනයේ සාර්ථකත්වය සඳහා සහ වැඩ ජීවිතයේ ඵලදායිතාව සහතික කිරීම සඳහා වැදගත් වේ. ඵලදායීත්වය සහ ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතය වර්ධනය කිරීම අවශ්‍ය කරන, අඩු වෙමින් පවතින වැඩ කරන වයසේ ජනගහනයක් සහ වැඩි වෙමින් පවතින වයස්ගත ජනගහනයක් සිටීම මගින් පිළිබිඹු කෙරෙන ජනවිකාශ සංක්‍රාන්තිය විසින් ශ්‍රම වෙළඳ පොළ අංශයෙහි පවතින අභියෝග වඩාත් සංකීර්ණ කර තිබේ. සෞඛ්‍ය, අධ්‍යාපනය සහ ශ්‍රමය යන ක්ෂේත්‍ර පිළිබඳ පර්යේෂණ කණ්ඩායම මානව සම්පත් සහ අදාළ ප්‍රතිපත්තිය සම්බන්ධ විවිධ අධ්‍යයන පරාසයක නියැලුනේය.

නිපුණතා සහ අධ්‍යාපනය



ශ්‍රී ලංකාවේ 5 වැනි ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයේ දී සාර්ථක ප්‍රතිඵල ලබා ගැනීමේ අනුපාතය පහත මට්ටමක තිබීමට හේතු සහ එම විභාගයේ සප්‍රමාණතාව සහ අදාළත්වය පිළිබඳව මෑතකාලයේදී එම විභාගයට පෙනී සිටියවුන් අතර ඇති අවබෝධය පිළිබඳ විමසා බැලීම සඳහා අශානි අබයසේකර මහත්මිය "ශ්‍රී ලංකාවේ 5 වැනි ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගය: කාර්ය සාධනය සහ සඵලත්වය ඇගයීම" නැමති මාතෘකාව යටතේ අධ්‍යයනයක් සිදු කළාය. ශ්‍රී ලංකාවේ 5 වැනි ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයෙහි සඵලතාවය සහ අදාළත්වය වැඩිදියුණු කිරීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග ගණනාවක් මෙම අධ්‍යයනය මගින් යෝජනා කරන ලදී. අනාවරණය කර ගනු ලැබූ ප්‍රධාන කරුණු සහ ප්‍රතිපත්ති නිර්දේශ සාරාංශ කෙරෙන ප්‍රතිපත්ති සංක්ෂිප්තයක් ද සමග මෙම අධ්‍යයනය මගින් සොයාගත් කරුණු අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරීන් වෙත භාර දෙන ලදී. ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය මෙම අධ්‍යයනය සඳහා අරමුදල් සපයා දුන්නේය.

සෞඛ්‍යය

ප්‍රියංකා ජයවර්ධන මහත්මිය සහ චතුර්ගා කරුණානායක මහත්මිය "මාතෘ හා ළමා සෞඛ්‍යය සහ පෝෂණය පිළිබඳ මූලික සමීක්ෂණය" නැමති මාතෘකාව යටතේ අධ්‍යයනයක් සිදු කළහ. පහත සඳහන් වතුකර ප්‍රජාවන්ගේ සෞඛ්‍ය සහ පෝෂණ පරිචයන් නිශ්චය කර ගැනීම, වර්තමාන ප්‍රතිපත්ති සහ පවතින සෞඛ්‍ය හා ළමා රැකවරණ සේවා උපයෝගී කර ගැනීමේ මට්ටම ඇගයීම, සහ අඩුපාඩු සම්පූර්ණ කර දීම සඳහා සහ තත්ත්වයන් වැඩි දියුණු කිරීම සඳහා ඇති ප්‍රවේශ ස්ථාන හඳුනා ගැනීම යන ක්ෂේත්‍ර තුනෙහි මැදිහත්වීම් පිළිබඳ අවධානය යොමු කරමින් මාතෘ හා ළමා සෞඛ්‍ය සේවාවන්හි ගුණාත්මකභාවය සහ එම සේවාවන්ට ඇති ප්‍රවේශය වැඩිදියුණු කිරීම අරමුණු කර ගනිමින් සිදු කළ මෙම අධ්‍යයනය සඳහා සේව් ද චිල්ඩ්‍රන් ශ්‍රී ලංකා සංවිධානය විසින් අරමුදල් සපයන ලදී.
ප්‍රියංකා ජයවර්ධන මහත්මිය ලෝක බැංකුව සමග එක්ව "ශ්‍රී ලංකාවේ පෝෂණය සඳහා වන රාජ්‍ය වියදම් සමාලෝචනය: පෝෂණය සඳහා රාජ්‍ය මුදල් යෙදවීම් ඇගයීම (2014-2018)" නැමති මාතෘකාව යටතේ ද අධ්‍යයනයක් සිදු කළාය. රටෙහි සමස්ත රාජ්‍ය වියදමෙහි මට්ටමට සාපේක්ෂව පෝෂණය සඳහා සිදු කරනු ලබන රාජ්‍ය වියදම්වල මට්ටම හඳුනා ගැනීමේ මූලික අරමුණ ඇතිව සිදු කරන ලද මෙම අධ්‍යයනය මගින් ශ්‍රී ලංකාවේ පෝෂණය සඳහා දරනු ලබන රාජ්‍ය වියදම් විමසා බලන ලදී. ළමා පෝෂණය වැඩි දියුණු කිරීමේ ප්‍රතිපත්ති වැදගත්කම හඳුනාගත් මෙම වාර්තාව ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා, එක්සත් ජාතීන්ගේ සංවිධානය සහ ලෝක බැංකුව වෙත පිරිනමන ලද අතර, ජනාධිපති ලේකම් කාර්යාලයේ පැවති එම අවස්ථාව එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (යුනිසෙෆ්) විසින් සංවිධානය කරන ලදී.

තවද, ප්‍රියංකා ජයවර්ධන මහත්මිය ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි අරමුදල් සැපයීම මත "ශ්‍රී ලංකාවේ මන්දපෝෂණය: අනවරත ගැටළුවක්" නැමති මාතෘකාව යටතේ අධ්‍යයනයක් සිදු කළාය. 2006 - 2016 කාල පරිච්ඡේදය තුළදී ළමා මන්දපෝෂණය යහපත් තත්ත්වයකට පත්වී නැත්තේ මන්ද යන්න එම අධ්‍යයනය මගින් විමසා බලන ලද අතර, මන්දපෝෂණයේ පරම්පරාන්තර චක්‍රය මෙන්ම භව්‍ය ආහාර ගැටළු සහ දැනුම් පරතර ද ශ්‍රී ලංකාවේ සැලකිය යුතු මට්ටමකින් දක්නට ලැබෙන බව එම අධ්‍යයනය මගින් අනාවරණය විය.

2019 වර්ෂයේදී, ශ්‍රී ලංකාවේ සමස්ත ප්‍රතිපත්ති න්‍යාය පත්‍රයේ වැදගත් අංගයක් ලෙස දුම්කොළ භාවිතය පාලනය කිරීම සම්බන්ධ පර්යේෂණවල දෘශ්‍ය බව වැඩිකිරීම සහ දුම්කොළ භාවිතය පාලනය කිරීම සඳහා ප්‍රමුඛත්වය ලබා දීම ඉහළ නැංවීම ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ අරමුණු වලින් එකක් විය. එසේ කිරීම මගින් ශ්‍රී ලංකාවේ පවතින දුම්පානය 10% ට අඩු මට්ටමක් දක්වා පහත දැමීමට අපේක්ෂා කරන ලදී. දුම්කොළ භාවිතය සම්බන්ධයෙන් නිශා අරුණතිලක මහත්මිය සිදු කළ අධ්‍යයන මාලාවක් සඳහා එක්සත් රාජධානියේ කැනසර් රිසර්ච් සහ ණෂඬඹ ඉන්ටර්නැෂනල් යන ආයතන විසින් අරමුදල් සපයා දෙන ලදී.

ශ්‍රී ලංකාවේ දුම්කොළ භාවිතය මේ වන විටත් බොහෝ සෙයින් පහත මට්ටමක පවතින අතර "දුම්කොළ භාවිතය පාලනය කිරීම: අවසන් අදියර ක්‍රියාත්මක කිරීම" නැමති අධ්‍යයනය මගින් දුම්කොළ භාවිතය පාලනය කිරීම සඳහා වන ප්‍රතිපත්ති වෙනුවෙන් පෙනී සිටීම තුළින් මෙරට දුම්කොළ භාවිතය ආශ්‍රිතව

සිදුවන හානිය අඩු කිරීමට අරමුණු කරන ලදී. දුම්කොළ භාවිතයට අදාළව ශ්‍රී ලංකාවේ වර්තමාන තත්ත්වය සහ ශ්‍රී ලංකාවේ දුම්කොළ භාවිතා කරන්නන්ගෙන් 'අවසන් අදියරේ' සිටින දුම්පානය කරන්නන් අතර දුම්පානය කිරීම නවතා දැමීම පිණිස මෙරට සඳහා වන ප්‍රතිපත්ති විකල්ප පරීක්ෂා කර බැලීමට අරමුණු කරමින් සුනිමාලි මදුරාවල මහත්මිය සහ චතුර්ගා කරුණානායක මහත්මිය " දුම්කොළ භාවිතය පාලනය කිරීමේ වැඩසටහන: නවතා දැමීමේ ප්‍රතිපත්තිය" නැමති මාතෘකාව යටතේ අධ්‍යයනයක් සිදු කළහ. 'ළඟා වීමට දුෂ්කර කණ්ඩායම්' අවබෝධ කර ගැනීම වැදගත් වන බවත්, එය ශ්‍රී ලංකාවේ අවසන් අදියරේ සිටින දුම්පානය කරන්නන් අතර දුම්පානය කිරීමේ පුරුද්ද අඩු කිරීම සඳහා ප්‍රමුඛත්වය ලබා දිය යුතු ක්ෂේත්‍රයක් ලෙස සැලකිය යුතු බවත් මෙම අධ්‍යයනය මඟින් අනාවරණය විය.

සුනිමාලි මදුරාවල, චතුර්ගා කරුණානායක සහ චාමිනී තිලංකා යන මහත්මීන් " දුම්කොළ භාවිතය පාලනය කිරීමේ වැඩසටහන: ප්‍රතිපත්ති ගැටළුව අවබෝධ කර ගැනීම: අවසන් අදියරේ සිටින්නේ කවුද?" නැමති මාතෘකාව යටතේ තවත් අධ්‍යයනයක් සිදු කළ අතර, ශ්‍රී ලංකාවේ දැනට සිටින දුම්පානය කරන්නන් සංඛ්‍යාව හඳුනා ගැනීම, සහ ඔවුන් තවමත් දුම්පානය කරන්නේ මන්ද යන්න සහ වඩාත්ම යෝග්‍ය ප්‍රතිපත්ති ප්‍රතිචාරය කෙරෙහි මෙයින් ඇතිවන ගම්‍යමානයන් මොනවාද යන්න අවබෝධ කර ගැනීම එම අධ්‍යයනයට ඇතුළත් විය.

නිශා අරුණතිලක, හරිණි වීරසේකර සහ චාමනී තිලංකා යන මහත්මීන් " දුම්කොළ භාවිතය පාලනය කිරීමේ වැඩසටහන: බදු නම්‍යතා ගණනය කිරීම සහ දුම්කොළ බදු සංශෝධන මඟින් බදු ආදායම කෙරෙහි ඇති කෙරෙන ගම්‍යමානයන් ඇගයීම" යන මාතෘකාව යටතේ අධ්‍යයනයක් සිදු කළහ. මෙම අධ්‍යයනය මඟින් දැනට පවතින දුම්පානය කිරීම අඩු කිරීම සඳහා සහ රජයේ ආදායම වැඩි කිරීම සඳහා ශ්‍රී ලංකාවේ වර්තමානයේ පවතින දුම්කොළ බදුවල ඵලදායීත්වය පිළිබඳ ඇගයීමක් සිදු කරන ලදී. දුම්වැටි සඳහා තිබෙන බදු ව්‍යුහය සරල කළ යුතු බවටත්, දුම්වැටි සඳහා වියදම් දැරීමට ඇති හැකියාව අඩු කිරීම පිණිස උද්දමනයට සමානුපාතිකව එම බදු අනුපාත වැඩි කළ යුතු බවටත් මෙම අධ්‍යයනය මඟින් නිර්දේශ කරන ලදී.

2019 ජනාධිපතිවරණය ආසන්නයේ තිබියදී ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය දුම්කොළ භාවිතය පාලනය කිරීම සම්බන්ධ ප්‍රතිපත්ති පිළිබඳව මෑත කාලීනව එම ආයතනය විසින් සිදු කරන ලද පර්යේෂණ පිළිබඳ තොරතුරු දුම්කොළ භාවිතය පාලනය කිරීම වෙනුවෙන් පෙනී සිටින කණ්ඩායම් සහ ප්‍රජා මූල සංවිධාන අතර බෙදා දීම පිණිස දුම්කොළ භාවිතය පාලනය කිරීමේ ප්‍රතිපත්ති ශක්තිමත් කිරීම පිළිබඳ වැඩමුළුවක් පවත්වන ලදි. දුම්කොළ භාවිතය පාලනය කිරීම සඳහා ශක්තිමත් ප්‍රතිපත්ති තිබීමේ අවශ්‍යතාවය, දුම්කොළ භාවිතය ප්‍රවර්ධනය කිරීමේ අවිධිමත් ක්‍රම නවතා දැමීම, දුම්කොළ කර්මාන්තය විසින් පතුරුවා හරිනු ලබන වැරදි තොරතුරු සැපයීම් සම්බන්ධයෙන් කටයුතු කිරීම, දුම්කොළ බදු සහ ප්‍රතිපත්ති, සහ දුම්කොළ භාවිතයෙහි සෞඛ්‍ය සහ සමාජ පිරිවැය වැනි ගැටළු මෙම වැඩමුළුවේදී අවධාරණය කරන ලදී. මත්පැන් සහ මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානය, සහ දුම්කොළ භාවිතයට විරෙහිව සටන් කිරීම සඳහා වන මධ්‍යස්ථානය මෙම වැඩමුළුවෙහි හවුල්කරුවන් වූහ. 2019 මැයි 31 වැනි දිනට යෙදුණු 'ලෝක දුම්වැටි විරෝධී දිනයේදී' එම දිනය සැමරීම සඳහා සහ දැනුවත්භාවය වැඩිදියුණු කිරීම සඳහා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂණ මඟින් සොයාගත් කරුණු ප්‍රදර්ශනය කෙරෙන පෝස්ටර් මාලාවක් සහිත සමාජ මාධ්‍ය ව්‍යාපාරයක් පවත්වන පවත්වන ලදී. තනි තනි පර්යේෂණ කණ්ඩායම් ද පර්යේෂණ මඟින් අනාවරණය කර ගත් කරුණු බෙදා ගැනීම සඳහා සාකච්ඡා පවත්වමින්, වැදගත් පාර්ශ්වකරුවන්, නිලධාරීන් සහ ප්‍රතිපත්ති සම්පාදකයින් සමඟ ජාලගත වූහ.

කාන්තාවන් සහ ශ්‍රමබලකාය

"රාත්‍රී කාලයේ සේවය කරන කාන්තාවන්" පිළිබඳව සිදු කරන ලද ඒකාබද්ධ අධ්‍යයනය සඳහා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය සහ වික්සත් රාජධානියේ වෝර්වික් විශ්වවිද්‍යාලය විසින් අරමුදල් සපයන ලදී. නිශා අරුණතිලක, අශානි අබයසේකර, චතුර්ගා කරුණානායක සහ දුලිනි ප්‍රනාන්දු යන මහත්මීන් (වෝර්වික් විශ්වවිද්‍යාලය නියෝජනය කරමින්) මෙම අධ්‍යයනය සිදු කළහ. ආයතනවල රාත්‍රී කාලයේ සේවය කිරීම සම්බන්ධ නියමයන්ට හා ප්‍රතිපත්ති හා පරිචයන්

අතර වර්තමානයේ පවතින හිඳැස්වලට ආමන්ත්‍රණය කිරීමට මෙම අධ්‍යයනය මගින් අරමුණු කරන ලදී. එමෙන්ම, සුරක්ෂිත සහ ඵලදායී රැකියා සඳහා ඇති අවස්ථා වැඩිදියුණු කිරීමේ අරමුණ ඇතිව මෙම අධ්‍යයනය මගින් කාන්තාවන් අභියෝගවලට දක්වන ප්‍රතිචාර, ඔවුන් ගන්නා ක්‍රියාමාර්ගවල ගම්‍යමාන සහ ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය සහ සුපිරි වෙළඳසැල් යන අංශවල රාත්‍රී කාලයේ සේවය කරන කාන්තාවන් පිළිබඳව සේවායෝජකයින්ගේ අවබෝධයන් පිළිබඳව අවධානය යොමු කරන ලදී. මෙම අධ්‍යයනය මගින් අනාවරණය කර ගත් කරුණු ඇතුළත් ධවල පත්‍රිකාවක් කම්කරු කොමසාරිස් ජෙනරාල් ආර්.පී.ඒ. විමලවීර මහතා සමග බෙදා ගන්නා ලදී.

ප්‍රකාශන

අධ්‍යාපන අමාත්‍යාංශයේ ඉල්ලීමකට අනුව, අශානි අබයසේකර මහත්මිය "ශ්‍රී ලංකාවේ 5 වැනි ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගය: සථලත්වය සහ අදාළත්වය ඇගයීම" නැමති අධ්‍යයනය (ජනවාරි) මගින් සොයාගත් කරුණු අවධාරණය කරමින් ප්‍රතිපත්ති සංක්ෂිප්තයක් සකස් කළාය. අශානි අබයසේකර මහත්මිය සහ නෙලූකා ගුණසේකර මහත්මිය සමකර්තෘත්වය දරමින් ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයෙහි, රැකියාවල හෝ පුහුණුවීම් වල නියැළී නොසිටින තරුණ තරුණියන් පිළිබඳව විමසා බැලෙන "ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයෙහි, රැකියාවල හෝ පුහුණුවීම් වල නියැළී නොසිටින තරුණ තරුණියන් (NEETs) : අධ්‍යාපනයෙහි, රැකියාවල හෝ පුහුණුවීම් වල නියැළී නොසිටින තරුණ තරුණියන් පිළිබඳ විශ්ලේෂණයක්" නැමති ලිපිය (ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ ශ්‍රමය සහ සංක්‍රමණය පිළිබඳ පර්යේෂණ මාලා අංක 200, මාර්තු) සම්පාදනය කළ අතර, එමගින් අධ්‍යාපනයෙහි, රැකියාවල හෝ පුහුණුවීම් වල නියැළී නොසිටින කණ්ඩායමට වැටීමෙහි සහ අධ්‍යාපනයෙහි, රැකියාවල හෝ පුහුණුවීම් වල නියැළී නොසිටින විශේෂිත උප කණ්ඩායම්වලට අයත් වීමෙහි තිබිය හැකි අවදානම් සාධක හඳුනා ගන්නා ලදී. තවද, අශානි අබයසේකර සහ නෙලූකා ගුණසේකර සමකර්තෘත්වය දරමින් සංවර්ධන ආර්ථිකවිද්‍යා සමාලෝචනය නැමති ප්‍රකාශනය සඳහා "අධ්‍යාපනයෙහි, රැකියාවල හෝ පුහුණුවීම් වල නියැළී නොසිටින තරුණ තරුණියන් පිළිබඳ නිශ්චායක: ශ්‍රී ලංකාවෙන් ලැබෙන සාක්ෂි" නැමති පරිච්ඡේදය රචනා කළහ. එමෙන්ම, "ශ්‍රී ලංකාව: ආර්ථිකයෙහි තත්ත්වය 2019" ප්‍රකාශනය සඳහා අශානි අබයසේකර මහත්මිය "ශ්‍රී ලංකාවේ අධ්‍යාපන අංශය: හතර වැනි කාර්මික විප්ලවය තුළ නැවත නිපුණතා ගොඩනැගීම" පිළිබඳ පරිච්ඡේදයක් ලිව්වාය.

ප්‍රියංකා ජයවර්ධන මහත්මිය සෞඛ්‍යය ආශ්‍රිත ගැටළු අවධාරණය කෙරෙන "ශ්‍රී ලංකාවේ පෝෂණය සඳහා රාජ්‍ය වියදම් සමාලෝචනය: පෝෂණය සඳහා රාජ්‍ය අරමුදල් සැපයීම ඇගයීම (2014 - 2018)" නැමති ලෝක බැංකු ප්‍රකාශනයෙහි සමකර්තෘ ලෙස කටයුතු කළ අතර, "ශ්‍රී ලංකාව: ආර්ථිකයෙහි තත්ත්වය 2019" ප්‍රකාශනය සඳහා "හතර වැනි කාර්මික විප්ලවය තුළ සෞඛ්‍ය රැකවණය" නැමති පරිච්ඡේදය ලිව්වාය.

දුම්කොළ භාවිතය පාලනය කිරීමේ වැඩසටහන යටතේ සුනිමලී මධුරාවල මහත්මිය "අවසන් අදියර හඳුනා ගැනීම: තවමත් දුම්පානය කරන්නේ කවුද?" නැමති ප්‍රතිපත්ති සංක්ෂිප්තයක් රචනා කළ අතර, වීම අධ්‍යයනය සඳහා KIVU ඉන්ටර්නැෂනල් සහ වික්සත් රාජධානියේ කැන්සර් රිසර්ච් යන සංවිධාන විසින් අරමුදල් සපයනු ලැබීය.

දුෂ්නි වීරකෝන් මහත්මිය සහ සිසිර ජයසූරිය මහතා විසින් සංස්කරණය කළ ප්‍රකාශනයක් වන පශ්චාත් ගැටුම් සංදර්භය තුළ සංවර්ධනයේදී දේශීය සහ අන්තර්ජාතික අභියෝග සහ අවස්ථා කළමනාකරණය කිරීම - ශ්‍රී ලංකාවෙන් උගත හැකි පාඩම්, ස්ප්‍රින්ජර්: සිංගප්පූරුව, සඳහා නිශා අරුණතිලක මහත්මිය "වඩා හොඳ රැකියා හරහා වඩා හොඳ ජීවිත සඳහා ආර්ථික පරිවර්තනයන්" නැමති මාතෘකාව යටතේ පරිච්ඡේදයක් ලිව්වාය. ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ ප්‍රමුඛතම ප්‍රකාශනය වන "ශ්‍රී ලංකාව: ආර්ථිකයෙහි තත්ත්වය 2019" සඳහා ස්වකීය දායකත්වය සපයා දෙමින් නිශා අරුණතිලක මහත්මිය "හතර වැනි කාර්මික විප්ලවය සහ ශ්‍රී ලංකාවේ රැකියාවල අනාගතය" පිළිබඳ පරිච්ඡේදයක් ද, සුනිමාලි මදුරාවල මහත්මිය "හතර වැනි කාර්මික විප්ලවය: ස්ත්‍රී පුරුෂ සමාජභාවය සඳහා අභියෝගයක්ද නැතහොත් අවස්ථාවක්ද" පිළිබඳ පරිච්ඡේදයක් ද, නිපුණි පෙරේරා මහත්මිය "හතර වැනි කාර්මික විප්ලවය සහ

ශ්‍රම බලකායෙහි සිටින කාන්තාවන්: ශ්‍රී ලංකාවේ ඇඟළුම් කර්මාන්තය" නැමති මාතෘකාව යටතේ ප්‍රතිපත්ති සංක්ෂිප්තයක් ද ලියූහ.

ප්‍රතිපත්ති නියැළීම්

කමිටු

ජාතික අධ්‍යාපන කොමිසමෙහි උසස් අධ්‍යාපනය පිළිබඳ ස්ථාවර කමිටුව, විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ පර්යේෂණ අධීක්ෂණ කමිටු, සහ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවෙහි ස්වරූපය පරිවර්තනය කිරීම පිළිබඳ උපදේශක කමිටු රැස්වීම් ආදියෙහි නිරතවීම ඇතුළු ප්‍රතිපත්ති කමිටු මාලාවක් හරහා නිශා ඇරුණතිලක මහත්මිය පර්යේෂණ යෙදවුම් සපයා දුන්නාය. තවද, ඒ මහත්මිය ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව නවීකරණය කිරීම පිණිස ගත යුතු ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම සඳහා වන උපදේශක කමිටුවට ද, ජාතික විද්‍යා පදනමේ ශ්‍රී ලංකාවේ සමාජ විද්‍යා පර්යේෂණ ශක්තිමත් කිරීම සඳහා වන කමිටුවට ද සහභාගී වූවාය. එමෙන් ම, ඩයලොග් අධ්‍යාපන පදනමේ භාරකරුවෙකු ලෙස ද ඒ මහත්මියව පත්කරනු ලැබුවාය.

ඉදිරිපත් කිරීම් සහ සාකච්ඡා මණ්ඩල

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂකයින් නිපුණතා සහ අධ්‍යාපනය සම්බන්ධ විවිධ ගැටළුවලට ආමන්ත්‍රණය කරමින් පහත සඳහන් වැඩසටහන් වලට සහභාගී වූහ:

- 'දකුණු ආසියාවේ ආර්ථික සංවර්ධනය' නැමති සමුළුවේදී බිලේෂා වීරරත්න මහත්මිය "බාන් ඇකඩම් විද්‍යුත්-ඉගෙනුම් විඩියෝ පාඩම් වලට ශ්‍රී ලංකාවේ ගණිත විෂයයෙහි සාධනය වැඩිදියුණු කළ හැකිද?" යන මාතෘකාව යටතේ ඉදිරිපත් කිරීමක් සිදු කළාය. ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය සහ මොනෑෂ් විශ්වවිද්‍යාලය කළුතර පැවති මෙම වැඩසටහන සංවිධානය කළේය. (ජනවාරි)
- අශානි අබයසේකර මහත්මිය ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය සහ මොනෑෂ් විශ්වවිද්‍යාලය විසින් කළුතරදී සංවිධානය කළ 'දකුණු ආසියාවේ ආර්ථික සංවර්ධනය' නැමති සමුළුවේදී (ජනවාරි) සහ දකුණු ආසියානු විශ්වවිද්‍යාලයේ සත්කාරකත්වයෙන් ඉන්දියාවේ නවදිල්ලි නුවරදී පවත්වන ලද "දකුණු ආසියාවේ ආර්ථික සංවර්ධනය" පිළිබඳ 5 වැනි අන්තර්ජාතික සමුළුවේදී (පෙබරවාරි) "ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයෙහි, රැකියාවල හෝ පුහුණු වල නිරතවී නොමැති තරුණයින්: අධ්‍යාපනයෙහි, රැකියාවල හෝ පුහුණුවීම් වල නිරතවී නොමැති තරුණ තරුණියන් පිළිබඳ විශ්ලේෂණයක්" පිළබඳ ඉදිරිපත් කිරීම් සිදු කළාය.
- අශානි අබයසේකර මහත්මිය ආර්ථික ආදර්ශකරණය සඳහා වන දකුණු ආසියානු ජාලය (SANEM) විසින් සංවිධානය කර ඩකා නුවර BRAC Centre Inn හෝටලයේදී පවත්වන ලද "දකුණු ආසියාවේ උප-ජාතික මට්ටමේදී අරමුදල් සපයාදීම් සහ ප්‍රදේශීය මට්ටමේ සේවා සපයා දීම්" පිළිබඳ හතර වැනි දකුණු ආසියානු ආර්ථික ජාල සමුළුවේදී "ශ්‍රී ලංකාවේ පාසල්වලට අරමුදල් සපයාදීම සඳහා ඇති සූත්‍ර" පිළිබඳ ඉදිරිපත් කිරීමක් සිදු කළාය. (සැප්තැම්බර්)
- අන්තර්ජාතික උසස් අධ්‍යාපන සමුළුවේදී නිශා අරුණතිලක මහත්මිය "උසස්



අධ්‍යාපනය සඳහා බඳවා ගැනීමේ පවතින හිදැස් සම්පූර්ණ කිරීම සඳහා උපාය මාර්ග - දකුණු සහ අග්නිදිග ආසියානු අත්දැකීම" යන තේමාව යටතේ පැවති සාකච්ඡා මණ්ඩලයකට සහභාගී වූවාය. කොළඹදී පැවති මෙම වැඩසටහනට ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනය විසින් සත්කාරකත්වය සපයන ලදී. (ඔක්තෝබර්)

ශ්‍රම වෙළඳ පොළ පිළිබඳ ගැටළු අවධාරණය කෙරෙන පර්යේෂණ ප්‍රචාරණය කිරීම විවිධ වැඩසටහන් හරහා සිදු කරන ලදී:

- නිශා අරුණතිලක මහත්මිය "අපනයන වලින් රැකියා වලට: දකුණු ආසියාවේ වෙළඳාමෙන් ලැබෙන ප්‍රතිලාභ වැඩිදියුණු කිරීම" පිළිබඳ පර්යේෂණයේ වාර්තාව එළිදැක්වීමේ වැඩසටහනෙහි සාකච්ඡා මණ්ඩල සාමාජිකාවක් ලෙස කටයුතු කළාය. කොළඹ පිහිටි ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේදී පැවති මෙම වැඩසටහන සඳහා ලෝක බැංකුව සහ ලෝක කම්කරු සංවිධානය විසින් සත්කාරකත්වය සපයන ලදී (පෙබරවාරි).
- නිශා අරුණතිලක මහත්මිය කාන්තාවන් සහ ශ්‍රම බලකාය සම්බන්ධ විවිධ ගැටළු ඉස්මතු කළ "සේවා නියුක්තිය පිළිබඳ කොටුම්පත් කර ඇති පනතෙහි තිබෙන ස්ත්‍රී-පුරුෂ සමාජභාව ගම්‍යමානයන්" පිළිබඳව වූ සාකච්ඡාව සඳහා සාකච්ඡා මණ්ඩල සාමාජිකාවක ලෙස සහභාගී වූවාය. කොළඹ දී පවත්වන ලද මෙම වැඩසටහන සඳහා කම්කරු සහ වෘත්තීය සමිති සබඳතා අමාත්‍යංශය විසින් සත්කාරකත්වය සපයා දෙන ලදී. (ජූලි)
- "වඩා හොඳ රැකියා උදෙසා ආර්ථිකයන් පරිවර්තනය කිරීම" නැමති තේමාව යටතේ පැවති WIDER සංවර්ධන සමුළුවේදී නිශා අරුණතිලක මහත්මිය "අඩු පුහුණු කාන්තාවන් ශ්‍රම බලකායට සහභාගී වීම ඉහළ නැංවීම" පිළිබඳ පත්‍රිකා ඉදිරිපත් කිරීමක් සිදු කළාය. තායිලන්තයේ බැංකොක් නුවර පැවති මෙම වැඩසටහන සඳහා එක්සත් ජාතීන්ගේ විශ්වවිද්‍යාලයේ සංවර්ධන ආර්ථික විද්‍යා පර්යේෂණ සඳහා වන ලෝක ආයතනය (UNU-WIDER) විසින් සත්කාරකත්වය සපයන ලදී. (සැප්තැම්බර්)
- ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ පැවති "කළමනාකරණ පර්යේෂකයින්ගේ හතරවැනි අන්තර්ක්ෂේත්‍ර සමුළුව" අවස්ථාවේදී රුවන් සමරවීර මහතා "සේවක අභිප්‍රේරණය තීරණය කෙරෙන සාධක: ශ්‍රී ලංකාවේ ප්‍රසිද්ධ ආයතනයක විධායක කාර්ය මණ්ඩලය සම්බන්ධ සිද්ධි අධ්‍යයනයක්" පිළිබඳ වෙබ්මුළුවක ඉදිරිපත් කිරීමක් සිදු කළේය. (ඔක්තෝබර්)

කොළඹ දී පැවති පෝෂණ PER ක්‍රියාකාරී කණ්ඩායම් උපදේශක වැඩමුළුවේදී ප්‍රියංකා ජයවර්ධන මහත්මිය "ශ්‍රී ලංකාවේ පෝෂණ අංශය සඳහා රාජ්‍ය අරමුදල් සැපයීම් ඇගයීම" පිළිබඳ අධ්‍යයනය මගින් අනාවරණය කර ගත් කරුණු ඉදිරිපත් කළාය. (ජූලි)

KIVU ඉන්ටර්නැෂනල් සංවිධානයෙහි සහ එකසත් රාජධානියේ කැන්සර් රිසර්ච් ආයතනයෙහි අරමුදල් සැපයීම යටතේ ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය විසින් ක්‍රියාත්මක කරනු ලබන දුම්කොළ භාවිතය පාලනය කිරීමේ වැඩසටහන යටතේ සුනිමාලි මදුරාවල මහත්මිය "දුම්කොළ භාවිතය පාලනය කිරීමේ අවශ්‍යතාවය, පිරිවැය සහ දුම්පානය පැතිර තිබීම" පිළිබඳ ඉදිරිපත් කිරීමක් සිදු කළ අතර, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පැවති පෙළඹවීමේ කණ්ඩායම්වල වැඩමුළුවේදී චතුර්ගා කරුණානායක මහත්මිය "දුම්කෝළ භාවිතය නවතා දැමීම: අත්හැරීම සඳහා උපකාර කිරීම" පිළිබඳ ඉදිරිපත් කිරීමක් සිදු කළාය. (නොවැම්බර්)

බ්ලොග් ලිපි

නිපුණතා සහ අධ්‍යාපනය පිළිබඳ අවධානය යොමු කරමින් අශානි අබයසේකර මහත්මිය ටෝකිං ඉකොනොමික්ස් සඟරාව සඳහා පහත සඳහන් මාතෘකා යටතේ බ්ලොග් ලිපි ලිව්වාය "ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයෙහි, රැකියාවල හෝ පුහුණුවීම්වල නිරත වී නොමැති පුද්ගලයින් සංඛ්‍යාව අඩු කිරීම: පාසලේ සිට රැකියාවට පහසුවෙන් සංක්‍රමණය වීය හැකි වීමේ අවශ්‍යතාවය" (ජනවාරි), "හතර වැනි කාර්මික විප්ලව යුගයේදී සුහුරු පංති කාමර ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයේ අනාගතය ද?"(සැප්තැම්බර්), සහ "හතර වැනි කාර්මික විප්ලවය තුළ ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයේ අනාගතය" (නොවැම්බර්). ප්‍රියංකා ජයවර්ධන මහත්මිය ගෝලීය සංවර්ධන ජාලයේ (GDN) බ්ලොග් අඩවිය සඳහා "ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය: ප්‍රවේශය පුළුල් කිරීම සහ නිපුණතා වැඩිදියුණු කිරීම" නැමති මාතෘකාව යටතේ ලිපියක් ලිව්වාය. සුනිමලී මධුරාවල මහත්මිය ශ්‍රී ලංකා එක්ස්පෝර්ටර් සඟරාව (103 වැනි කලාපය - 2019 ජනවාරි-මාර්තු) සඳහා "මූල්‍ය සාක්ෂරතාවය: වර්තමානයේ ඉතා වැදගත් අවශ්‍යතාවයක්' යන මාතෘකාව යටතේ ලිපියක් ලිව්වාය.

ශ්‍රම වෙළඳපොළ පිළිබඳ ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂණ සොයාගැනීම් ප්‍රචාරණය කරමින්, ප්‍රථම සමන් කැලේගම අනුස්මරණ පර්යේෂණ ප්‍රදානය දිනාගත් තිසලි ද සිල්වා මහත්මිය නිශා අරුණතිලක මහත්මිය සමග සම කර්තෘත්වය දරමින් "තරුණයින්ට ත්‍රිරෝද රථ රැකියාව සඳහා ඉඩ දෙනේනේද, නො දෙන්නේද - ශ්‍රී ලංකාවේ ත්‍රිරෝද රථ වෙළඳ පොළ සඳහා ඇති ප්‍රවේශය නියාමනය කළ යුතුද?" නැමති බ්ලොග් ලිපිය ලිව්වාය (ජනවාරි). නිශා අරුණතිලක මහත්මිය "ශ්‍රී ලංකාවේ රැකියාවල ගුණාත්මකභාවය ඉහළ නැංවීම: අපනයන වැඩිදියුණු කිරීම සියලු ප්‍රශ්න වලට විසඳුම විය හැකිද?" යන මාතෘකාව යටතේ ටෝකිං ඉකොනොමික්ස් සඟරාවට ලිපියක් දායක කළාය (අප්‍රේල්). චතුර්ගා කරුණානායක මහත්මිය සමග සම කර්තෘත්වය දරමින් නිශා අරුණතිලක මහත්මිය "සියලු යතුරු ලේඛකයින් කොහි ගොසින්ද? තාක්ෂණය සහ ශ්‍රී ලංකාවේ වෙනස් වෙමින් පවතින රැකියා පැතිකඩ" නැමති මාතෘකාව යටතේ ලිපියක් රචනා කළාය (ජූනි). අශානි අභයසේකර මහත්මිය "නව වැඩ ලෝකයක අභියෝග ජය ගැනීම: හතර වැනි කාර්මික විප්ලවය සඳහා දකුණු ආසියාව කෙතෙක් දුරට සූදානම්ද?" යන මාතෘකාව යටතේ ලිපියක් ලිව්වාය (ඔක්තෝබර්). නිශා අරුණතිලක මහත්මිය මනෝජ් තිබ්බොටුවාව මහතා සහ ප්‍රියන්කා ජයවර්ධන මහත්මිය සමග සම කර්තෘත්වය දරන "තේ සහ අනුකම්පාව ප්‍රමාණවත් නොවන විට ..... : ශ්‍රී ලංකාවේ වැවිලි අංශයේ කම්කරුවන් සඳහා පීවත් වීමට සරිලන වැටුපක්" පිළිබඳ ලිපියක් සම්පාදනය කළාය (දෙසැම්බර්).

ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා සම්බන්ධ ගැටළු සාකච්ඡා කරමින් සුනිමලී මදුරාවල මහත්මිය ටෝකිං ඉකොනොමික්ස් සඟරාව සඳහා "ව්‍යසන අවස්ථාවලදී කාන්තාවන්: ශ්‍රී ලංකාවේ ආපදා කළමනාකරණයේ ස්ත්‍රී-පුරුෂ සමාජභාව මානයන්" (ජනවාරි) සහ " ශ්‍රී ලාංකික කාන්තාවන්ට වඩා හොඳ රැකියා හරහා වඩා ඉහළ සමාජ ආරක්ෂණයක්: තාක්ෂණයෙහි සහ නව්‍යකරණයෙහි භූමිකාව" (මාර්තු) නැමති ලිපි සම්පාදනය කළාය.

ටෝකිං ඉකොනොමික්ස් බ්ලොග් අඩවිය සඳහා ලියන ලද සියලුම ලිපි ප්‍රමුඛ පෙළේ පුවත්පත් සහ සමාජ මාධ්‍ය වේදිකාවල පළ කරන ලදී.

මාධ්‍ය

"ශ්‍රී ලංකාවේ STEM අධ්‍යාපනයේ වැදගත්කම" සාකච්ඡා කිරීම පිණිස නිශා අරුණතිලක මහත්මිය TV1 රූපවාහිනී නාලිකාවේ විකාශය කරන ලද Biz in Focus වැඩසටහනට සහභාගී වූවාය (සැප්තැම්බර්).

දරිද්‍රතාවය සහ සමාජ සුභසාධනය



පසුගිය දශකය පුරා දරිද්‍රතාවය අඩු කිරීමේදී ශ්‍රී ලංකාව අත්කර ගෙන ඇති ප්‍රගතිය හමුවේ වුව අසමානාත්මතාවය සහ අවදානම්සහගත භාවය දැඩි අවධානය යොමු කළ යුතු ගැටළු ලෙස පවතී. ඉහළ මට්ටමක පවතින ආදායම් විෂමතාවයට අමතරව, අධ්‍යාපනය, සෞඛ්‍යය, ජලය සහ සනීපාරක්ෂාව, සහ මූල්‍ය සේවා වැනි මූලික සේවා වෙත ප්‍රවේශයට අදාළව ද අසමානතා පවතී. දරිද්‍රතාවයට, අසමානාත්මතාවයට සහ අවදානම්සහගත භාවයට ආමන්ත්‍රණය කිරීම වැදගත් ප්‍රතිපත්ති ප්‍රමුඛතාවයන් ලෙස පවතින අතරෙහි රජය 2030 වර්ෂය වන විට තිරසර සංවර්ධන අරමුණු 17 සාක්ෂාත් කර ගැනීමට ද කැපවී සිටියි. මෙම සංදර්භය තුළ, දරිද්‍රතාවය සහ සමාජ සුභසාධනය පිළිබඳ ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි පර්යේෂණ මගින් දරිද්‍රතාවය, අසමානාත්මතාවය, තිරසර සංවර්ධන අරමුණු, සමාජ ආරක්ෂණය සහ මූල්‍ය අන්තර්කරණය ඇතුළු ක්ෂේත්‍ර ගණනාවක් කෙරෙහි අවධානය යොමු කර ඇත.

තිරසර සංවර්ධන අරමුණු



ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ දරිද්‍රතාවය සහ සමාජ සුභසාධනය සම්බන්ධ පර්යේෂණ කණ්ඩායම තිරසර සංවර්ධන අරමුණු හා සම්බන්ධ පර්යේෂණ ගණනාවක් සිදු කළහ. ගංගා තිලකරත්න මහත්මිය සහ චින්තනී සූරියමුදලි මහත්මිය ශ්‍රී ලංකාවේ තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමට අමතර වශයෙන් දකුණු ආසියාවේ කලාපීය සහයෝගීතාවය සඳහා වන අවකාශය විමසා බැලෙන "දකුණු ආසියාව සඳහා තිරසර සංවර්ධන අරමුණු අර්ථ නිරූපණය කිරීම: කලාපීය කාර්ය රාමුවක් සෙවීම" නැමති අධ්‍යයනය සිදු කළහ. මෙම පර්යේෂණ අධ්‍යයනය මගින් දේශගුණය ආරක්ෂා කර ගැනීමේ ක්‍රියාමාර්ග, බලශක්තිය, ආහාර සුරක්ෂිතතාවය, යෝග්‍ය රැකියා සහ ආර්ථික වර්ධනය ඇතුළු ක්ෂේත්‍ර ගණනාවක කලාපීය සහයෝගීතාවය සඳහා වන තිරසර සංවර්ධන අරමුණු ප්‍රමුඛතා හඳුනාගන්නා ලද අතර, ශ්‍රී ලංකාව තුළ තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම ප්‍රවර්ධනය කිරීම සඳහා වන කලාපීය ක්‍රමවේද සහ උපකරණ පිළිබඳව සාකච්ඡා කරන ලදී. තවද, එම අධ්‍යයනය මගින් ශ්‍රී ලංකාවේ තිරසර සංවර්ධන අරමුණුවල තත්ත්වය විමසා බලන ලද අතර, තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා ඇති අභියෝග සාකච්ඡා කරන ලදී. ආසියා පැසිෆික් කලාපය සඳහා වන එක්සත් ජාතීන්ගේ ආර්ථික සහ සමාජ කොමිසම (UNESCAP) විසින් මෙම අධ්‍යයනය සඳහා අරමුදල් සපයන ලදී.

එයට අමතරව, ගංගා තිලකරත්න, නිපුනි පෙරේරා සහ ජනනි පෙරේරා යන මහත්මීන් විසින් "තිරසර සංවර්ධන අරමුණු උදෙසා ඒකාබද්ධව එක් තීරයක් එක් මාවතක් ගොඩනැගීම සඳහා ජාතික ප්‍රතිපත්ති ධාරිතා ශක්තිමත් කිරීම" පිළිබඳ අධ්‍යයනයක් සිදු කරන ලදී. එක් තීරයක් එක් මාවතක් වැඩසටහන සහ තිරසර සංවර්ධන අරමුණු අතර විභව්‍ය සම්බන්ධතා අවබෝධ කර ගැනීම මෙම අධ්‍යයනයේ අරමුණ විය. එක් තීරයක් - එක් මාවතක් වැඩසටහන මගින් හවුල්කාර රටවල වැදගත් සමාජ-ආර්ථික බලපෑම් වලට තුඩු දිය හැකි, ප්‍රතිපත්ති සම්බන්ධීකරණය, පහසුකම් සම්බන්ධකතාවය, වෙළඳාම, මූල්‍ය ඒකාබද්ධතාවය සහ ජනතාව-ජනතාව අතර සම්බන්ධකතාවය යන ප්‍රධාන සහයෝගීතා ප්‍රමුඛතා පහ හරහා කලාප / රටවල් අතර අන්තර්-සම්බන්ධකතාවය වැඩි දියුණු කිරීමට අරමුණු කරයි. කෙසේ වෙතත්, එමගින් විවිධ අහිතකර ගම්‍යමානයන් ද ඇති කළ හැකිය. මෙම සන්දර්භය තුළ, මෙම පර්යේෂණය මගින් ශ්‍රී ලංකාවේ ඇති එක් තීරයක් - එක් මාවතක් වැඩසටහන ආශ්‍රිත විය හැකි ව්‍යාපෘති හා ක්‍රියාකාරකම් හඳුනා ගැනීමට සහ තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම කෙරෙහි එහි ඇති විභව්‍ය සම්බන්ධතා/බලපෑම ගවේෂණය කිරීමට ප්‍රයත්න දරන ලදී. එක්සත් ජාතීන්ගේ ආර්ථික හා සමාජ කටයුතු දෙපාර්තමේන්තුව (UNDESA) විසින් මෙම අධ්‍යයනයට අරමුදල් සපයන ලදී.

ප්‍රකාශන

දරිද්‍රතාවය සහ අසමානතාවය සම්බන්ධ ගැටළු අවධාරණය කළ ගංගා තිලකරත්න මහත්මිය, පශ්චාත් ගැටුම් සංදර්භය තුළ සංවර්ධනයේදී දේශීය හා අන්තර්ජාතික අභියෝග සහ අවස්ථා කළමනාකරණය කිරීම පිළිබඳ දුෂ්නි වීරකෝන් මහත්මිය සහ සිසිර ජයසූරිය මහතා විසින් සංස්කරණය කර, සිංගප්පූරුවේ ස්ප්‍රින්ජර් ප්‍රකාශන විසින් ප්‍රකාශයට පත් කරන ලද ග්‍රන්ථය සඳහා "පශ්චාත් ගැටුම් සංදර්භය තුළ ශ්‍රී ලංකාවේ සමානාත්මතාවය ළඟා කර ගැනීම" පිළිබඳ පරිච්ඡේදයක් ලිව්වාය. තවද, රුවන් සමරවීර මහතා පී.එම්.එම්. ප්‍රනාන්දු, පී.එච්.ටී. කුමාර සහ ධර්මදාස යන මහත්වරුන් සමග එක්ව ශ්‍රී ලංකා ජනගහන අධ්‍යයන සඟරාව, 20(2) සඳහා "ශ්‍රී ලංකාවේ බදුල්ල දිස්ත්‍රික්කයේ වතු ආශ්‍රිත ජනගහනය අතර පවතින බහුමාන දරිද්‍රතාවය" පිළිබඳ ලිපියක් ලිව්වේය.

චින්තානි සූරියමුදලි සහ අනර්කලී පෙරේරා යන මහත්මීන් සමග එක්ව ගංගා තිලකරත්න මහත්මිය "විශ්‍රාම ගැනීමේ වයසෙන් ඔබ්බට වැඩ කිරීම: ශ්‍රී ලංකාවේ වැඩිහිටි ශ්‍රම බලකායේ සහභාගීත්වයේ රටා සහ නිශ්චායක" නැමති මාතෘකාව යටතේ ප්‍රකාශනයක් එළි දැක්වූවාය (ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ දරිද්‍රතාවය, ජන විකාශය සහ සමාජ සුභසාධනය පිළිබඳ පර්යේෂණ මාලා අංක 200, මැයි). මෙම අධ්‍යයනය මගින් සමාජ ආරක්ෂණය හා සම්බන්ධ බලපෑම් පිළිබඳ අවධානය යොමු කරන ලදී.

එමෙන්ම, ගංගා තිලකරත්න මහත්මිය "ශ්‍රී ලංකාව: ආර්ථිකයෙහි තත්වය 2019" සඟරාව සඳහා මූල්‍ය අන්තර්කරණය හා සම්බන්ධ ගැටළු අවධාරණය කරමින්

"හතර වැනි කාර්මික විප්ලවය තුළ ශ්‍රී ලංකාවේ මූල්‍ය අන්තර්කරණය: ශ්‍රී ලංකාව සඳහා ඇති අවස්ථා සහ අභියෝග" යන මාතෘකාව යටතේ පරිච්ඡේදයක් ද ලිව්වාය.

ගංගා තිලකරත්න මහත්මිය සහ චින්තනී සූරිය මුදලි මහත්මිය ශ්‍රී ලංකාවේ තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධ ගැටළු අවධාරණය කරමින් මාර්තු මාසයේදී ආසියා පැසිෆික් කලාපය සඳහා වන එක්සත් ජාතීන්ගේ ආර්ථික සහ සමාජ කොමිසමෙහි දකුණු හා නිරිතදිග ආසියා කාර්යාලයෙහි සංවර්ධන පර්යේෂණ පත්‍රිකා මාලාවෙහි "දකුණු ආසියාව සඳහා තිරසර සංවර්ධන අරමුණු අර්ථ නිරූපණය කිරීම: කලාපීය කාර්ය රාමුවක් සෙවීම (ශ්‍රී ලංකාව පිළිබඳ තත්ත්වය)" නැමති පර්යේෂණ පත්‍රිකාව පළ කළහ. ජනනි පෙරේරා මහත්මිය සමග එක්ව ගංගා තිලකරත්න මහත්මිය "හතර වැනි කාර්මික විප්ලවය තුළ දකුණු ආසියාව" පිළිබඳ ට්‍රේඩ් ඉන්සයිට් නැමති සඟරාව 2019, 15(4) සඳහා "හතර වැනි කාර්මික විප්ලවය තුළ තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම" නැමති මාතෘකාව යටතේ ලිපියක් ලිව්වාය.

විශේෂ අවස්ථා

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය එක්සත් ජාතීන්ගේ ආර්ථික හා සමාජ කටයුතු දෙපාර්තමේන්තුව (UNDESA) සමග එක්ව "තිරසර සංවර්ධන අරමුණු උදෙසා ඒකාබද්ධව එක් තීරයක් - එක් මාවතක් ගොඩනැගීම" යන තේමාව යටතේ ජාතික උපදේශක වැඩමුළුවක් සංවිධානය කරන ලද අතර (අගෝස්තු), එහිදී ගංගා තිලකරත්න මහත්මිය "එක් තීරයක් - එක් මාවතක් වැඩසටහන සහ තිරසර සංවර්ධන අරමුණු: විභව්‍ය සම්බන්ධතා, අවස්ථා සහ අභියෝග" පිළිබඳ ඉදිරිපත් කිරීමක් සිදු කළාය.

ප්‍රතිපත්ති නියැළීම්

ඉදිරිපත් කිරීම් සහ සාකච්ඡා මණ්ඩල

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂකයින් විවිධ වැඩසටහන් සහ සංසද වලදී සමාජ ආරක්ෂණය පිළිබඳ ගැටළු වලට ආමන්ත්‍රණය කරමින් ඉදිරිපත් කිරීම් සිදු කළහ:

- "දකුණු ආසියාවේ ඉස්මතු වෙමින් පවතින ගෝලීය අභියෝග සහ සංවර්ධන උපායමාර්ග" යන තේමාව යටතේ පැවති ආර්ථික ආදර්ශකරණය පිළිබඳ දකුණු ආසියානු ජාල (SANEM) - ලෝක බැංකු තුන් වැනි උතුරු ඇමරිකානු සාකච්ඡා සංසදයේදී ගංගා තිලකරත්න මහත්මිය "විශ්‍රාම ගන්නා වයසෙන් ඔබ්බට වැඩ කිරීම: ශ්‍රී ලංකාවේ වැඩිහිටි ශ්‍රම බලකායෙහි සහභාගීත්වයේ රටා සහ නිශ්චායක" යන මාතෘකාව යටතේ පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කළාය. ඇමරිකා එක්සත් ජනපදයේ වොෂිංටන් ඩි.සී. හි පිහිටි ලෝක බැංකු මූලස්ථානයේ මෙම වැඩසටහන පවත්වන ලදී (ජූලි).
- "විශ්‍රාම වැටුප් ආවරණයේ අමතර පුළුල් කිරීමේ වෙනස්වීම සහ සැලසුම් පිළිබඳ ප්‍රවනතා" පිළිබඳ ආසියා පැසිෆික් කලාපයේ 14 වැනි විශ්‍රාම වැටුප් පිළිබඳ විශේෂඥයින්ගේ රැස්වීමේදී අශානි අබයසේකර මහත්මිය "ශ්‍රී ලංකාවේ විශ්‍රාම වැටුප් ආවරණය" පිළිබඳ ඉදිරිපත් කිරීමක් සිදු කළාය. දකුණු කොරියාවේදී පවත්වන ලද මෙම වැඩසටහන සඳහා ආර්ථික සහයෝගීතාවය සහ සංවර්ධනය සඳහා වූ සංවිධානය (OECD), කොරියානු ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් සත්කාරකත්වය සපයන ලදී (ජූනි).
- නිශා අරුණතිලක මහත්මිය "අවුරුදු 55 දී විශ්‍රාම ගැනීම ප්‍රතික්ෂේප කිරීම" පිළිබඳ සාකච්ඡා සංසදයේ සාකච්ඡා මණ්ඩල සාමාජිකාවක් ලෙස සහභාගී වූවාය. කොළඹ පැවති මෙම වැඩසටහන ශ්‍රී ලංකා ජාතික මානව සම්පත් සංවර්ධන සභාව විසින් සංවිධානය කරන ලදී (නොවැම්බර්). ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂකයින් තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධ විවිධ ගැටළු අවධාරණය කරමින් පහත සඳහන් වැඩසටහන් වලට සහභාගී වී ඔවුන්ගේ පර්යේෂණ සොයාගැනීම් ඉදිරිපත් කළහ:
- "තිරසර සංවර්ධනය හා ලෝක ආර්ථිකය" පිළිබඳ ජාත්‍යන්තර සමුළුවේදී ගංගා තිලකරත්න මහත්මිය "ශ්‍රී ලංකාවේ වර්ධනය වේගවත් කිරීම සහ සමාජ අන්තර්කරණය" පිළිබඳ ඉදිරිපත් කිරීමක් සිදු කළාය. ඉන්දියාවේ නවදිල්ලි නුවර පැවති මෙම වැඩසටහන සඳහා දිල්ලි විශ්වවිද්‍යාලයේ ජන්කි දේවි අනුස්මරණ විද්‍යාලය විසින් සත්කාරකත්වය සපයන ලදී (පෙබරවාරි).



- "දකුණු ආසියාව සඳහා තිරසර සංවර්ධන අරමුණු අර්ථ නිරූපණය කිරීම: කලාපීය කාර්ය රාමුවක් සෙවීම" පිළිබඳ වැඩමුළුවේදී ගංගා තිලකරත්න මහත්මිය "ශ්‍රී ලංකාවේ තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීමේදී දකුණු ආසියානු කලාපීය සහයෝගීතාවයෙහි වැදගත්කම" පිළිබඳ ඉදිරිපත් කිරීමක් සිදු කළාය. ආසියා පැසිෆික් කලාපය සඳහා වන එක්සත් ජාතීන්ගේ ආර්ථික සහ සමාජ කොමිසමෙහි දකුණු සහ නිරිතදිග ආසියානු උපකලාපීය කාර්යාලය (UNESCAP-SSW) විසින් සංවිධානය කරන ලද මෙම වැඩමුළුව තායිලන්තයේ බැංකොක් නුවර දී පවත්වන ලදී (මාර්තු).
- සුනිමලී මදුරවල මහත්මිය "තිරසර සංවර්ධන අරමුණ 5, ස්වේච්ඡා ජාතික සමාලෝචනය සහ ශ්‍රී ලංකාවේ තත්ත්වය" යන මාතෘකාව යටතේ ඉදිරිපත් කිරීමක් සිදු කළ අතර "ජනතාව සවිබල ගැන්වීම සඳහා දැනුම බෙදාගැනීම හා අන්තර්කරණය සහ සමානාත්මතාවය සහතික කිරීම - ශ්‍රී ලංකාවේ තිරසර අරමුණ 5 ක්‍රියාත්මක වීම අධීක්ෂණය කිරීම" නැමති වැඩමුළුවේ සාකච්ඡා මණ්ඩල සාමාජිකාවක ලෙස කටයුතු කළාය. කොළඹ පැවති මෙම වැඩසටහන කාන්තා පර්යේෂණ කේන්ද්‍රය (CENWOR) විසින් සංවිධානය කරන ලදී (ජූනි).
- "ආසියානු ආර්ථිකයන්හි තිරසර සංවර්ධන අරමුණු කෙරෙහි එක් තීරයක් - එක් මාවතක් වැඩසටහනෙහි විභව්‍ය බලපෑම තක්සේරු කිරීම" යන මාතෘකාව යටතේ පැවති කලාපීය වැඩමුළුවේදී ගංගා තිලකරත්න මහත්මිය "එක් තීරයක් - එක් මාවතක් වැඩසටහන සහ ශ්‍රී ලංකාවේ තිරසර සංවර්ධන අරමුණු" පිළිබඳ ඉදිරිපත් කිරීමක් සිදු කළාය. තායිලන්තයේ බැංකොක් නුවර පැවති මෙම වැඩසටහන එක්සත් ජාතීන්ගේ ආර්ථික හා සමාජ කටයුතු දෙපාර්තමේන්තුව (UNDESA) විසින් සංවිධානය කරන ලදී (සැප්තැම්බර්).
- කොළඹ දී පැවති "දකුණු ආසියානු ආර්ථික සමුළුව" අවස්ථාවේදී නිශා අරුණතිලක මහත්මිය "වර්ධනය සහ සමානාත්මතාවය - හතර වැනි කාර්මික විප්ලවය තුළ දකුණු ආසියාවේ තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම" යන මාතෘකාව යටතේ පැවති පූර්ණ සැසිවාරයේ සාකච්ඡා මණ්ඩල සාමාජිකාවක ලෙස සහභාගී වූවාය (සැප්තැම්බර්).
- ඉන්දියාවේ නවදිල්ලි නුවර පැවති "තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමට උපකාරී වීම පිණිස ප්‍රතිපත්ති විශ්ලේෂණය ශක්තිමත් කිරීම" පිළිබඳ වූ ආසියා පැසිෆික් කලාපය සඳහා වන එක්සත් ජාතීන්ගේ ආර්ථික සහ සමාජ කොමිසමේ :ඔහ්ෂ්ක්ජ* සමුළුවේදී ගංගා තිලකරත්න මහත්මිය "බුද්ධි මණ්ඩල සම්බන්ධ ශ්‍රී ලංකාවේ අත්දැකීම්" පිළිබඳ ඉදිරිපත් කිරීමක් සිදු කළාය (නොවැම්බර්).
- "දකුණු ආසියාවේ තිරසර සංවර්ධනය සඳහා කලාපීය සහයෝගීතාවයේ විභවය උපයෝගී කර ගැනීම පිළිබඳ කලාපීය ප්‍රතිපත්ති සංවාදය" නැමති සැසියේ දී දුෂ්නි වීරකෝන් මහත්මිය සාකච්ඡා මණ්ඩල සාමාජිකාවක ලෙස සහභාගී වූවාය. ඉන්දියාවේ නවදිල්ලි නුවර පැවති "තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමට උපකාරී වීම පිණිස ප්‍රතිපත්ති විශ්ලේෂණය ශක්තිමත් කිරීම" පිළිබඳ වූ මෙම සමුළුවට ආසියා පැසිෆික් කලාපය සඳහා වන එක්සත් ජාතීන්ගේ ආර්ථික සහ සමාජ කොමිසම :ඔහ්ෂ්ක්ජ* විසින් සත්කාරකත්වය සපයන ලදී (නොවැම්බර්).
- ඉන්දුනීසියාවේ ජකර්තා නුවර පැවති "ගෝලීය තිරසර සංවර්ධන වාර්තාව - ආසියා පැසිෆික් කලාපයේ තිරසර සංවර්ධනය වේගවත් කිරීම සඳහා ගම්‍යමානයන්" පිළිබඳ වැඩමුළුවේදී මනෝජ් තිබ්බොටුවාව සහ අතුල සේනාරත්න යන මහත්වරුන් "ගෝලීය තිරසර සංවර්ධන වාර්තාව" මගින් සොයා ගෙන ඇති කරුණු ශ්‍රී ලංකාවේ ප්‍රතිපත්ති සම්පාදකයින් සහ අනෙකුත් පාර්ශවකරුවන් සඳහා මාර්ගෝපදේශයක් බවට පරිවර්තනය කිරීමේ විවිධ ක්‍රම සාකච්ඡා කළහ (නොවැම්බර්).
- "තිරසර සංවර්ධන අරමුණු පිළිබඳ තුන් වැනි දකුණු ආසියානු සංසදය"



අවස්ථාවේදී ගංගා තිලකරත්න මහත්මිය "කිසිවෙකු හැර දමා නොයෑම - තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා ප්‍රගතිය වේගවත් කිරීම සඳහා වන ආසියා-පැසිෆික් මාර්ග සිතියමේ සහයෝගීතාවයෙහි ප්‍රමුඛතා ක්ෂේත්‍ර" පිළිබඳ සැසියේ සාකච්ඡා මණ්ඩල සාමාජිකාවක ලෙස සහභාගී වූවාය. බංග්ලාදේශයේ ඩකා නුවර පැවති මෙම වැඩසටහනට ආසියා පැසිෆික් කලාපය සඳහා වන එක්සත් ජාතීන්ගේ ආර්ථික සහ සමාජ කොමිසම (UNESCAP) විසින් සත්කාරකත්වය සපයන ලදී (දෙසැම්බර්).

- "දකුණු ආසියාවේ තිරසර සංවර්ධනය සඳහා කලාපීය සහයෝගීතාව" පිළිබඳ ප්‍රතිපත්ති සංවාදයේදී ගංගා තිලකරත්න මහත්මිය "දකුණු ආසියාවේ තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා බුද්ධි මණ්ඩලවල සහයෝගීතාව" නැමති සැසියේ සාකච්ඡා මණ්ඩල සාමාජිකාවක ලෙස සහභාගී වූවාය. බංග්ලාදේශයේ ඩකා නුවර පැවති මෙම වැඩසටහන සඳහා ආසියා පැසිෆික් කලාපය සඳහා වන එක්සත් ජාතීන්ගේ ආර්ථික සහ සමාජ කොමිසම :ඹහදීක්ජ* විසින් සත්කාරකත්වය සපයන ලදී (දෙසැම්බර්).
- පාකිස්තානයේ පැවති "22 වැනි තිරසර සංවර්ධන සමුළුවේ දී" රුවන් සිරිවර්ධන මහතා "තිරසර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා දකුණු ආසියාවේ කලාපීය සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීම" පිළිබඳ ඉදිරිපත් කිරීමක් සිදු කළේය (දෙසැම්බර්).



බ්ලොග් ලිපි

තිරසර සංවර්ධන අරමුණු ආශ්‍රිත ගැටළු අවධාරණය කරමින් ගංගා තිලකරත්න මහත්මිය සෙන්කියැන් හුවැන්ග් සහ දෙෂාල් ද මෙල් සමග එක්ව ආසියා පැසිෆික් කලාපය සඳහා වන එක්සත් ජාතීන්ගේ ආර්ථික සහ සමාජ කොමිසම (UNESCAP) සඳහා "තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම සහ අයවැයකරණය: ශ්‍රී ලංකාවේ ප්‍රයත්නයන් සහ අභියෝග" පිළිබඳ බ්ලොග් ලිපියක් ද (අගෝස්තු), සුනිමලී මධුරාවල මහත්මිය ටෝකිං ඉකොනොමික්ස් සඟරාව සඳහා "වර්ධනය සහ සාධාරණත්වය: හතර වැනි කාර්මික විප්ලවය තුළ දකුණු ආසියාවේ තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම" පිළිබඳ ලිපියක් ද (ඔක්තෝබර්) ලියූහ.
විමල් නානායක්කාර මහතා දිළිඳුකම හා සමානාත්මතාවය සම්බන්ධ ගැටළු අවධාරණය කරමින් ටෝකිං ඉකොනොමික්ස් සඟරාව සඳහා "ශ්‍රී ලංකාවේ දිළිඳුකම තුරන් කිරීම: දිළිඳුකමෙහි මිනුම් පුළුල්ව විමසා බලන්න!" යන මාතෘකාව යටතේ ද (මාර්තු), "සෙවණැලි වල සැඟවී සිටීම: ශ්‍රී ලංකාවේ බහුමාන දරිද්‍රතාව පිළිබඳ සමීප බැල්මක්" යන මාතෘකාව යටතේ ද (ජූනි) ලිපි සම්පාදනය කළේය.



කෘෂිකර්මාන්තය සහ කෘෂි ව්‍යාපාර සංවර්ධනය

කෘෂිකර්මාන්තය සහ කෘෂි ව්‍යාපාර සංවර්ධනය පිළිබඳ ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂණ මගින් සාගින්න තුරන් කිරීම සහ ආහාර සුරක්ෂිතතාවය ළඟා කර ගැනීම, කෘෂිකර්මාන්තයේ ඵලදායිතාව තුළින් ගොවිඵල ආදායම වැඩිදියුණු කිරීම සහ තිරසර අගය දාම තුළින් ග්‍රාමීය අංශය වැඩිදියුණු කිරීම යන අරමුණු ඇතිව ඵලදායීත්වය, ආහාර සුරක්ෂිතතාවය සහ කෘෂි ව්‍යාපාර අගය දාම වලට අදාළව කෘෂිකර්මාන්ත අංශය මුහුණ දෙන අභියෝග විමසා බලයි. තවද, රටෙහි සමස්ත කෘෂිකර්මාන්ත අංශයට බලපාන ආයතන පිළිබඳ සීමාවන්ට සහ ප්‍රතිපත්ති හා නියාමන පරිසරයට ආමන්ත්‍රණය කිරීම ද මෙයට ඇතුළත් වේ.

කෘෂිකර්මාන්තයේ ඵලදායීත්වය



ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්ත අංශය අඩු ඵලදායිතාවයෙන් පීඩාවට පත්ව තිබෙන අතර එය ආහාර අනාරක්ෂිතභාවයට සහ දරිද්‍රතාවයට හේතු වී තිබේ. කෘෂිකර්මාන්තයේ ඵලදායිතාවයට හා ඒ ආශ්‍රිත ගැටළුවලට ආමන්ත්‍රණය කිරීම සඳහා මනෝජ් තිබ්බොටුවාව මහතා සහ නිමේෂා දිසානායක මහත්මිය අතුල සේනරත්න සහ රුවන් සමරවීර යන මහත්වරුන් සමග එක්ව "ශ්‍රී ලංකාවේ වතු නොවන කෘෂිකර්මාන්තයේ ලාභදායීත්වය විශ්ලේෂණය කිරීම" නැමති මාතෘකාව යටතේ අධ්‍යයනයක් සිදු කළහ. විශ්ලේෂණ කාර්යරාමුවක්, එනම් ප්‍රතිපත්ති විශ්ලේෂණ න්‍යාසයක් (PAM) සකස් කිරීම සහ රජයේ මැදිහත්වීම් මට්ටම ද සමඟ, සංකලිත ආකාරයකට දේශීය කෘෂිකර්මාන්තයේ ලාභදායීත්වය, කාර්යක්ෂමතාවය සහ තරඟකාරිත්වය ඇගයීම මෙම අධ්‍යයනයෙහි අරමුණ විය. මෙම ව්‍යාපෘතිය සඳහා ලෝක බැංකුව විසින් අරමුදල් සපයන ලදී.

මනෝජ් තිබ්බොටුවාව, අතුල සේනරත්න, නිශා අරුණතිලක, බිලේෂා වීරරත්න සහ හරිනි වීරසේකර යන මහත්ම මහත්මීන්ගෙන් සමන්විත කණ්ඩායමක් විසින් "කෘෂිකාර්මික ශ්‍රම වෙළඳපොළ ක්ෂේත්‍රයේ ප්‍රතිපත්ති පර්යේෂණ" නැමති මාතෘකාව යටතේ අධ්‍යයනයක් සිදු කරන ලද අතර එම අධ්‍යයනය මගින් වෙළඳපොළ කාන්තාකරණය වීම, වයස්ගත වීම, පිටතට සංක්‍රමණය වීම සහ අර්ධකාලීන ගොවිතැන ආදී වූ ශ්‍රම වෙළඳ පොළ ගැටළු පිළිබඳ අවධානය යොමු කරමින් ප්‍රධාන කෘෂිකර්මාන්ත උප අංශවල ඵලදායිතාවයෙහි ඇගයීමක් සිදු කළ කරන ලදී. ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අංශයේ තරඟකාරිත්වය වැඩි දියුණු කිරීම සඳහා උපාය මාර්ග හඳුනා ගැනීම මෙම අධ්‍යයනයේ අරමුණ විය. කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් මෙම අධ්‍යයනය සඳහා අරමුදල් සපයා දෙන ලදී.

ආහාර සුරක්ෂිතතාවය

ගෙවතුවල වගා කරනු ලබන ආහාර බෝග සමග සෘජු තරඟයක් ඇති, ආහාර නොවන බෝගයක් වන දුම්කොළ වගාව මගින් ආහාර හා පෝෂණ සුරක්ෂිතතාවය සහතික කිරීම පිණිස ගෙවතු වගාව ප්‍රවර්ධනය කිරීමේ රජයේ ප්‍රතිපත්තිය කෙරෙහි සෘණාත්මක ගම්‍යමානයන් ඇති කරයි. එමෙන්ම, පුළුල් ලෙස දුම්කොළ වගා කිරීම මගින් පසෙහි සාරවත් බව අඩු වන අතර, එය ආහාර බෝග වගාව කෙරෙහි අමතර බරක් ද එක් කරයි. මනෝජ් තිබ්බොටුවාව, දිලානි හිරිමුතුගොඩගේ සහ නිමේෂා දිසානායක යන මහත්ම මහත්මීන් "දුම්කොළ වගාව ආර්ථික වශයෙන් තිරසර වූ විකල්ප භෝග වලට පරිවර්තනය කිරීම" නැමති මාතෘකාව යටතේ පර්යේෂණ අධ්‍යයනයක් සිදු කළ අතර, එම අධ්‍යයනය මගින් දුම්කොළ අගය දාමය අවබෝධ කර ගැනීමටත්, විකල්ප භෝග වෙත මාරුවීමට ගොවීන්ගේ ඇති කැමැත්ත සහ ඔවුන්ගේ මාරුවීමේ තීරණ කෙරෙහි බලපාන සාධක ඇගයීමටත් අරමුණු කරන ලදී. දුම්කොළ භාවිතය පාලනය කිරීමේ වැඩසටහන යටතේ KIVU ඉන්ටර්නැෂනල් සංවිධානය විසින් මෙම අධ්‍යයනය සඳහා අරමුදල් සපයන ලදී.

ප්‍රකාශන

ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය සහ කෘෂි ව්‍යාපාර සංවර්ධනය කිරීම කෙරෙහි ආමන්ත්‍රණය කරමින් ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂකයින් විවිධ මාතෘකා යටතේ ප්‍රකාශන කිහිපයක් රචනා කළහ. "ශ්‍රී ලංකාවේ ආහාර සුරක්ෂිතතා ප්‍රතිපත්ති කාර්ය රාමුව: වෙළඳ පොළ ප්‍රතිසංස්කරණ, විවිධාංගීකරණය සහ සුරක්ෂිතතා ජාල" යන මාතෘකාව යටතේ ආහාර සුරක්ෂිතතාවය පිළිබඳ අවධාරණය කරමින් ආචාර්ය සමන් කැලේගම මහතා සහ දිලනි හිරිමුතුගොඩගේ මහත්මිය විසින් රචනා කරන ලද පරිච්ඡේදය එන්. කුමාර් සහ ජී. ජෝශප් විසින් සංස්කරණය කර ආසියා පැසිෆික් කලාපය සඳහා වන එක්සත් ජාතීන්ගේ ආර්ථික සහ සමාජ කොමිසම (UNESCAP) සහ Routledge ප්‍රකාශන සමාගම විසින් ප්‍රකාශයට පත් කරන ලද දකුණු ආසියාවේ තිරසර ආහාර සුරක්ෂිතතාවය සඳහා කලාපීය සහයෝගීතාවය පිළිබඳ වෙළුමෙහි ප්‍රකාශයට පත් කරන ලදී.

දුෂ්නි වීරකෝන් මහත්මිය සහ සිසිර ජයකොඩි මහතා විසින් සංස්කරණය කර, සිංග ප්පූරුවේ ස්ප්‍රින්ජර් විසින් ප්‍රකාශයට පත් කරන ලද, පශ්චාත් ගැටුම් සංදර්භය තුළ සංවර්ධනයේදී දේශීය සහ අන්තර්ජාතික අභියෝග සහ අවස්ථා කළමනාකරණය කිරීම - ශ්‍රී ලංකාවෙන් උගත හැකි පාඩම්, නැමති වෙළුමක් සඳහා මනෝජ් තිබ්බොටුවාව මහතා "පශ්චාත් ගැටුම් සංදර්භය තුළ ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය නවීකරණය කිරීම" යන මාතෘකාව යටතේ පරිච්ඡේදයක් රචනා කළේය. එමෙන්ම, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ ප්‍රධානතම ප්‍රකාශනය වන "ශ්‍රී ලංකාව: ආර්ථිකයෙහි තත්ත්වය 2019" වාර්තාව සඳහා වී මහතා "කෘෂිකර්මාන්තයේදී සුහුරු ඩිජිටල් ගොවිතැන: ශ්‍රී ලංකාවෙහි තත්ත්වය සහ අපේක්ෂාවන්" නැමති මාතෘකාව යටතේ පරිච්ඡේදයක් ද රචනා කළේය.

ප්‍රතිපත්ති නියැළීම්

කමිටු

මනෝජ් තිබ්බොටුවාව මහතා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ සමාජ-ආර්ථික හා ප්‍රතිපත්ති විශ්ලේෂණය පිළිබඳ ජාතික කමිටුවේ කමිටු සාමාජිකයෙකු ලෙස කටයුතු කළේය. එමෙන්ම ඒ මහතා ආර්ථික ප්‍රතිසංස්කරණ හා පොදු සැපයීම් අමාත්‍යාංශයේ ඉල්ලීම අනුව, ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව විසින් කළමනාකරණය කරනු ලබන උෂ්ණත්ව-පාලිත ගබඩා සහ ගොවීන් සඳහා සහල් අලෙවිකරණය සහ වියළන පිළිබඳ උපදේශක මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස ද කටයුතු කළේය.

ඉදිරිපත් කිරීම් සහ සාකච්ඡා මණ්ඩල



ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂකයින් විවිධ සංසද වලදී කෘෂිකර්මාන්ත ප්‍රතිපත්ති සහ ආයතන සම්බන්ධ විවිධ ගැටළු සාකච්ඡා කළහ:

- මනෝජ් තිබ්බොටුවාව මහතා "උණ බම්බු කරමාන්ත අංශයේ මාර්ග සිතියම් සකස් කිරීම" පිළිබඳ පාර්ශවකරුවන්ගේ වැඩමුළුවේ දී "ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මාන්ත අංශයේ පුනර්ජීවනය සඳහා උණ බම්බු කර්මාන්ත අංශය සතු විභාවතාවය" පිළිබඳ ඉදිරිපත් කිරීමක් සිදු කළේය. ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි පැවති මෙම වැඩමුළුව ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන සහ කාර්මික තාක්ෂණ ආයතනය එක්ව සංවිධානය කරන ලදී (මාර්තු).
- ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය විසින් සංවිධානය කරන ලද "නව චින්තකයින්ගේ සම්මන්ත්‍රණය 2019" අවස්ථාවේදී නිමේෂා දිසානායක මහත්මිය "කෘෂිකර්මාන්තයේදී තාක්ෂණය යොදා ගැනීම" පිළිබඳ ඉදිරිපත් කිරීමක් සිදු කළාය (මාර්තු).
- "කෘෂිකර්මාන්තයේ දේශගුණික ප්‍රතිරෝධය ගොඩනැගීම පිළිබඳ කලාපීය වැඩමුළුව" අවස්ථාවේදී මනෝජ් තිබ්බොටුවාව මහතා "ශ්‍රී ලංකාවේ තිරසර කෘෂිකාර්මික ඵලදායිතාවය සහ ආහාර සුරක්ෂිතතාවය සඳහා නව්‍ය දේශගුණික-ප්‍රතිරෝධී පිළිවෙත් අනුගමනය කිරීම" පදනම් කරගෙන මෙරට පිළිබඳ ඉදිරිපත් කිරීමක් සිදු කළේය. ඩකා නුවර පැවති මෙම වැඩසටහන බංග්ලාදේශයේ ජාතික ඵලදායිතා සංවිධානය සමග එක්ව ආසියානු ඵලදායිතා සංවිධානය විසින් සංවිධානය කරන ලදී (මැයි).
- රුවන් සමරවීර මහතා යාපනය විශ්වවිද්‍යාලයේ දී "ශ්‍රී ලංකාවේ ඉඩම් සඳහා ප්‍රවේශය, ජීවනෝපාය විවිධාංගීකරණය සහ ග්‍රාමීය තරුණ තරුණියන් සංක්‍රමණය වීම" යන මාතෘකාව යටතේ පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කළේය (ජූලි).
- මියැන්මාරයේ යැන්ගොං නුවර පැවති "ආසියාව සඳහා වන කලාපීය උපායමාර්ගික විශ්ලේෂණය සහ දැනුම සහාය පද්ධතිය (ReSAKSS-Asia) සහ මියැන්මාර් ඒකාබද්ධ සංවර්ධන ආයතන (MIID) සමුළුවේදී" මනෝජ් තිබ්බොටුවාව මහතා "ශ්‍රී ලංකාවේ විකාසනය වෙමින් පවතින කෘෂිකර්ම ක්‍රමවේද" නැමති මාතෘකාව යටතේ ඉදිරිපත් කිරීමක් සිදු කළේය (ඔක්තෝබර්).
- රුවන් සමරවීර මහතා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ පැවති "අපනයන කෘෂිකර්ම විද්‍යාවේදී ගෞරව උපාධිය පිළිබඳ පාර්ශ්වකරුවන්ගේ රැස්වීම" පිළිබඳ සාකච්ඡා මණ්ඩලයකට සහභාගී විය (නොවැම්බර්).

බ්ලොග් ලිපි

මනෝජ් තිබ්බොටුවාව මහතාගේ සහ නිමේෂා දිසානායක මහත්මියගේ සම-කර්තෘත්වයෙන් ටෝකිං ඉකොනොමික්ස් සඟරාව සඳහා "සුභුරු ගොවිපළ! 4 වැනි කාර්මික විප්ලවය තුළ ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්ත අංශය සංවර්ධනය කිරීම" (ඔක්තෝබර්) සහ "කෘෂිකර්මාන්තයේ සුභුරු ඩිජිටල් ගොවිතැන: ශ්‍රී ලංකාවෙහි තත්ත්වය සහ අපේක්ෂාවන්" (දෙසැම්බර්) නැමති බ්ලොග් ලිපි රචනා කරන ලදී.
මනෝජ් තිබ්බොටුවාවා මහතා සහ නිමේෂා දිසානායක මහත්මිය එක්ව "දුම්කොළ වගාව තහනම් කිරීම: ශ්‍රී ලාංකික ගොවීන් සඳහා වෙස්වළා ගත් ආශීර්වාදයක්" නැමති බ්ලොග් ලිපියට දායක වූහ (නොවැම්බර්) .

දිලානි හිරිමුතුගොඩගේ මහත්මිය කෘෂි ව්‍යාපාර අගය දාම හා සම්බන්ධ ගැටළු පිළිබඳව අවධාරණය කරමින් "ගුණාත්මකභාවයේ ප්‍රමිතීන්, ශ්‍රී ලංකාවේ කුරුඳු කර්මාන්තයේ සාර්ථකත්වය තීරණය කෙරෙන සාධකය" යන මාතෘකාව යටතේ බ්ලොග් ලිපියක් ලිව්වාය. ටෝකිං ඉකොනොමික්ස් බ්ලොග් අඩවිය සඳහා ලියන ලද සියලුම ලිපි ප්‍රමුඛ පෙළේ පුවත්පත්වල සහ සමාජ මාධ්‍ය වේදිකාවල පළ විය.

මාධ්‍ය

මනෝජ් තිබ්බොටුවාව මහතා Economy Next පුවත් සේවාව සඳහා "ගොවීන්ගේ ආදායම සහ ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා ශ්‍රී ලංකාවට කෘෂිකර්මාන්ත ප්‍රතිපත්ති වෙනසක් අවශ්‍ය කරයි" නැමති මාතෘකාව යටතේ සම්මුඛ සාකච්ඡාවක් ලබා දුන්නේය (දෙසැම්බර්).







පරිසරය, ස්වභාවික සම්පත් සහ දේශගුණික විපර්යාස

පරිසරය, ස්වභාවික සම්පත් සහ කෘෂිකර්මාන්තය සම්බන්ධයෙන් ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය සිදු කළ පර්යේෂණ මගින් ශ්‍රී ලංකාවේ ස්වභාවික ප්‍රාග්ධනයෙහි අඛණ්ඩ පැවැත්ම ආරක්ෂා කර ගැනීම අරමුණු කර ගත් සම්බන්ධීකරණය කළ ප්‍රතිපත්ති සහ උපාය මාර්ග වල භූමිකාව පිළිබඳව අවධානය යොමු කරන ලදී. නව්‍යකරණය සහ නිවැරදි තාක්ෂණික විසඳුම් අනුගමනය කිරීම, ප්‍රේරකර වල ව්‍යුහය නිවැරදිව අවබෝධ කර ගැනීම සහ ඵලදායී ආයතන පිහිටුවීම මෙයට ඇතුළත් වේ. ඉහළ යමින් පවතින ඉඩම් හිඟය, කෘෂිකාර්මික ඵලදායිතාව සම්බන්ධ ගැටළු සහ ආහාර සුරක්ෂිතතාව සමග දේශගුණික විපර්යාස වල බලපෑම් හා සම්බන්ධ අවදානම් සහ අවිනිශ්චිතතාවයන් මගින් රාජ්‍ය ප්‍රතිපත්තියේ අංශ කිහිපයක ගනු ලබන තීරණ ඒකාබද්ධ කෙරෙන ඒකාබද්ධ ප්‍රවේශයක අවශ්‍යතාවය පෙන්වා දෙයි.



පරිසරය සහ ස්වභාවික සම්පත් සම්බන්ධ ප්‍රතිපත්ති

පරිසරය, ස්වභාවික සම්පත් සහ දේශගුණික විපර්යාස පිළිබඳ පර්යේෂණ කණ්ඩායම විසින් විවිධ පර්යේෂණ සිදු කරන ලද අතර එමගින් ආපදා අවදානම් කළමනාකරණය, හරිත ආර්ථිකය සහ තිරසාර බලශක්තිය හා සම්බන්ධ විවිධ ක්ෂේත්‍රවලට ආමන්ත්‍රණ කරන ලදී. අතුල සේනාරත්න මහතා "පරිසරය සඳහා සාර්ව ආර්ථික පැතිකඩක් නිර්මාණය කිරීම" පිළිබඳ අධ්‍යයනයක් සිදු කළේය. විසිරී ඇති විවධ මූලාශ්‍ර වලින් පාරිසරික දත්ත එක්රැස් කර විශ්ලේෂණය කිරීම තුළින් රටෙහි පාරිසරික ගැටළුවල සාර්ව ආර්ථික මානයන් අවබෝධ කර ගැනීම එම අධ්‍යයනයෙහි අරමුණ වූ අතර, එමගින් රටෙහි සාර්ව-පාරිසරික පැතිකඩක් සකස් කිරීම සඳහා භාවිතා කළ හැකි ආකෘතියක එම දත්ත ගොනු කිරීමට අරමුණු කරන ලදී. බුද්ධි මණ්ඩල වැඩසටහන (TTI) විසින් මෙම අධ්‍යයනය සඳහා අරමුදල් සපයන ලදී.

අතුල සේනාරත්න, මනෝජ් තිබ්බොටුවාව, කාංචනා වික්‍රමසිංහ, දිලානි හිරිමුතුගෙ ාඩගේ, රුවන් සමරවීර සහ නිමේෂා දිසානායක යන මහත්ම මහත්මීන්ගෙන් සමන්විත කමුටුවක් "අලින් හේතුවෙන් ඇතිවන මිනිස්-වනජීවී ගැටුම සඳහා ගොවීන් වෙනුවෙන් වාණිජ රක්ෂණයක්" පිළිබඳ අධ්‍යයනයක් සිදු කරන ලදී. අලි-මිනිස් ගැටුම් අවම කිරීම සඳහා වාණිජමය වශයෙන් ක්‍රියාත්මක වන රක්ෂණ ක්‍රමයක් සකස් කිරීම සඳහා ඇති විභවය ගවේෂණය කිරීමේ අරමුණෙන් මෙම පර්යේෂණය සිදු කරන ලදී. එක්සත් රාජධානියේ පරිසරය හා සංවර්ධනය පිළිබඳ අන්තර්ජාතික ආයතනය (IIED) විසින් මෙම අධ්‍යයනය සඳහා අරමුදල් සපයන ලදී.

දේශගුණික විපර්යාස

වියළි කලාපයේ ගොවීන් මුහුණ දෙන අවදානම් සහ අවිනිශ්චිතතාවයන්, ඔවුන්ගේ අවදානම් කළමනාකරණ උපාය මාර්ග සහ දේශගුණික අවදානම් කළමනාකරණය කිරීමේදී දේශගුණික රක්ෂණයෙහි කාර්යභාරය ඇගයීම පිණිස කාංචනා වික්‍රමසිංහ මහත්මිය විසින් "දේශගුණ රක්ෂණයක් සඳහා ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ ගොවීන් ගෙන් ඇති ඉල්ලුම" පිළිබඳ අධ්‍යයනයක් සිදු කළාය. ගෝලීය සංවර්ධන ජාලය (GDN) මෙම ව්‍යාපෘතිය සඳහා අරමුදල් සම්පාදනය කළේය.

අතුල සේනාරත්න, මනෝජ් තිබ්බොටුවාව, දිලනි හිරිමුතුගොඩගේ සහ කාංචනා වික්‍රමසිංහ යන මහත්ම මහත්මීන් ගෙන් සමන්විත කණ්ඩායමක් "ඵලදායී අනුවර්තනය පිළිබඳ තීරණ සඳහා දේශගුණික තොරතුරු සහ සන්නිවේදන හිදැස් පියවීම: ඒකාබද්ධ දේශගුණික තොරතුරු කළමනාකරණ පද්ධතියක් (ICIMS)" පිළිබඳ අධ්‍යයනයක් සිදු කළහ. ශ්‍රී ලංකාවේ ගොවීන් සහ අනෙකුත් ප්‍රතිපත්ති පාර්ශ්වකරුවන් විසින් භාවිතා කරනු ලබන තීරණ ගැනීමේ නිර්ණායකවල ශක්තීන් ඒකාබද්ධ කෙරෙන ඒකාබද්ධ දේශගුණික තොරතුරු කළමනාකරණ පද්ධතියක ආකෘති ස්ථාපිත කිරීම සහ නියමු-පරීක්ෂා කිරීම් සිදු කිරීම මගින් ගොවීන්ගේ සහ ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ / විශේෂඥයින්ගේ අනුවර්තන තීරණවල ඵලදායීත්වය වැඩි දියුණු කිරීමට මෙම පර්යේෂණ අධ්‍යයනය මගින් අරමුණු කරන ලදී. අන්තර්ජාතික සංවර්ධන පර්යේෂණ මධ්‍යස්ථානය (IDRC) මෙම ව්‍යාපෘතිය සඳහා අරමුදල් සම්පාදනය කළේය.

තිරසර බලශක්තිය

අතුල සේනරත්න මහතා සහ කාංචනා වික්‍රමසිංහ මහත්මිය "ශ්‍රී ලංකාව සඳහා ජාතික ස්වභාවික වායු ප්‍රතිපත්තිය" පිළිබඳ අධ්‍යයන ව්‍යාපෘතියක් ආරම්භ කළහ. ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය මෙම අධ්‍යයනය සඳහා අරමුදල් සපයන ලදී. ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යංශය විසින් සිදු කරනු ලබන කාර්යයන් පදනම් කර ගනිමින් ශ්‍රී ලංකාව සඳහා ජාතික ස්වභාවික වායු ප්‍රතිපත්තියක් සම්පාදනය කිරීම මෙම ව්‍යාපෘතියෙහි අරමුණ විය.

ප්‍රකාශන

කාංචනා වික්‍රමසිංහ මහත්මිය "ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ ගොවීන් සඳහා දේශගුණික රක්ෂණය: දර්ශක රක්ෂණයක් සඳහා අපේක්ෂාවන් (ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ කෘෂිකර්මාන්ත පර්යේෂණ ප්‍රකාශන මාලා අංක 200, මැයි) නැමති ප්‍රකාශනය රචනා කළාය.



ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි ප්‍රධානතම ප්‍රකාශනය වන "ශ්‍රී ලංකාව: ආර්ථිකයෙහි තත්ත්වය 2019" සඳහා අතුල සේනරත්න මහතා "හතර වැනි කාර්මික විප්ලවය සහ ශ්‍රී ලංකාවේ පාරිසරික තිරසරභාවය" පිළිබඳ පරිච්ඡේදයක් රචනා කළේය. එමෙන්ම ඒ මහතා දුෂ්නි වීරකෝන් මහත්මිය සහ සිසිර ජයසූරිය මහතා විසින් සංස්කරණය කර, සිංගප්පූරුවේ ස්ප්‍රින්ජර් ප්‍රකාශන ආයතනය විසින් ප්‍රකාශයට පත් කරන ලද "පශ්චාත් ගැටුම් වාතාවරණය තුළ සංවර්ධනයේදී අභ්‍යන්තර සහ අන්තර්ජාතික අභියෝග සහ අවස්ථා කළමනාකරණය කර ගැනීම: ශ්‍රී ලංකාවෙන් උගත හැකි පාඩම්" නැමති වෙළුම සඳහා "පශ්චාත් ගැටුම් අවධිය තුළ ශ්‍රී ලංකාවේ තිරසර සංවර්ධනය සහතික කිරීම" පිළිබඳ පරිච්ඡේදයක් ද ලිවිවේය.

විශේෂ අවස්ථා

අලි-මිනිස් ගැටුමට විරෙහිව සටන් කිරීම සඳහා රක්ෂණ ක්‍රමයක් සැලසුම් කිරීමේ අරමුණ ඇතිව "ශ්‍රී ලංකාව සඳහා අලින්ගෙන් ජීවනෝපාය ආරක්ෂා කර ගැනීමට ජීවනෝපාය රක්ෂණයක් (ජීවිත) සකස් කිරීම පිළිබඳ ආරම්භක වැඩමුළුව" නැමති මාතෘකාව යටතේ ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි සහ චික්සත් රාජධානියේ පරිසරය හා සංවර්ධනය පිළිබඳ අන්තර්ජාතික ආයතනයෙහි සමසංවිධායකත්වයෙන් යුතුව කොළඹ දී වැඩමුළුවක පවත්වන ලදී (ජනවාරි).

ප්‍රතිපත්ති නියැළීම්

කමිටු

අතුල සේනාරත්න මහතා පහත දැක්වෙන කමිටුවල සාමාජිකයෙකු ලෙස සේවය කළේය: ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ කෘෂිකර්මාන්ත ආංශික කමිටුව, තේ පර්යේෂණ මණ්ඩලයේ පර්යේෂණ පිළිබඳ උපදේශක කමිටුව, සහ හෙක්ටර් කොබ්බෑකඩුවා පර්යේෂණ හා පුහුණු ආයතනයේ පුහුණු කමිටුව. එමෙන්ම ඒ මහතා Future Earth සංවිධානයේ දකුණු ආසියානු කලාපීය කාර්යාලයේ පාලක සභා රැස්වීමේ සාමාජිකයෙකු ලෙස ද කටයුතු කළේය (ඉංදියාවේ බැංගලෝර් නගරයේ ඉන්දියානු විද්‍යා ආයතනය (IISC) විසින් මේ සඳහා සත්කාරකත්වය සපයන ලදී). එම පාලක සභා සාමාජිකයෙකු ලෙස ඒ මහතා ඉන්දියානු විද්‍යා ආයතනය විසින් සත්කාරකත්වය සපයන ලද Future Earth දකුණු ආසියා සංවිධානයේ ප්‍රථම පාලක සභා රැස්වීමට ද, "තිරසර ජල අනාගතයක් කරා" නැමති මාතෘකාව යටතේ පැවති උච්චැර තම්වීමරු සමුළුවට ද සහභාගී වූයේය. 2019 සැප්තැම්බර් 24-27 යන දින වල ඉන්දියාවේ බැංගලෝරයේ පැවති මෙම සමුළුව 'Divecha දේශගුණික විපර්යාස කේන්ද්‍රයෙහි' සහ ඉන්දියානු විද්‍යා ආයතනයෙහි සම සංවිධායකත්වයෙන් යුතුව පවත්වන ලදී.

එමෙන්ම, අතුල සේනාරත්න මහතා මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ දේශගුණික විපර්යාස ලේකම් කාර්යාලය විසින් ප්‍රකාශයට පත් කරනු ලබන 'දේශගුණික විපර්යාස සඟරාවේ' කර්තෘ මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස ද කටයුතු කළේය. චික්සත් ජාතීන්ගේ ආර්ථික හා සමාජ කටයුතු දෙපාර්තමේන්තුව විසින් ඉන්දුනීසියාවේ ජකර්තා නුවර දී සංවිධානය කරන ලද "ගෝලීය තිරසර සංවර්ධන වාර්තාව 2019 ආසියා පැසිෆික් කලාපය තුළ ක්‍රියාත්මක කිරීම" පිළිබඳ ප්‍රචාරණ වැඩමුළුවට සහභාගී වීමටද ඒ මහතාට ආරාධනා කරනු ලැබීය (නොවැම්බර්).
ඉදිරිපත්කිරීම් සහ සාකච්ඡා මණ්ඩල

විවිධ වැඩටහන් වලදී පරිසරය සහ ස්වභාවික සම්පත් පිළිබඳ ප්‍රතිපත්ති හා සම්බන්ධ විවිධ ගැටළු පිළිබඳ පර්යේෂණ සොයාගැනීම් බෙදා හැරීම සිදු කරන ලදී:

- අතුල සේනරත්න මහතා "අලින් ගෙන් සිදුවන හානි සඳහා ජීවනෝපාය රක්ෂණය

(ජීවිත)" ව්‍යාපෘතිය පිළිබඳ ආරම්භක වැඩමුළුවේදී "ශ්‍රී ලංකාවේ අලි-මිනිස් ගැටුම: තත්ත්ව විශ්ලේෂණය" පිළිබඳ ඉදිරිපත් කිරීමක් සිදු කළේය. කොළඹ දී පැවති මෙම වැඩසටහන සඳහා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය සහ එක්සත් රාජධානියේ පරිසරය හා සංවර්ධනය පිළිබඳ අන්තර්ජාතික ආයතනය විසින් ඒකාබද්ධව සත්කාරකත්වය සපයන ලදී (ජනවාරි).

- අතුල සේනරත්න මහතා ලෝක බැංකුවේ ගෝලීය වනජීවී වැඩසටහන (GWP) විසින් සංවිධානය කර ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේදී පවත්වන ලද " මිනිස්-වනජීවී ගැටුම සහ රක්ෂණය" පිළිබඳ වෙබ්මුළුවක සාකච්ඡා මණ්ඩල සාමාජිකයෙකු ලෙස සහභාගී විය (නොවැම්බර්).
- MAS Athena පුහුණු මධ්‍යස්ථානයේ දී පැවති නිවර්තන පෙව විවිධත්ව හා සංරක්ෂණ සංගමයේ (ATBC) ආසියා පැසිෆික් ශාඛා සමුළුව සහ හමුව අවස්ථාවේදී අතුල සේනරත්න මහතා "තිරසර සංවර්ධනය සඳහා ස්වභාවික ප්‍රාග්ධනය මත ආයෝජනය කිරීම: ශ්‍රී ලංකාවේ පෙව විවිධත්ව වියදම පිළිබඳ විශ්ලේෂණයක්" නැමති මාතෘකාවක් යටතේ ඉදිරිපත් කිරීමක් සිදු කළේය (සැප්තැම්බර්).එයට අමතරව, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂකයින් විවිධ වැඩසටහන් වලදී දේශගුණික විපර්යාස හා සම්බන්ධ ගැටළු සාකච්ඡා කළහ.
- දකුණු ආසියාවේ ආර්ථික සංවර්ධනය" පිළිබඳ සම්මන්ත්‍රණයක දී අතුල සේනරත්න මහතා "දේශගුණික තොරතුරු සහ ගොවීන්: සාර්ථක අනුවර්තනයක් සඳහා ඒකාබද්ධ තොරතුරු කළමනාකරණය" නැමති මාතෘකාව යටතේ ඉදිරිපත් කිරීමක් සිදු කළේය. කළුතර දී පැවති මෙම වැඩසටහන ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය සහ ඔස්ට්‍රේලියාවේ මොනෑෂ් විශ්වවිද්‍යාලය එක්ව සංවිධානය කරන ලදී (ජනවාරි).
- "ශ්‍රී ලංකාවේ දේශගුණික විපර්යාස සහ තීරණාත්මක යටිතල පහසුකම්" පිළිබඳ වැඩමුළුවේදී අතුල සේනරත්න මහතා "දේශගුණික විපර්යාස බලපෑම්, යටිතල පහසුකම් සහ අනුවර්තනය වීම" යන මාතෘකාව යටතේ ඉදිරිපත් කිරීමක් සිදු කළේය. විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය සහ ආසියානු සංවර්ධන බැංකුව එක්ව කොළඹ දී මෙම වැඩසටහන සංවිධානය කරන ලදී (මාර්තු).
- "උණ බම්බු කර්මාන්ත අංශයේ මාර්ග සිතියම / රටෙහි ක්‍රියාකාරිත්වය / ක්‍රමෝපායික සැලසුම් සංවර්ධනය" පිළිබඳ පාර්ශවකරුවන්ගේ වැඩමුළුවේදී මනෝජ් තිබ්බොටුවාව මහතා "තිරසර සංවර්ධනය, දේශගුණික අනුවර්තනය සහ හානි අවම කිරීම සඳහා උණ බම්බු කර්මාන්තය" නැමති මාතෘකාව යටතේ ඉදිරිපත් කිරීමක් සිදු කළේය. කොළඹ ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පැවති මෙම වැඩමුළුව කාර්මික තාක්ෂණ ආයතනය (ITI) විසින් සංවිධානය කරන ලදී (මාර්තු).
- "කෘෂිකර්මාන්තයේ දේශගුණික ප්‍රත්‍යාස්ථතාවය ගොඩනැගීම" පිළිබඳ වැඩමුළුවේදී මනෝජ් තිබ්බොටුවාව මහතා "ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තයේ දේශගුණික ප්‍රත්‍යාස්ථතාවය ගොඩනැගීම" පිළිබඳ ඉදිරිපත්කිරීමක් සිදු කළේය. බංග්ලාදේශයේ ඩකා නුවර පැවති මෙම වැඩමුළුව ආසියානු ඵලදායිතා සංවිධානය (APO) විසින් සංවිධානය කරන ලදී (මැයි).
- "බිම්ස්ටෙක් රටවල දේශගුණික විපර්යාස සහ ආපදා කළමනාකරණය" පිළිබඳ වැඩමුළුවේදී අතුල සේනරත්න මහතා "ශ්‍රී ලංකාවේ ආහාර සුරක්ෂිතතාවය සඳහා දේශගුණික විපර්යාස අභියෝග" නැමති මාතෘකාව යටතේ ඉදිරිපත් කිරීමක් සිදු කළේය. මියැන්මාරයේ යැන්ගොං හි පැවති මෙම වැඩමුළුව මියැන්මාර් උපායමාර්ගික හා ජාත්‍යන්තර අධ්‍යයන ආයතනය සහ Friedrich-Ebert-Stiftung පදනම විසින් සංවිධානය කරන ලදී (ජූනි).
- "කෘෂිකර්මාන්තය හා ආහාර සැපයුම් දාමය කෙරෙහි දේශගුණික විපර්යාස මගින් ඇති කෙරෙන බලපෑම් මැඩපවත්වා ගැනීමේ කාර්යය" නැමති වැඩමුළුවේදී අතුල සේනරත්න මහතා "ඉදිරි මාවත: අනාගතය සඳහා අදහස්" යන සැසිය මෙහෙයවූයේය. කොළඹ දී පැවති මෙම වැඩසටහන ජාත්‍යන්තර ජල කළමනාකරණ ආයතනය සහ නෙදර්ලන්ත තානාපති කාර්යාලය විසින් සංවිධානය කරන ලදී (නොවැම්බර්).
- කොළඹ දී පැවති "අභිබවා යාම: අවදානම් සංවේදී නාගරික සංවර්ධනය" පිළිබඳ වැඩමුළුවේදී අතුල සේනරත්න "මහතා "ශ්‍රී ලංකාවේ දේශගුණික අනුවර්තනය හා නාගරික ප්‍රතිපත්ති" නැමති මාතෘකාව යටතේ ඉදිරිපත් කිරීමක් සිදු කළේය (දෙසැම්බර්).
- "තිරසර සංවර්ධන අරමුණු පිළිබඳ තුන් වැනි දකුණු ආසියානු සංසදය" අවස්ථාවේදී අතුල සේනරත්න මහතා "ගෝලීය පාරිසරික සම්පත් සහ දේශගුණික විපර්යාස" පිළිබඳ සාකච්ඡා මණ්ඩලයකට සහභාගී විය. බංග්ලාදේශයේ ඩකා නුවර පැවති මෙම වැඩසටහන සඳහා ආසියා පැසිෆික් කලාපය සඳහා වන

එක්සත් ජාතීන්ගේ ආර්ථික සහ සමාජ කොමිසමෙහි දකුණු සහ නිරිතදිග ආසියානු උපකලාපීය කාර්යාලය (UNESCAP-SSW) සහ බංග්ලාදේශ රජයේ ආර්ථික සම්බන්ධතා අංශය විසින් ඒකාබද්ධව සත්කාරකත්වය සපයන ලදී (දෙසැම්බර්).
රුවන් සමරවීර මහතා "බලශක්ති සංසදය 2019" පිළිබඳ සාකච්ඡා මණ්ඩලයකට සහභාගී වූ අතර එහිදී තිරසර බලශක්තිය පිළිබඳ ගැටළු සාකච්ඡා කළේය. ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් මෙම වැඩසටහන සංවිධානය කරන ලදී (සැප්තැම්බර්).

බ්ලොග් ලිපි

කාංචනා වික්‍රමසිංහ මහත්මිය පරිසර සහ ස්වභාවික සම්පත් ප්‍රතිපත්ති අවධාරණය කරමින් ටෝකිං ඉකොනොමික්ස් සඟරාව සඳහා "ශ්‍රී ලංකාවේ ආපදා අවදානම් කළමනාකරණය ආර්ථික ප්‍රතිපත්ති සැළැස්ම හා සම්බන්ධ කිරීම" නැමති මාතෘකාව යටතේ ආපදා අවදානම් කළමනාකරණය පිළිබඳ බ්ලොග් ලිපියක් ලිව්වාය (මාර්තු).
එයට අමතරව, දිනුෂ්කා පරණවිතාන මහත්මිය විසින් "කසල පිළිබඳ කතාව: ප්ලාස්ටික මගින් ශ්‍රී ලංකාවේ මුහුදු තීරයේ සිදුවන සමුද්‍රීය දූෂණය සම්බන්ධයෙන් කටයුතු කිරීම" යන මාතෘකාව යටතේ බ්ලොග් ලිපියක් ලිව්වාය (මැයි).
රුවන් සමරවීර මහතා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනෙහි (UNDP) UNLOCKED අවකාශය සඳහා "දේශගුණික විපර්යාස, නගර සැළසුම්කරණය සහ සංවර්ධන ප්‍රතිපත්ති", "දේශගුණික විපර්යාසවල උච්ඡ ස්ථාන වන නගර" සහ "දේශගුණික තත්වයන්ට ඔරොත්තු දෙන, තිරසර නගර වලට මග" නැමති බ්ලොග් ලිපි ලිව්වේය (සියලු ලිපි ජුනි මාසයේදී ය).



පර්යේෂණ කණ්ඩායම් නායකයින්

වමේ සිට දකුණට: ගංගා තිලකරත්න, PhD (Manchester), නිශා අරුණතිලක්, PhD (Duke), මනෝජ් තිබ්බොටුවාවා, PhD (Western Australia), අතුල සේනරත්න, PhD (Deakin), බිලේෂා වීරරත්න, PhD (CUNY),ජනක විජයසිරි, PhD (Monash), දුෂ්නි වීරකෝන්, PhD (Manchester),

පර්යේෂණ කාර්ය මණ්ඩලය



ප්‍රියංකා ජයවර්ධන
BSc (කොළඹ),
MEcon (කොළඹ)
පර්යේෂණ ආර්ථිකවිද්‍යාඥ



සුනිමලී මධුරාවල
BA (කොළඹ),
MEcon (කොළඹ)
පර්යේෂණ ආර්ථිකවිද්‍යාඥ



දිලානි හිරිමුතුගොඩගේ
BA (කොළඹ),
MEcon (කොළඹ)
පර්යේෂණ ආර්ථිකවිද්‍යාඥ



කිත්මිණ හේවගේ
BA (ජෝන්ස් හොප්කින්ස්),
MSc (UCL)
පර්යේෂණ ආර්ථිකවිද්‍යාඥ



අශානි අභයසේකර
BA (පේරාදෙණිය),
MA (ANU)
පර්යේෂණ ආර්ථිකවිද්‍යාඥ



හරිනි වීරසේකර
BSc (UOLIP),
BA (කොළඹ),
MSc (වෝර්වික්)
පර්යේෂණ නිලධාරී



නිපුනි පෙරේරා
BA(කොළඹ),
MPPECOPOL(ANU),
CIM(එක්සත් රාජධානිය)
පර්යේෂණ නිලධාරී



නුවන්ති සේනාරත්න
BSc (සවුතැම්ප්ටන් විශ්වවිද්‍යාලය),
MSc (සරේ විශ්වවිද්‍යාලය)
පර්යේෂණ නිලධාරී



චතුර්ගා කරුණානායක
BA (කොළඹ)
පර්යේෂණ නිලධාරී



නිමේෂා දිසානායක
BSc (පේරාදෙණිය)
පර්යේෂණ නිලධාරී



රුවන් සමරවීර
BSc (උෟව වෙල්ලස්ස)
පර්යේෂණ සහකාර



චාමිනි තිලංකා
BA, MA (පේරාදෙණිය)
පර්යේෂණ සහකාර



ජනනි පෙරේරා
BSc (ජයවර්ධනපුර)
පර්යේෂණ සහකාර



විමල් නානායක්කාර
BSc (පේරාදෙණිය)
ජ්‍යෙෂ්ඨ බාහිර සාමාජික



හතර වැනි කාර්මික විප්ලවය තුළ දකුණු ආසියාවේ අනාගතය හැඩගැස්වීම

XII SAES
SAES XII 2019
South Asia Economic Summit

දකුණු ආසියානු ආර්ථික සමුළුව (SAES) 2008 වර්ෂයේදී ආරම්භ කරන ලද අතර එහි ප්‍රථම සමුළුව ශ්‍රී ලංකාවේ කොළඹ නගරයේදී පවත්වන ලදී. එයින් පසුව සෑම වර්ෂයකදී ම දකුණු ආසියානු රටවල අගනගරයන් හි මෙම සමුළුව පවත්වන ලද අතර, ඒ අනුව මේ වන විට සමුළු 11 ක් පවත්වා තිබේ.

12 වැනි දකුණු ආසියානු ආර්ථික සමුළුව ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය විසින් ශ්‍රී ලංකාවේ කොළඹ දී සංවිධානය කරන ලදී. 'හතර වැනි කාර්මික විප්ලවය තුළ දකුණු ආසියාවේ අනාගතය හැඩගැස්වීම' නැමති තේමාව කෙරෙහි අවධානය යොමු කරමින් පැවති මෙම සමුළුව 2019 සැප්තැම්බර් 26-27 යන දින වල කොළඹ හිල්ටන් හෝටලයේදී පවත්වන ලදී.



අනෙකුත් බොහෝ සංවර්ධනය වෙමින් පවතින රටවල් කලාපවලට මෙන් දකුණු ආසියාව සඳහා ද 4 වැනි කාර්මික විප්ලවයෙහි ප්‍රතිලාභ සහ උපද්‍රව සැලකිය යුතු වැදගත්කමකින් යුක්ත වේ. එක් අතකින්, 4 වැනි කාර්මික විප්ලවය මගින් රටවලට සංවර්ධන අවධීන් පසුකර යාමට ඉඩ සලසනු ඇත. වඩා හොඳින් ස්ථාපිත වී ඇති නිෂ්පාදන පදනම් සහිත හෝ තාක්ෂණයන් සඳහා ආයෝජනය කිරීමට සම්පත් ඇති රටවල් මෙහි ප්‍රතිලාභ ලැබිය හැකි තත්ත්වයක පසුවෙයි. අනෙක් අතට, දියුණු ආර්ථිකයන්හි නිෂ්පාදන පිරිවැය පහත හෙලන, තාක්ෂණයන් මගින් මෙහෙයවනු ලබන ඵලදායිතාව මගින් සංවර්ධනය වෙමින් පවතින රටවල 'නොමේරූ' කාර්මික නිෂ්පාදන ධාරිතාව පහත වැටීම වේගවත් කළ හැකිය. බොහෝ රටවලට, ස්වයංක්‍රීයකරණය මගින් මිනිස් ශ්‍රමය විස්ථාපනය වී යාමේ තර්ජනය ඉතාමත් යථාර්ථ වේ.

මෙහිදී 4 වැනි කාර්මික විප්ලවය හරහා තාක්ෂණයට බාධාකාරී වීම දකුණු ආසියාවේ හැරවුම් ලක්ෂයක් නිර්මාණය කරවයි.

මෙම අවස්ථාවේදී 'පශ්චාත් ගැටුම් අවධියේ සංවර්ධනය තුළ අභ්‍යන්තර සහ අන්තර්ජාතික අභියෝග සහ අවස්ථා කළමනාකරණය කර ගැනීම: ශ්‍රී ලංකාවෙන් උගත හැකි පාඩම්' නැමති මාතෘකාව යටතේ නව ප්‍රකාශනයක් නිකුත් කිරීම ද සනිටුහන් විය.
ස්ප්‍රින්ගර් ප්‍රකාශන සමාගම විසින් ප්‍රකාශයට පත් කරන ලද, ආචාර්ය වීරකෝන් මහත්මිය සහ සිසිර ජයසූරිය මහතා විසින් සංස්කරණය කරන ලද මෙම ග්‍රන්ථයෙහි දේශීය හා ජාත්‍යන්තර වශයෙන් කීර්තියක් දිනා ගෙන ඇත ශ්‍රී ලාංකික ආර්ථික විද්‍යාඥයින්ගේ ලිපි අඩංගු වන අතර, එය ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ හිටපු විධායක අධ්‍යක්ෂ, අභාවප්‍රාප්ත ආචාර්ය සමන් කැලේගම මහතා අනුස්මරණය කරමින් එළිදක්වන ලදී.
ආචාර්ය කැලේගම මහතා දායාද කළ උරුමයට උපහාරයක් ලෙස, මෙම ප්‍රකාශනය මගින් ශ්‍රී ලංකාව සමාජ-දේශපාලනික ප්‍රතිසංධානය සඳහා අරගලයක නියැළී සිටින, කැලඹිලි සහිත ගෝලීය ආර්ථිකයක් තිබෙන සහ දුෂ්කර අභ්‍යන්තර හා බාහිර දේශපාලන අභියෝග සහිත සන්දර්භයක, ශ්‍රී ලංකාවේ පශ්චාත් ගැටුම් වාතාවරණය තුළ සංවර්ධනය පිළිබඳ කතාවෙන් පාඩම් ගෙනහැර දක්වයි. මෙම ග්‍රන්ථය පර්යේෂකයින්ට, ප්‍රතිපත්ති සම්පාදකයින්ට සහ සංවර්ධන ක්‍රියාකාරීන්ට වැදගත් වනු ඇත.







සහායක සේවා

මූල්‍යය සහ පරිපාලනය

මූල්‍ය, පරිපාලන, මානව සම්පත්, නඩත්තු, මෙහෙයුම්, ප්‍රවාහන හා ප්‍රසම්පාදන සේවා සැපයීම මගින් පර්යේෂණ අංශවල ක්‍රියාකාරකම් සඳහා පහසුකම් සැලසීම සහ සහාය ලබා දීම සඳහා මූල්‍ය හා පරිපාලන අංශය පිහිටුවා ඇත.

සමාලෝචිත වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය කාර්යසාධනය රුපියල් මිලියන 30.0 ක අතිරික්තයක් වාර්තා කර ඇත. රු. මි. 179.0 ක් වූ මුළු ආදායම පහත සඳහන් ආදායම් වලින් සමන්විත වේ: ව්‍යාපෘති ආදායම (24%), ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ ආයෝජන භාර අරමුදලෙන් චිකතු වූ මුදල් (30%), පොළී ආදායම (23%), රජයේ ප්‍රදාන (9%), අන්තර්ජාතික සංවර්ධන පර්යේෂණ මධ්‍යස්ථානයේ ටී.ටී.අයි. ප්‍රදාන (3%) සහ වෙනත් විවිධ ආදායම් (11%).

2019 වර්ෂයේ දී ආයතනය විසින් මිලදී ගන්නා ලද පරිගණක දෘඩාංග හා මෘදුකාංගවල වටිනාකම රු. 12,505,751 ක් විය.

අපගේ සේවකයින් විසින් ලබා දෙන ලද දායකත්වය පිළිගැනීමට ලක් කරමින්, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය සේවකයින් අතර අන්තර් ක්‍රියාකාරකම් දිරිගැන්වීම සඳහාත්, කාර්ය මණ්ඩල සාමාජිකයින් අතර ධනාත්මක සබඳතා වර්ධනය කිරීම සඳහාත් ආයතනයේ සුභසාධන අරමුදලෙහි අරමුදල් සැපයීම යටතේ කාර්ය මණ්ඩලය සඳහා විනෝද සංචාරයක් සංවිධානය කළේය.

2019 වර්ෂයේ දී පර්යේෂකයින් දෙදෙනෙක් සහ සහායක කාර්ය මණ්ඩල සාමාජිකයින් දෙදෙනෙක් ආයතනයෙන් සමුගත් අතර නව කාර්ය මණ්ඩල සාමාජිකයින් අට දෙනෙකු ආයතනයට බඳවා ගන්නා ලදී.





සංනිවේදන සහ ජනවිහිදුම්කරණය

සන්නිවේදන මාර්ග ඵලදායී ලෙස භාවිතා කිරීම තුළින් ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂණ ව්‍යාප්ත කිරීම සහ ජනවිහිදුම්කරණය පුළුල් කිරීම ආයතනයේ ප්‍රධාන අරමුණු වලින් එකක් වන අතර, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ සන්නිවේදන හා ප්‍රකාශන ඒකකය විසින් එය මෙහෙයවනු ලැබේ. ප්‍රකාශන, ප්‍රතිපත්ති සංක්ෂිප්ත, මුද්‍රිත, විද්‍යුත් හා විකාශන මාධ්‍ය, ඩිජිටල් හා සමාජ මාධ්‍ය, සහ වැඩසටහන් හා සංවාද වැනි විවිධ මාධ්‍යයන් හරහා දේශීය හා අන්තර්ජාතික පාර්ශ්වකරුවන්, ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සාමාන්‍ය ජනතාව වෙත ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි බහුමාන පර්යේෂණ ක්‍රියාකාරකම් බෙදා හැරීම මෙයට ඇතුළත් වේ.

ආයතනය ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරන ක්ෂේත්‍ර කිහිපයක ප්‍රකාශන හතක් 2019 වර්ෂයේ දී ප්‍රකාශයට පත් කළ අතර, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි ප්‍රධානතම වාර්ෂික වාර්තාව වන “ශ්‍රී ලංකාව: ආර්ථිකයෙහි තත්ත්වය 2019” සහ “පශ්චාත් ගැටුම් අවධියේ සංවර්ධනය තුළ අභ්‍යන්තර සහ අන්තර්ජාතික අභියෝග සහ අවස්ථා කළමනාකරණය කර ගැනීම: ශ්‍රී ලංකාවෙන් උගත හැකි පාඩම්” නැමති ප්‍රකාශන ඒයට ඇතුළත් විය.

මේ අතර, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි පර්යේෂණ සහ එහි ප්‍රවෘත්ති පුවත්පත් නිවේදන, බ්ලොග් ලිපි සහ මාධ්‍ය සම්මුඛ සාකච්ඡා ස්වරූපයෙන් මහජනතාව මෙන්ම ප්‍රතිපත්ති සම්පාදකයින් අතර ද බෙදා හරිනු ලැබේ. 2019 වර්ෂයේ දී ආයතනයේ පර්යේෂණ හා ප්‍රචාරණය මගින් අවධානය යොමු කළ වැදගත්ම මාතෘකාවලින් එකක් වූයේ හතර වැනි කාර්මික විප්ලවය විසින් නිර්මාණය කර ඇති අභියෝග සහ අවස්ථා ය. එමෙන්ම මෙම වසරේදී ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය ‘දුම්කොළ භාවිතය පාලනය කිරීම’ නැමති නව පර්යේෂණ ක්ෂේත්‍රයක් ද හඳුන්වා දුන් අතර, ආයතනයේ බොහෝ සන්නිවේදන ක්‍රියාකාරකම් මගින්, විශේෂයෙන් ම 2019 ජනාධිපතිවරණ සමයේදී, දුම්කොළ භාවිතය පාලනය කිරීමේ ‘අවසන් අදියර’ කරා යාමේ වැදගත්කම පිළිබඳ දැනුවත්භාවය ඇති කිරීමට අරමුණු කළේය.
2019 වර්ෂයේ දී ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය දේශීය පුවත්පත් සහ මාර්ගගත පුවත් කවුළු වෙත බ්ලොග් ලිපි 43 ක් (ටෝකිං ඉකොනොමික්ස් සඟරාව මගින් ජනනය කරන ලද) නිකුත් කළ අතර, ගෝලීය වේදිකාවල ලිපි 9 ක් බෙදා හරින ලදී. ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය මාධ්‍ය සමග ඇති සම්බන්ධතාවය වඩාත් ශක්තිමත් කිරීම පිණිස මෙන්ම ආයතනයේ පර්යේෂණ වඩා හොඳ අවධානයක් සහිතව බෙදා හැරීම පිණිස පුවත්පත් සහ විකාශන මාධ්‍ය සමග සම්මුඛ සාකච්ඡා සඳහා පහසුකම් සලසන ලදී.

වමෙන්ම, ආයතනයේ ෆේස්බුක්, ට්විටර්, ලින්ක්ඩ්ඉන් සහ යූ ටියුබ් පිටු නිරන්තරයෙන් යාවත්කාලීන කිරීම මගින් 2019 වර්ෂයේ දී ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය සමාජ මාධ්‍යවල පෙනී සිටීම ද සැලකිය යුතු ලෙස වර්ධනය විය. වැඩසටහන් සහ සංසද අතරතුර සජීවී යාවත්කාලීන කිරීම් පළ කිරීම සඳහා ට්විටර් වේදිකාව භාවිතා කරමින් ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය ට්විටර් ඔස්සේ විශේෂයෙන් ක්‍රියාකාරී විය. එමෙන්ම, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය විසින් ස්වකීය පර්යේෂණ කාර්ය මණ්ඩලයෙහි සහභාගීත්වයෙන් ජාතික අයවැය පිළිබඳ ට්විටර් සංවාදයක් ද පවත්වන ලදී.

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය 2019 වර්ෂයේ දී පවත්වන ලද විශාලතම වැඩසටහන වූයේ 12 වැනි දකුණු ආසියානු ආර්ථික සමුළුව යි. එයට අමතරව, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය සම්මන්ත්‍රණ දෙකක්, වැඩමුළු හතරක් සහ ප්‍රතිපත්ති නියැළීම් සංසද දෙකක් ද සංවිධානය කළේය.

මේ ආකාරයෙන්, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය එහි ප්‍රධානතම පර්යේෂණ සමගින් විවිධ පාර්ශවකරුවන් රාශියක් වෙත ළඟා වීමට සමත් වී තිබේ.



තොරතුරු පද්ධති

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ තොරතුරු පද්ධති අංශය විසින් මෘදුකාංග, සන්නිවේදනය, දෘඩාංග, ජාලකරණය සහ තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් කළමනාකරණය, වෙබ් අඩවි සකස් කිරීම, තොරතුරු බෙදා හැරීම සහ දත්ත සංචිත සකස් කිරීම වැනි ප්‍රධාන ක්‍රියාකාරකම් සඳහා පහසුකම් සැලසීම මගින් කලාපීය විශිෂ්ඨතා මධ්‍යස්ථානයක් ලෙස තරඟකාරීව සිටීමට ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයට සහාය දෙයි.

2019 දී ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ ෆයර්වෝල් ආරක්ෂක පද්ධතිය නව ෆයර්වෝල් පද්ධතියකට උසස් කරන ලදී. එමෙන්ම මෙම වර්ෂය තුළදී නව ඒකාබද්ධ වීකීකෘත සන්නිවේදන පද්ධති වැඩිදියුණු කිරීමක් ද සිදු කරමින් නවීනතම පද්ධතියක් ස්ථාපිත කරන ලදී.

තොරතුරු පද්ධති අංශය 2020 වර්ෂයේදී දී සේවාදායක පද්ධතිය, ජාල පද්ධතිය සහ මෘදුකාංග පද්ධතිය යාවත්කාලීන කිරීමට ද සැලසුම් කර ඇත.



පුස්තකාලය

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි පුස්තකාලය එහි පර්යේෂණ කාර්ය මණ්ඩලයට සහ සහායක කාර්ය මණ්ඩලයට තොරතුරු සම්පත් සපයා දෙනවා පමණක් නොව බාහිර පරිශීලකයින්ට ද සේවා සපයා දෙයි. 2019 වර්ෂයේ දී ප්‍රධාන අවධානය යොමු වූයේ පුස්තකාලය ප්‍රතිව්‍යුහගත කිරීම කෙරෙහි ය.

එමගින් අන්තර්ජාතික සංවර්ධන පර්යේෂණ මධ්‍යස්ථානයේ / ඔඔෂ වැඩසටහනෙහි නොමසුරු සහයෝගය ඇතිව ඊඔධසෘ ඇතුළු දත්ත සංචිත කිහිපයකට ද අබණ්ඩව ප්‍රවේශය සපයා දුන්නේය.

එමෙන් ම පුස්තකාලය කාලීන සිදුවීම් පිළිබඳව සිය පරිශීලකයින් යාවත්කාලීන කර තබා ගනියි. තවද, පුස්තකාලය ආයතනයෙහි කාර්ය මණ්ඩලයට පුස්තකාලයේ අන්තxජාලය, ධර්ෂ සහ ඉලෙක්ට්‍රොනික දත්ත සංචිත පිළිබඳ හුරු කරවීම සඳහා දැනුවත් කිරීමේ ක්‍රියාකාරකම්වල නිරත වේ. එය අන්තර්-පුස්තකාල ණය (ඔබබ) සහ ලේඛන භාරදීමේ ඉල්ලීම් විශාල සංඛ්‍යාවක් ඉටු කර දීමට ද කටයුතු කර ඇත. 2019 වර්ෂයේ දී පුස්තකාලය ලේඛන කළමනාකරණ පද්ධතියක් සාර්ථකව හඳුන්වා දුන්නේය. ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩසටහන අවසන් වන තෙක් තාවකාලික පදනමින් පුස්තකාල උපදේශකවරයෙකු සහ පුස්තකාල පුහුණු අභ්‍යාසලාභියෙකු ද බඳවා ගන්නා ලදී.

පුස්තකාල සේවා සහ කාර්ය මණ්ඩල රාජකාරී ප්‍රතිව්‍යුහගත කිරීම 2020 වර්ෂයේ ද ප්‍රමුඛතාවයක් ලෙස අබණ්ඩව පවතී. පුස්තකාල ක්‍රියාකාරකම් හා සේවා විධිමත් කිරීම සඳහා කාර්ය පටිපාටි හඳුන්වා දීම සහ පුස්තකාල ඩිජිටල්කරණය නුදුරු අනාගතයේ දී ප්‍රමුඛතාවය ලබා දෙන කාර්යයන් වේ.

සහායක සේවා කාර්ය මණ්ඩලය

මූල්‍ය හා පරිපාලනය

ගයානි කල්දේරා, අධ්‍යක්ෂ - මූල්‍ය හා පරිපාලන
චාමලි රාජපක්ෂ, ගණකාධිකාරී
ඩබ්ලිව්. ආර්. තක්ෂිලා, ගිණුම් සහකාර
මධුෂා හෙට්ටිආරච්චි, මූල්‍ය හා පරිපාලන සහකාර
දිලිනි ගල්කැටිය, මානව සම්පත් හා පරිපාලන නිලධාරී
නිල්මිනි ද අල්විස්, රහස්‍ය ලේකම්
තුවාන් උෂාම් බංග්සාජයා, පහසුකම් කළමනාකරණ උපදේශක නිලධාරී
රේණුකා විජේකෝන්, පහසුකම් කළමනාකරණ නිලධාරී
බර්නාඩෙට් ප්‍රබාලෝගිනි, පිළිගැනීමේ නිලධාරී

සන්නිවේදනයන් සහ පිටත

චාමේන් විජේසිංහ, කළමනාකරු - ප්‍රකාශන සහ උත්සව අවස්ථා
ෂිහාරා මාදූවගේ, සන්නිවේදන හා ක්‍රමෝපායික සේවා කළමනාකරු
ටී.ඒ.එන්. අමේෂ්, ප්‍රකාශන නිලධාරී
නයෝමි ජයකොඩි, ලේකම්
ගයේන්ද්‍ර කරුණාරත්න, සංස්කාරක - අර්ධකාලීන
සුරේෂ් ප්‍රනාන්දු, ඩිජිටල් මාධ්‍ය නිලධාරී - අර්ධකාලීන
මල්කි නතාෂා, ව්‍යාපෘති සම්බන්ධීකාරක

තොරතුරු පද්ධති

නන්දක පොතුවැව, තොරතුරු පද්ධති ප්‍රධානී
නාලක වීරංග ලියනපතිරණ, වෙබ් කළමණාකරු සහ පද්ධති පරිපාලක
රොෂාන් කළුආරච්චි, වෙබ් සැකසුම්කරු/ ජාල සහකාර

පුස්තකාලය

විශාකා නර්මදා, සහකාර පුස්තකාලයාධිපති

කාර්යාල ආධාරක / රියදුරන්

ජී. ආර්. වික්‍රමසේන
එච් එස් උදයකාන්ත
නිහාල් වසන්ත
පී යූ කේ රාජසිරි
එස්. පී. ගාමිණි

කාර්ය මණ්ඩලයේ වසර අවසාන සුහද හමුව
GARTON'S ARK ON **2019 දෙසැම්බර් මස 17**








ප්‍රකාශන 2019



ශ්‍රී ලංකාවේ රැකියාවල, අධ්‍යාපනයෙහි හෝ පුහුණුවීම් වල නිරතවී නොසිටින තරුණ තරුණියන්: අධ්‍යාපනයෙහි, රැකියාවල හෝ පුහුණු වල නිරතව නොමැති තරුණ තරුණියන් පිළිබඳ විශ්ලේෂණයක්.



ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ ගොවීන් සඳහා දේශගුණික රක්ෂණය: දර්ශක පදනම් කර ගත් රක්ෂණයක් සඳහා අපේක්ෂාවන්



විශ්‍රාම ගැනීමේ වයස් සීමාවෙන් ඔබ්බට වැඩ කිරීම: ශ්‍රී ලංකාවේ වැඩිහිටි ශ්‍රම බලකායේ සහභාගිත්වයෙහි රටා සහ නිශ්චායක



එක් තිරයක් එක් මාවතක් වැඩසටහන, ණය සහ රාජ්‍යෝපායය: චීන ශ්‍රී ලංකා ආර්ථික සම්බන්ධතා සඳහා ඇති අභියෝග සහ අවස්ථා



ශ්‍රී ලංකාවේ පස් වැනි ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගය: එහි සඵලතාවය සහ අදාළත්වය පිළිබඳ ඇගයීමක්.



සංක්‍රමණය සහ ප්‍රේෂණ: ශ්‍රී ලංකාවේ ඉතිරිව සිටින පවුල්වල සාමාජිකයින්ගේ මූල්‍ය හැසිරීම කෙරෙහි ඇති කෙරෙන බලපෑම



පශ්චාත් ගැටුම් සංදර්භය තුළ සංවර්ධනයේදී දේශීය සහ අන්තර්ජාතික අභියෝග සහ අවස්ථා කළමනාකරණය කර ගැනීම: ශ්‍රී ලංකාවෙන් උගත හැකි පාඩම්



ශ්‍රී ලංකාව: ආර්ථිකයෙහි තත්ත්වය 2019



දකුණු ආසියානු ආර්ථික සඟරාව 21 වැනි වෙළුම

අභ්‍යන්තර සම්මන්ත්‍රණ

"කොන්ත්‍රාත් ගොවිතැන - ශ්‍රී ලංකාවේ තිරසර කෘෂිකර්මාන්තය සඳහා මාර්ගයක්" නිමේෂා දිසානායක, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය සම්මන්ත්‍රණ ශාලාව, ජනවාරි 23.

"ශ්‍රී ලංකාවේ පෝෂණ හිඳැස පුරවන්න", අනුසරා සිංකුමාර්වොං, ලෝක ආහාර වැඩසටහන, කොළඹ, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන සම්මන්ත්‍රණ ශාලාවේ, පෙබරවාරි 7.

"2019 අයවැය පිළිබඳ ට්විටර් සංවාදය", ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය සම්මන්ත්‍රණ ශාලාව, මාර්තු 5.



"ශ්‍රී ලංකාවේ පස් වැනි ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගය: සුළුත්වය සහ අදාළත්වය ඇගයීම",අශානි අබයසේකර, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන සම්මන්ත්‍රණ ශාලාව, මාර්තු 28.

"තරුණයින්ට ත්‍රිරෝද රථ රැකියාව සඳහා ඉඩ දෙන්නේද, නොදෙන්නේද - ශ්‍රී ලංකාවේ ත්‍රිරෝද රථ වෙළඳ පොළ සඳහා ඇති ප්‍රවේශය නියාමනය කළ යුතුද?" තිසලි ද සිල්වා, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ හිටපු ව්‍යාපෘති සීමාවාසික පුහුණුලාභී සහ 2018 සමන් කැලේගම අනුස්මරණ පර්යේෂණ ප්‍රදානලාභී, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය සම්මන්ත්‍රණ ශාලාව, අප්‍රේල් 30.



"රැකියාවේ දී කාන්තාවන් මුහුණ දෙන අභියෝග: සුපිරි වෙළඳසැල්වල සහ වෛද්‍ය මධ්‍යස්ථානවල තත්ත්වයන්", චතුර්ගා කරුණානයක, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන සම්මන්ත්‍රණ ශාලාව, මැයි 31.

"ශ්‍රී ලංකාවේ ඉඩම් සඳහා ප්‍රවේශය, ජීවනෝපාය විවිධාංගීකරණය සහ ග්‍රාමීය තරුණ සංක්‍රමණය", රුවන් සමරවීර, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය සම්මන්ත්‍රණ ශාලාව, ජුනි 27.

"ශ්‍රී ලංකාවේ වී ගොවිතැනෙහි තරගකාරිත්වය සහ ලාභදායීබව" නිමේෂා දිසානායක, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය සම්මන්ත්‍රණ, අගෝස්තු 29,

"ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය සංවර්ධනයේ විෂමතාවන්හි නිශ්චායක: ප්‍රාදේශීය සංවර්ධන ප්‍රතිපත්තිය සහ ගැටළු පිළිබඳ ආනුභවික විමර්ශණයක්", චාමිනි



තිලන්කා, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන සම්මන්ත්‍රණ ශාලාව, ජූලි 31.

"ශ්‍රී ලංකාවේ විශ්‍රාම වැටුප් ප්‍රතිසංස්කරණ අසාර්ථක වූයේ ඇයි?", බුද්ධිකා ජයතිස්ස, සහකාර අධ්‍යක්ෂ (ප්‍රතිපත්ති), විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන සම්මන්ත්‍රණ ශාලාව, ඔක්තෝබර් 29.

"පෝෂණ අංශය සඳහා රාජ්‍ය අරමුදල් සැපයීම ශ්‍රී ලංකාවේ ඉලක්ක කර තිබේද?" ප්‍රියංකා ජයවර්ධන, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය සම්මන්ත්‍රණ ශාලාව, සැප්තැම්බර් 30.

"නිපුණතා මට්ටම අනුව සේවක ස්ථානගත කිරීම් පිළිබඳ තීරණ: ඉහළ හා අඩු නිපුණතා ඇති ශ්‍රමිකයින් පවුල් බැඳීම් වලින් වෙන්ව යාමෙන් ඇතිවන සුභසාධන බලපෑම්" දේශමිත්‍ර හර්ෂනි ජයසේකර, ආචාර්ය උපාධි අපේක්ෂක, පෙන්සිල්වේනියා ප්‍රාන්ත විශ්ව විද්‍යාලය, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන සම්මන්ත්‍රණ ශාලාව, නොවැම්බර් 15.

"දකුණු කොරියාවේ අඩු නිපුණතා සංක්‍රමණිකයන්ගේ පිරිවැය: ශ්‍රී ලංකාව සම්බන්ධ තත්ත්වය", ජනක විජයසිරි, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය සම්මන්ත්‍රණ ශාලාව, දෙසැම්බර් 3

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ සීමාවාසික පුහුණු වැඩසටහන 2019

නම	තනතුර	සිට	දක්වා	විශ්වවිද්‍යාලය
දමිත්‍රි මුණසිංහ	ව්‍යාපෘති සීමාවාසික	2019,03,11	2019,07,12	අදාළ නොවේ
ඉෂානි සේනාධීර	ව්‍යාපෘති සීමාවාසික	2019,03,18	2019,06,14	විවෘත විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
නිෂිටා විජේරත්න	ව්‍යාපෘති සීමාවාසික	2019,07,22	2019,09,06	ඩර්හැම් විශ්වවිද්‍යාලය, එක්සත් රාජධානිය
ධනංජනී බස්නායක	ව්‍යාපෘති සීමාවාසික	2019,08,15	2020,01,31	රුහුණු විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
කනිෂ්ක වේරවැල්ල	ව්‍යාපෘති සීමාවාසික	2019,09,02	2019,12,31	කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
මාලත ගුණරත්න	ව්‍යාපෘති සීමාවාසික	2019,09,11	2019,12,10	ලන්ඩන් විශ්වවිද්‍යාලය, එක්සත් රාජධානිය
නිමේෂා කරුණාරත්න	පුස්තකාල සීමාවාසික	2019,10,23	2020,01,30	කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
ෂෙහානි අතාවුද බණ්ඩාර	පුස්තකාල සීමාවාසික	2019,10,23	2020,01,30	කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
හේලි ද අල්විස්	ව්‍යාපෘති සීමාවාසික	2019,12,05	2020,05,04	රජරට විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව



ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය
2019 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන
මූල්‍ය ප්‍රකාශන

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය
මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය
දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

	සටහන්	2019 (රු)	2018 (රු)
ආදායම			
ශ්‍රී ලංකා රජයේ ප්‍රදාන	2	16,500,000	18,000,000
ව්‍යාපෘති ආදායම	3	42,275,808	49,829,065
අන්තර්ජාතික සංවර්ධන පර්යේෂණ මධ්‍යස්ථානයෙන් ලැබුණු මුදල්, ටී.ටී.අයි. ප්‍රදාන	4	5,601,648	23,435,895
සම්මන්ත්‍රණ/වැඩමුළු ආදියෙන් ලැබුණු ආදායම	5	16,883,382	6,029,313
පොළී ආදායම		41,351,451	37,676,927
ශ්‍රවණාගාරය කුලියට දීමෙන් ලැබුණු ආදායම		1,499,982	1,277,481
විවිධ ආදායම්	6	854,726	1,116,586
බැහැර කිරීම් මත ලැබුණු ලාභය	14	45,000	1,905,556
විනිමය ලාභ			704,328
භුවමාරුමය නොවන ගනුදෙනු වලින් ලැබුණු ආදායම් - පුනරාවර්තන			
ආයෝජන භාර අරමුදලෙන් ලැබුණු දායකත්වය	22	25,000,000	-
භුවමාරුමය නොවන ගනුදෙනු වලින් ලැබුණු ආදායම් - ප්‍රාග්ධන			
ආයෝජන භාර අරමුදලෙන් ලැබුණු දායකත්වය	22	29,482,615	57,832,288
මුළු ආදායම		**179,494,612**	197,807,439
වියදම්			
සේවක පිරිවැය	7	64,676,003	59,465,658
පර්යේෂණ පිරිවැය	8	19,326,676	28,528,666
සම්මන්ත්‍රණ සහ වැඩමුළු පිරිවැය		9,019,365	4,402,510
උපයෝගිතා වියදම්		16,345,495	15,622,524
ගමන් වියදම්		233,807	384,173
වෙනත් මෙහෙයුම් වියදම්	9	19,331,168	10,813,147
ශ්‍රවණාගාරය කුලියට දීම		484,872	404,656
විනිමය පාඩු		402,619	-
මුළු වියදම		**129,820,005**	119,621,334
කාල පරිච්ඡේදය සඳහා ජංගම අතිරික්තය (ඌණතාවය)		**49,674,607**	78,186,105
ද්‍රව්‍යපළ, පිරියත සහ උපකරණ මත ක්ෂය	14	18,871,092	13,744,139
කාල පරිච්ඡේදය සඳහා ප්‍රාග්ධන අතිරික්තය (ඌණතාවය)		**30,803,515**	64,441,966
ආදායම් බදු වියදම්	10	795,869	67,328
වර්ෂය සඳහා අතිරික්තය		**30,007,646**	64,374,638

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය
දෙසැම්බර් 31 වැනි දිනට

	සටහන්	2019 (රු)	2018 (රු)
වත්කම්			
ජංගම වත්කම්			
මුදල් සහ මුදල් හා සමාන දෑ	**11**	191,659,007	54,854,909
ආයෝජන	**15**	104,036,945	144,933,424
ලැබිය යුතු වෙළඳ	**16**	4,607,344	9,831,269
තොග - ප්‍රකාශන		1,498,602	1,179,607
තැන්පතු සහ පූර්ව ගෙවීම්	**12**	10,015,027	9,825,055
ලැබිය යුතු පොළී		5,776,944	6,548,246
වෙනත් ලැබිය යුතු	**13**	21,515,860	57,190,326
මුළු ජංගම වත්කම්		**339,109,729**	284,362,836
ජංගම නොවන වත්කම්			
දේපළ යන්ත්‍රසූත්‍ර සහ පිරිවැය	**14**	453,072,460	458,450,439
දීර්ඝ කාලීන ආයෝජන	**15**	171,475,788	176,362,554
තැන්පතු සහ පූර්ව ගෙවීම්	**12**	2,433,456	6,985,297
මුළු ජංගම නොවන වත්කම්		**626,981,704**	641,798,290
මුළු වත්කම්		**966,091,433**	926,161,126
වගකීම්			
ජංගම වගකීම්			
වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු	**17**	6,709,020	6,246,233
ව්‍යාපෘති මත අත්තිකාරම් ලැබීම්	**18**	17,926,007	12,092,518
මුළු ජංගම වගකීම්		**24,635,027**	18,338,751
ජංගම නොවන වගකීම්			
සේවක ප්‍රතිලාභ	**19**	17,236,511	13,861,669
කාර්ය මණ්ඩල සුභසාධන අරමුදල		2,875,917	2,624,375
මුළු ජංගම නොවන වගකීම්		**20,112,428**	16,486,044
මුළු වගකීම්		**44,747,455**	34,824,795
ශුද්ධ වත්කම්		**921,343,978**	891,336,331
හිමිකම්			
සමුච්චිත අතිරික්තය		**921,343,978**	891,336,331

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූලව සකස් කර ඇත.

.....	.....
ප්‍රධාන මූල්‍ය නිලධාරී	විධායක අධ්‍යක්ෂ

.....	.....	.....
සභාපති	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

මෙහි 5 වැනි පිටුවේ සිට 8 වැනි පිටුව දක්වා වන පිටුවල ඇති හිණුම්කරණ ප්‍රතිපත්ති සහ 9 වැනි පිටුවේ සිට 16 වැනි පිටුව දක්වා වන පිටුවල ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල ම අත්‍යාවශ්‍ය කොටසක් වේ. ආයතනයෙහි අධ්‍යක්ෂ මණ්ඩලය මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කර ඉදිරිපත් කිරීමේ වගකීම දරයි.

.....
කොළඹ

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය

මදල් ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය

දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

	සමුච්චිත අතිරික්තය (රු.)
2017 දෙසැම්බර් 31 දිනට ශේෂය (පුනප්‍රකාශ කරන ලද)	826,961,693
වර්ෂය සඳහා ආදායම් අතිරික්තය	64,374,638
2018 දෙසැම්බර් 31 දිනට ශේෂය	891,336,331
වර්ෂය සඳහා ආදායම් අතිරික්තය	**30,007,646**
2019 දෙසැම්බර් 31 දිනට ශේෂය	**921,343,978**

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය
මුදල් ප්‍රවාහ ප්‍රකාශය
දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් ජනිත වූ මුදල් ගලනය	සටහන්	2019 (රු)	2018 (රු)
බදු ගෙවීමට පෙර අතිරික්තය/(ඌනතාවය)		**30,007,646**	64,374,638
ගැලපීම්			
සේවක සුභසාධක අරමුදලෙහි මාරු කිරීම්		251,542	214,009
දේපළ, පිරියත හා උපකරණ මත ක්ෂය	**14**	18,871,092	13,744,139
පාරිතෝෂික ප්‍රාතිපාදන / (ප්‍රතිවර්තන)	**19**	3,563,963	3,388,412
පොළී ආදායම		(41,351,451)	(37,676,927)
බොල් ණය සඳහා ප්‍රතිපාදන අඩුවීම		(115,787)	361,094
වත්කම් අලෙවි කිරීම/ කපා හැරීම මත (ලාභය) /අලාභය		(45,000)	(1,778,984)
කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර ශුද්ධ මුදල් ගලා ඒම/ (ගලා යාම)		**11,182,005**	42,626,381
ලැබිය යුතු වෙළඳ (වැඩිවීම)/අඩුවීම		5,339,712	(637,199)
තොග (වැඩිවීම)/අඩුවීම		(318,995)	67,388
තැන්පතු සහ ගෙවීම් (වැඩිවීම)/අඩුවීම		4,361,869	(11,954,710)
ලැබිය යුතු වැට් සහ ජා.ගො.බ. (වැඩිවීම)/අඩුවීම		-	-
වෙනත් ලැබිය යුතු (වැඩිවීම)/අඩුවීම		35,674,466	(39,370,848)
අත්තිකාරම් ලැබීම් (වැඩිවීම)/අඩුවීම		5,833,489	(21,493,631)
ගෙවිය යුතු වෙළඳ සහ අනෙකුත් දෑ (වැඩිවීම)/අඩුවීම		462,787	(361,975)
මෙහෙයුම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ගලා ඒම / (ගලා යාම)		**62,535,333**	(31,124,594)
පාරිතෝෂික ගෙවීම්	**19**	(189,119)	(2,142,106)
මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් ජනිත වූ ශුද්ධ මුදල් ගලා ඒම / (ගලා යාම)		**62,346,214**	(33,266,700)
ආයෝජන ක්‍රියාකාරකම් වලින් සිදුවූ මුදල් ගලනය			
දේපළ, පිරියත සහ උපකරණ මිලදී ගැනීම	**14**	(13,493,115)	(16,844,333)
ලැබුණු පොළිය		37,649,784	40,418,177
බැහැර කළ දේපළ, පිරියත සහ උපකරණ අලෙවියෙන් ලැබුණු මුදල		45,000	2,150,000
ආයෝජන මිලදී ගැනීම		(131,904,759)	(38,173,099)
ආයෝජන විකිණීමෙන් ලැබුණු මුදල්		45,912,169	42,704,704
ආයෝජන ක්‍රියාකාරකම් වලින් සිදුවූ ශුද්ධ මුදල් ගලා ඒම/(ගලා යාම)		**(61,790,921)**	30,255,449
මූල්‍ය ක්‍රියාකාරකම් තුළින් සිදුවූ මුදල් ගලනය		-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් සිදුවූ ශුද්ධ මුදල් ගලා ඒම/(ගලා යාම)		**-**	-
මුදල් සහ මුදල් හා සමාන දෑ වල ශුද්ධ (අඩුවීම) / වැඩිවීම		555,293	(3,011,251)
වර්ෂය ආරම්භයේදී මුදල් සහ මුදල් හා සමාන දෑ (සටහන 11)		2,786,325	5,797,576
වර්ෂය අවසානයේදී මුදල් සහ මුදල් හා සමාන දෑ		**3,341,619**	2,786,325
(අ) මුදල් සහ මුදල් හා සමාන දෑ සැසඳුම			
බැංකුවේ ඇති මුදල්		3,251,619	2,696,325
අත ඇති මුදල්		90,000	90,000
		3,341,619	2,786,325

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

1. පිහිටි ස්ථානය සහ නෛතික ස්වරූපය

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය 1988 අංක 53 දරණ පාර්ලිමේන්තු පනත මඟින් පිහිටුවා ඇති අතර 1990 අප්‍රේල් මාසයේ නිකුත් කරන ලද ගැසට් නිවේදනය මඟින් විධිමත්, නීත්‍යානුකූල ආයතනයක් ලෙස ස්ථාපිත කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි ලියාපදිංචි කාර්යාලය සහ ප්‍රධාන සේවා සැපයුම් ස්ථානය අංක 100/20, නිදහස් මාවත, කොළඹ 07, ශ්‍රී ලංකාව යන ලිපිනයෙහි පිහිටා ඇත.

1.1. ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් වල ස්වභාවය

ප්‍රතිපත්ති දිශානත කරගත් ආර්ථික පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම සහ ශ්‍රී ලංකාවේ මධ්‍ය කාලීන ප්‍රතිපත්ති විශ්ලේෂණය කිරීම ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ ප්‍රධාන ක්‍රියාකාරකම් වේ.

1.2. සකස් කිරීමේ පදනම

1.2.1. අනුකූලතා ප්‍රකාශය

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි මූල්‍ය ප්‍රකාශන, මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, මුදල් ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් වලින් සමන්විත වේ. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය සහ මුදල් අමාත්‍යාංශය ඒකාබද්ධව ප්‍රකාශයට පත් කර ඇති රාජ්‍ය අංශයේ ආයතන සඳහා වන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රතිපත්තීන්ට අනුකූලව මෙම මූල්‍ය ප්‍රාකාශන සකස් කර ඇත.

1.2.2. මිනුම් පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන අන්‍යාකාරයෙන් සඳහන් කර ඇත්තේ නම් මිස ඓතිහාසික පිරිවැය පදනමෙන් සකස් කර ඇත.

1.2.3. අඛණ්ඩභාවය

ආයතනයට පූර්වේක්ෂ අනාගතයෙහි දී ස්වකීය මෙහෙයුම් අඛණ්ඩව සිදු කරගෙන යාම සඳහා ප්‍රමාණවත් සම්පත් තිබෙන බවට ආයතනයෙහි පාලක මණ්ඩලය සෑහීමකට පත්වෙති. ඒ අනුව මෙම මූල්‍ය ප්‍රකාශන ආයතනයෙහි අඛණ්ඩභාවය පදනම් කරගෙන සකස් කර ඇත.

1.3. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය

අන්‍යාකාරයෙන් සඳහන් කර ඇත්තේ නම් මිස මෙම ගිණුම්කරණ ප්‍රතිපත්ති ගිණුම් ප්‍රකාශන ඉදිරිපත් කරන සෑම වර්ෂයකටම එක සේ අදාළ වන පරිදි යොදා ගෙන ඇත.

(අ) විදේශ මුදල් ගනුදෙනු

මෙම මූල්‍ය ප්‍රකාශන ආයතනයෙහි ක්‍රියාකාරී මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇත. විදේශීය මුදල් ඒකක වලින් සිදු කරනු ලබන ගනුදෙනු මූලිකව ම ගනුදෙනුව සිදු කරන දිනය වනවිට පවතින ක්‍රියාකාරී මුදල් ඒකකයෙහි අනුපාතයට වාර්තා කරනු ලැබේ. විදේශීය මුදල් ඒකක වලින් නාමනය කර ඇති මුදල්මය වත්කම් සහ වගකීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දිනය වන විට පවතින අදාළ විදේශීය මුදල් ඒකකවල ක්‍රියාකාරී මුදල් ඒකකයෙහි තත්කාලීන අනුපාතයට පරිවර්තනය කරනු ලැබේ. සියලුම වෙනස්කම් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයට ගනු ලැබේ.

(ආ) දේපළ, පිරියත සහ උපකරණ

දේපළ, පිරියත සහ උපකරණ සමුච්චිත ක්ෂය සහ හානිකරණ අලාභය අඩු කළ පිරිවැයට සඳහන් කරනු ලැබේ.

ඉන් පසුව කරනු ලබන වියදම්

ප්‍රධාන පරීක්ෂා කිරීම් සහ අලුත් වැඩියා වියදම් ද ඇතුළුව වෙනම ම ගණන් ගනු ලබන දේපළ, පිරියත සහ උපකරණ අයිතමවල උපාංගයක් ප්‍රතිස්ථාපනය කිරීම සඳහා දරනු ලබන වියදම ප්‍රාග්ධනීත කරනු ලැබේ. පසුව සිදු කරනු ලබන අනෙකුත් වියදම් මඟින් දේපළ, පිරියත සහ උපකරණ අයිතමයෙහි අඩංගු අනාගත ආර්ථික ප්‍රතිලාභය වැඩි දියුණු වූ විට පමණක් එම වියදම් ප්‍රාග්ධනීත කරනු ලැබේ. අනෙකුත් සියලුම වියදම් දරන ලද වියදමක් ලෙස මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයෙහි හඳුනා ගනු ලැබේ.

දේපළ, පිරියත සහ උපකරණ (ඉතිරි කොටස)

ඇස්තමේන්තු කළ ප්‍රයෝජනවත් ආර්ථික ජීවිත කාලය පදනම් කර ගෙන වාර්ෂිකව පහත සඳහන් වන අනුපාත යොදා ගනිමින් සරල රේඛීය ක්‍රමයට අගය ක්ෂය කිරීම් ගණනය කරනු ලැබේ:

පරිගණක උපකරණ	33%
වෙබ් පිටු සැලසුම්	33%
මෝටර් සයිකල්	10%
ලීබඩු	10%
කාර්යාල උපකරණ	10%
මෝටර් වාහන	10%
පුස්තකාල පොත්	25%
ගොඩනැගිලි	2%

වත්කම්වල ප්‍රයෝජනවත් ජීවිත කාලය සෑම මූල්‍ය වර්ෂයක් ආරම්භයේදී ම සමාලෝචනය කරනු ලැබේ. අපේක්ෂිත ජීවිත කාලය පෙර වර්ෂයෙහි ඇස්තමේන්තු කරන ලද කාලයට වඩා වෙනස් වී ඇත්නම්, එම වෙනස්කම් පිළිබිඹු වන පරිදි සංශෝධන සිදු කරනු ලැබේ.

වත්කමක් භාවිතය සඳහා සූදානම්ව තිබෙන අවස්ථාවේ සිට එම වත්කමෙහි අගය ක්ෂය කිරීම ආරම්භ කරනු ලබන අතර, එම වත්කම විකිණීම සඳහා තිබෙන ලෙස වර්ග කරනු ලබන දිනය හෝ එම වත්කම ඉවත් කරනු ලබන දිනය යන දෙකෙන් පූර්වයෙන් යෙදෙන දිනට එම වත්කමෙහි අගය ක්ෂය කිරීම අවසන් කරනු ලැබේ.

හානිකරණය

සිද්ධීන් හෝ වාතාවරණයන්හි වෙනස්වීම් මගින් වත්කමක ධාරණ අගය නැවත අය කර ගත නොහැකි බවට පෙනී යන ඕනෑම අවස්ථාවක හානිකරණය සඳහා එම දේපළ, පිරියත සහ උපකරණවල ධාරණ අගය සමාලෝචනය කරනු ලැබේ. වත්කමක ධාරණ අගය එහි ඇස්තමේන්තු කළ නැවත අයකර ගත හැකි මුදලට වඩා වැඩි නම්, එම වත්කමෙහි ධාරණ වටිනාකම එකෙනෙහිම එහි නැවත අයකර ගත හැකි අගයට ලියා තබනු ලැබේ.

(ඇ) කල්බදු

වත්කම් කල්බදු දීමක් යටතේ බදු දීමනාකරු විසින් හිමිකාරිත්වයෙහි සියලුම අවදානම් සහ ප්‍රතිලාභ සජීවී ලෙස රඳවා ගනු ලබන කල්බදු මෙහෙයුම් කල්බදු ලෙස වර්ග කරනු ලැබේ. මෙහෙයුම් කල්බදු යටතේ වන ගෙවීම් කල්බදු කාලපරිච්ඡේදය පුරා සරල රේඛීය ක්‍රමයක් මත මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයයෙහි සටහන් කරනු ලැබේ.

කල්බදු කාලපරිච්ඡේදය අවසන් වීමට පෙර මෙහෙයුම් කල්බදු ගිවිසුමක් අවසන් කරන විට, දණ්ඩනයක් ආකාරයෙන් බදු දීමනාකරු වෙත කිසියම් ගෙවීමක් සිදු කිරීමට තිබේ නම්, එම ගෙවීම එකී බදු ගිවිසුම අවසන් වීම සිදු කරන ලද කාල පරිච්ඡේදය තුළ දරන ලද වියදමක් ලෙස හඳුනා ගනු ලැබේ.

(ඈ) ආයෝජන

මෙම ආයෝජන ස්ථාවර තැන්පතු, භාණ්ඩාගාර බිල්පත් / ප්‍රතිමිලදී ගැනීම් ගිවිසුම්, භාණ්ඩාගාර බැඳුම්කර සහ සාංගමික ණයකරවලින් සමන්විත වේ.

i. ස්ථාවර තැන්පතු

ස්ථාවර තැන්පතුවල තිබෙන ආයෝජන ඒවායෙහි පිරිවැයට ගණන් ගනු ලැබේ. මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දිනට උපචිත වන පොළිය ලැබිය යුතු පොළී ලෙස දක්වනු ලැබේ.

ii. භාණ්ඩාගාර බිල්පත් / ප්‍රතිමිලදී ගැනීම් ගිවිසුම්

භාණ්ඩාගාර බිල්පත්වල සහ ප්‍රතිමිලදී ගැනීම් ගිවිසුම්වල ඇති ආයෝජන මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දිනට පොළිය එකතු කළ පිරිවැයට දක්වනු ලැබේ.

iii. භාණ්ඩාගාර බැඳුම්කර

භාණ්ඩාගාර බැඳුම්කරවල ඇති ආයෝජන මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දිනට ඇති පිරිවැයට සඳහන් කරනු ලැබේ.

ආයතනයට මෙම ආයෝජන කල්පිරීම දක්වා තබා ගැනීමේ සාධනීය අභිප්‍රාය සහ හැකියාව තිබෙන නිසා මෙම අයෝජන කල්පිරීමට තබා ගෙන ඇති ආයෝජනයන් (ජංගම නොවන) ලෙස වර්ග කරනු ලැබේ.

iv. සාංගමික ණයකර

සාංගමික ණයකරවල ඇති ආයෝජන මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දිනට ඇති පිරිවැයට සඳහන් කරනු ලැබේ.

ආයතනයට මෙම ආයෝජන කල්පිරීම දක්වා තබා ගැනීමේ සාධනීය අභිප්‍රාය සහ හැකියාව තිබෙන නිසා මෙම අයෝජන කල්පිරීමට තබා ගෙන ඇති ආයෝජන (ජංගම නොවන) ලෙස වර්ග කරනු ලැබේ

(ඊ) තොග

ප්‍රකාශන තොග වලින් තොග සමන්විත වේ. ප්‍රකාශන ඒවායෙහි පිරිවැයට සඳහන් කරනු ලැබේ. වසර දහයකට (10) වැඩි කාලයක් තබා ගෙන තිබෙන ප්‍රකාශන තිබේ නම් ඒවා සෙමින් චලනය වන තොග ලෙස සලකා කපා හැර ඇත.

(උ) අය විය යුතු දෑ

ලැබිය යුතු දෑ ඒවායෙහි අපේක්ෂිත උපලබ්ධි අගයට ධාරණය කරනු ලැබේ. ණයගැතියන් අබණ්ඩව සිදු කෙරන පදනමක් මත සමාලෝචනය කරනු ලැබේ. අයකර ගත නොහැකි යැයි හඳුනාගෙන තිබෙන ණය එසේ හඳුනාගත් වර්ෂය තුළදී කපා හරිනු ලැබේ.

අඩමාන ණය සඳහා වෙන් කළ යුතු ප්‍රතිපාදන හඳුනා ගැනීම පිණිස එක් එක් හානිකරණය තක්සේරු කිරීමේ ක්‍රමය යොදා ගනු ලැබේ. මාස 03 සිට මාස 06 දක්වා පැරණි ශේෂ සඳහා 10% ක් ද, මාස 06 සිට මාස 12 දක්වා පැරණි ශේෂ සඳහා 50% ක් ද, මාස 12 වැඩි ශේෂ සහිත ණය ගැතියන් සඳහා 100% ක් ද වශයෙන් එක් එක් හානිකරණයවූ ණයගැතියන් සඳහා ප්‍රතිපාදන වෙන් කරනු ලැබේ.

(ඌ) මුදල් සහ මුදල් හා සමාන දෑ

මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි කාර්යයන් සඳහා, මුදල් සහ මුදල් හා සමාන දෑ බැංකුවේ තිබෙන මුදල්, අත ඇති මුදල්, කෙටි කාලීන තැන්පතු සහ භාණ්ඩාගාර බිල්පත් සහ බැංකු සමග එළඹී ඇති මාස තුනකට අඩු කල්පිරීමේ කාලයක් සහිත ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම්, සහ බැංකු අයිරා ශුද්ධ අගයෙන් සමන්විත වේ. මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහිදී බැංකු අයිරා මාස තුනක හෝ එයට අඩු කල්පිරීමේ කාලයක් සහිත ජංගම වගකීම් යටතේ ඇතුළත් කර ඇත.

(එ) බැරකම් සහ ප්‍රතිපාදන

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ජංගම වගකීම් ලෙස වර්ග කර ඇති වගකීම් ඉල්ලීම මත ගෙවීමට ඇති හෝ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දිනයේ සිට එක් වර්ෂයක කාලයක් ඇතුළත ගෙවීමට ඇති වගකීම් වේ. මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දිනයේ සිට වර්ෂයක කාලයකට පසුව ගෙවීමට නියමිතව තිබෙන වගකීම් ජංගම නොවන වගකීම්වලට අයත් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී දන්නා සියලුම වගකීම් ගණන් ගෙන තිබේ.

අතීත සිද්ධීවල ප්‍රතිඵලයක් ලෙස ආයතනයට නෛතික හෝ සම්මුතික බැඳීමක් ඇති විට සහ එම වගකීම ඉටු කිරීම සඳහා ආර්ථික ප්‍රතිලාභ පිටතට ගලායාමක් සිදු වීම අවශ්‍ය වීමේ සසම්භාවිතාවක් ඇති විට වගකීම් සඳහා ප්‍රතිපාදන හඳුනා ගනු ලැබේ.

බොහෝ දුරට මෙම ආයෝජනවල කෙටි කාලීන කල් පිරීමේ කාලය හේතුවෙන් මුදල් සහ කෙටිකාලීන ආයෝජන, වෙළඳ ලැබිය යුතු දෑ, වෙළඳ ගෙවිය යුතු දෑ සහ අනෙකුත් ජංගම මූල්‍ය වත්කම් ඒවායෙහි ධාරණ අගයට ආසන්න වන බවට කළමනාකරණය විසින් තක්සේරු කර තිබේ.

(ඒ) සේවක ප්‍රතිලාභ

i. නිර්වචිත දායක සැලසුම්

ආයතනයෙහි සියලුම සේවකයින් සේවක අර්ථසාධක අරමුදලෙහි සහ සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදලෙහි සාමාජිකයින් වන අතර, එම අරමුදල් දෙක සඳහා මෙම ආයතනය සේවකයින්ගේ මූලික වේතනයෙන් හෝ වැටුපෙන් පිළිවෙලින් 12% සහ 3% බැගින් දායක මුදල් ගෙවයි.

ii. නිර්වචිත ප්‍රතිලාභ සැලැස්ම

ආයතනය විසින් ප්‍රක්ෂේපිත ඒකක ප්‍රතිලාභ ක්‍රමය භාවිතා කරමින් ආයුගණකයෙකුගේ උපදෙස් මත නිර්වචිත ප්‍රතිලාභ සැලැස්මක් වන පාර්තෝෂිකයේ විශ්‍රාම ප්‍රතිලාභවල වර්තමාන වටිනාකම මනිනු ලැබේ. ආයුගණක ලාභ සහ අලාභ මෙම සැලසුමට සහභාගීවන සේවකයින්ගේ ඉතිරි සාමාන්‍ය වැඩකරන අපේක්ෂිත ජීවිත කාලය පුරා ආදායම් හෝ වියදම් ලෙස හඳුනා ගනු ලැබේ.

(ඔ) ආදායම් හඳුනාගැනීම

i. ශ්‍රී ලංකා රජයෙන් ලැබෙන දායකත්වය

ශ්‍රී ලංකා රජයෙන් ලැබෙන දායකත්වය උපචිත පදනමකින් හඳුනාගනු ලැබේ.

ii. ව්‍යාපෘති ආදායම

ව්‍යාපෘති ආදායම ඉටුකිරීමට භාර ගෙන ඇති ව්‍යාපෘතිවල නිම කර ඇති අදියර පදනමෙන් හඳුනා ගනු ලැබේ. වැඩ නිම කර එහෙත් සේවාදායකයින් වෙත බිල්පත ලබා දී නොමැති ව්‍යාපෘති සකස් කෙරෙමින් පවතින බිල්පත් ශිණුමෙහි වාර්තා කරනු ලැබේ. ව්‍යාපෘතිවලින් ලැබෙන අත්තිකාරම් විලම්බිත ආදායම් ලෙස වර්ග කර මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ජංගම වගකීම් ලෙස ඉදිරිපත් කර ඇත.

iii. සම්මන්ත්‍රණ / වැඩමුළු වලින් ලැබෙන ආදායම

සම්මන්ත්‍රණ සහ වැඩමුළු පවත්වා අවසන්වූ විට එම සම්මන්ත්‍රණ සහ වැඩමුළු වලින් ලැබෙන ආදායම උපචිත පදනමකින් හඳුනාගනු ලැබේ.

iv. පොළී ආදායම

පොළී ආදායම උපචිත පදනමකින් ගණන් ගනු ලැබේ.

(ඕ)

i. ප්‍රාග්ධන වියදම් හඳුනා ගැනීම

ව්‍යාපාර කටයුතු කිරීම සඳහා යොදා ගනු ලබන හෝ ව්‍යාපාරයෙහි ආදායම් ඉපැයීමේ ධාරිතාවය වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය ස්ථිර ස්වභාවයේ වත්කම් අත්පත් කර ගැනීම, පුළුල් කිරීම හෝ වැඩිදියුණු කිරීම වෙනුවෙන් දරනු ලබන වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස සලකා ඇත.

ii. පුනරාවර්තන වියදම් වර්ගීකරණය කිරීම

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය ඉදිරිපත් කිරීමේ කාර්යය සඳහා, වියදම් ක්‍රමයේ ස්වභාවය මහින් ආයතනයෙහි කාර්යසාධනයෙහි මූලිකාංග සාධාරණ ලෙස ඉදිරිපත් කෙරෙන බව පාලක මණ්ඩලයෙහි මතය වන බැවින් එම ඉදිරිපත් කිරීමේ ක්‍රමය අනුගත කරගෙන ඇත.

2. ශ්‍රී ලංකා රජයයෙන් ලැබුණු ප්‍රදාන

ආයතනයෙහි උපයෝගීතා සහ නඩත්තු වියදම් සඳහා ශ්‍රී ලංකා රජයයෙන් ලැබුණු ප්‍රදාන වලින් සමන්විත වෙයි.

3. ව්‍යාපෘති ආදායම

ආයතන වලින් ලැබුණු ආදායම

	2019 (රු.)	2018 (රු.)
ආයතන වලින් ලැබුණු ආදායම	42,275,808	49,829,065

4. අන්තර්ජාතික සංවර්ධන පර්යේෂණ ආයතනයෙන් ලැබුණු ආදායම, TTI ප්‍රදාන

	2019 (රු.)	2018 (රු.)
කාලපරිච්ඡේදය සඳහා TTI ප්‍රදාන	5,601,648	23,435,895

අන්තර්ජාතික සංවර්ධන පර්යේෂණ ආයතනයෙහි TTI ප්‍රදාන 2 වැනි අදියර යටතේ හඳුනාගත් ආදායමෙහි කොටස මෙයින් පෙන්නුම් කෙරෙයි. 2014 ඔක්තෝබර් 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි වසර 4½ ක කාලයක් සඳහා වන කැනඩා ඩොලර් 950,000 ක් වූ එම ප්‍රදානයෙහි 2 වැනි අදියර ලබා ගැනීම සඳහා ආයතනය සුදුසුකම් ලැබුවේය. පර්යේෂණවල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමට, ආයතනික කාර්ය සාධනය වැඩි දියුණු කිරීමට සහ ප්‍රතිපත්ති සබැඳි සහ සංනිවේදන සහ විභිදුම් වැඩි දියුණු කිරීමට මෙම ප්‍රදානයන් යටතේ ලැබෙන අරමුදල් යොදා ගනු ලැබේ.

5. සම්මන්ත්‍රණ සහ වැඩමුළුවලින් ලැබුණු ආදායම

මෙය පරිත්‍යාග ලබා දෙන්නන්ගේ ඉල්ලීම මත, ආයතනය විසින් සිදු කරන ලද පර්යේෂණ වැඩ පිළිබඳ ප්‍රචාරණය කිරීමේ ක්‍රමයක් ලෙස පවත්වන ලද මෙම සම්මන්ත්‍රණ සහ වැඩමුළු වලින් ලැබුණු ආදායමෙන් සමන්විත වේ.

6. විවිධ ආදායම්

	2019 (රු.)	2018 (රු.)
ප්‍රකාශන අලෙවි කිරීම	630,955	909,951
තැපැල් ගාස්තු	8,075	-
වෙනත් ආදායම්	215,696	206,635
	854,726	1,116,586

7. සේවක පිරිවැය

	2019 (රු.)	2018 (රු.)
ප්‍ර.අ.ආ. කාර්ය මණ්ඩල වැටුප්	50,780,638	46,521,178
සේ.අ.අ.	5,758,642	5,445,340
සේ.නි.හා.අ.	1,439,660	1,228,923
ප්‍රසාද දීමනාව (සටහන 7.1)	1,122,065	1,176,400
සෞඛ්‍ය ප්‍රතිලාභ සහ ගාස්තු	1,914,685	1,614,603
වෙනත් ප්‍රතිලාභ	96,350	90,803
පාරිතෝෂික සඳහා වෙන් කිරීම් / (ප්‍රතිවර්තන) (සටහන 19)	3,563,963	3,388,411
	64,676,003	59,465,658

7.1 ප්‍රසාද දීමනාව

	2019 (රු.)	2018 (රු.)
අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලට සහභාගීවීම වෙනුවෙන් ගෙවන ලද දීමනා ඇතුළත් වේ	66,000	36,000

8. පර්යේෂණ පිරිවැය

	2019 (රු.)	2018 (රු.)
මුද්‍රණ සහ පරිගණක යතුරුලියන ප්‍රකාශන ගාස්තු	564,356	1,526,160
අන්තර්ජාල ගාස්තු	3,413,782	3,604,006
උපදේශක ගාස්තු	8,519,060	7,103,049
ක්ෂේත්‍ර කටයුතු අධීක්ෂණය	4,781,918	8,731,821
ව්‍යාපෘති සම්බන්ධ ප්‍රචාරණ වියදම්	1,027,271	4,473,334
වෙනත් පර්යේෂණ පිරිවැය	1,020,289	3,090,296
	19,326,676	28,528,666

9. වෙනත් මෙහෙයුම් වියදම්

	2019 (රු)	2018 (රු)
ලියාපදිංචි සහ සාමාජික ගාස්තු	420,806	370,149
කාර්යාල පිරිවැය	897,877	719,958
සාමාන්‍ය කාර්යාල පිරිවැය	4,666,326	4,543,041
පාරිභෝජ්‍ය ද්‍රව්‍ය	349,985	313,163
වෘත්තීයවේදී සහ නීති ගාස්තු	3,153,434	2,053,936
ජාල නඩත්තු කිරීම (සටහන 9.2)	3,594,748	291,333
විගණන සහ බදු ගාස්තු	288,420	507,527
වෙළඳ දැන්වීම්	14,400	112,897

බැංකු ගාස්තු / කොමිස්	112,407	150,157
වෙනත් පරිපාලන සම්බන්ධ වියදම්	257,397	351,178
රැඳවා ගැනීමේ බදු වියදම්	5,193,847	1,189,754
බොල් ණය සඳහා වෙන් කිරීම් / (ප්‍රතිවර්තන) (සටහන 9.1)	115,786	210,054
රැස්වීම් වියදම් - සේ.නි.හා.අ.	265,735	-
	19,331,168	10,813,147

9.1 රු. 167,567.92 ක ප්‍රතිපාදනය සංවර්ධන උපාය මාර්ග සහ අන්තර්ජාතික වෙළඳ අමාත්‍යාංශයෙන් අයවිය යුතුව තිබූ දීර්ඝ කාලීන හිඟ ශේෂය සඳහා 2019 වර්ෂයේදී වෙන් කරන ලදී. මෙම වර්ෂය තුළදී රු. 51,781.50 ක බොල් ණය ප්‍රතිවර්ථනයක් සිදු කරන ලදී. (2018: බොල් ණය සඳහා වෙන් කිරීම රු. 281,882.78 ක් වූ අතර, බොල් ණය ප්‍රතිවර්තනය රු.71,828.59 ක් විය.)

9.2 ජාල නඩත්තු ශේෂයට රු. 8,280,000.00 ක් වටිනා සේවා පද්ධති නඩත්තු ගිවිසුම ඇතුළත් වන අතර, එය වසර තුනක කාල පරිච්ඡේදයකදී ක්‍රමක්ෂය වීමට යටත්වේ.

10. ආදායම් බදු වියදම

ප්‍රවර්තන බදු වියදම

2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතෙහි විධිවිධානයන්ට අනුව, ආයෝජන වලින් ලැබෙන ආදායම සහ අවසන් රැඳවා ගැනීමේ ගෙවීම් පිළිවෙළින් 14% සහ 5% බැහින් වූ ආදායම් බද්දකට යටත් වේ. ඒ අනුව 2019 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වන වර්ෂයෙහි ආදායම් බදු සඳහා පහත සඳහන් පරිදි ප්‍රතිපාදන වෙන් කර ඇත:

ආයෝජන වලින් සිදුවූ පාඩුව	**2019 (රු)**
ශ්‍රවණාගාරය කුලියට දීමෙන් ලැබුණු ආදායම	1,499,982
(-) ශ්‍රවණාගාරය කුලියට දීමෙන් ලැබුණු ආදායම හා සම්බන්ධ වියදම්	(1,626,940)
ආයෝජනයෙන් සිදුවූ පාඩුව	(126,958)
අවසාන රැඳවා ගැනීමේ ගෙවීම් ලැබීම මත ගෙවිය යුතු බදු	
ආයෝජන හාර අරමුදලෙන් ලැබෙන ආදායම	54,482,615
වෙනත් පොළී ආදායම්	41,351,451
	95,834,066
(-) රැඳවා ගැනීමේ බද්ද අඩු කර ඇති ගෙවීම් මත පොළී ආදායම	79,916,683
(-) රැඳවා ගැනීමේ බද්ද අඩු කර නොමැති ගෙවීම් මත පොළී ආදායම	15,917,383
රැඳවා ගැනීමේ බද්ද අඩු කර ඇති ගෙවීම්වල පොළී ආදායම මත බදු (රු.15,917,383/- @ 5%)	795,869

11. මුදල් සහ මුදල් හා සමාන දෑ

	2019 (රු)	2018 (රු)
බැංකුවේ ඇති මුදල්	2,551,619	1,696,325
කෙටි කාලීන තැන්පතු ගිණුමෙහි ඇති මුදල්	700,000	1,000,000
සුළු මුදල්	90,000	90,000
මාස 03 ට අඩු කාලයක් තබා ගෙන ඇති ආයෝජන		
ප්‍රතිම්ලදී ගැනීම් ගිවිසුම් යටතේ ඇති ස්ථාවර තැන්පත් සහ භාණ්ඩාගාර බිල්පත්	188,317,388	52,068,584
	191,659,007	54,854,909

12. තැන්පතු සහ පූර්ව ගෙවීම් - කෙටි කාලීන

	2019 රු)	2018 (රු)
පූර්ව ගෙවීම් (සටහන 12.1)	7,979,007	9,227,346
තැන්පතු	276,550	273,350
වෙනත් අත්තිකාරම් (සටහන 12.3)	1,759,470	324,359
	10,015,027	9,825,055

තැන්පතු සහ පූර්ව ගෙවීම් - දීර්ඝ කාලීන

	2019 (රු)	2018 (රු)
පූර්ව ගෙවීම්(සටහන 12.2)	**2,433,456**	6,985,297

12.1 පූර්ව ගෙවීම්

	2019 (රු)	2018 (රු)
වෛද්‍ය රක්ෂණය	693,207	679,909
වෙනත් රක්ෂණ	363,551	210,419
වෙනත් පූර්ව ගෙවීම්	1,315,722	1,361,106
නඩත්තු කිරීම් (ජාල/සේවාදායක පද්ධති/මෘදුකාංග) - **කෙටිකාලීන**	5,606,527	6,975,912
	7,979,007	9,227,346

12.2 පූර්ව ගෙවීම්

	(රු)	(රු)
නඩත්තු කිරීම් (ජාල/සේවාදායක පද්ධති/මෘදුකාංග) - **දීර්ඝ කාලීන**	**2,433,456**	6,985,297

12.3 වෙනත් අත්තිකාරම්

	2019 (රු)	2018 (රු)
සමීක්ෂණ සම්බන්ධ වියදම් සඳහා අත්තිකාරම් ගෙවීම්	1,172,438	-
සමුළු සම්බන්ධ අත්තිකාරම් ගෙවීම්	-	324,359
වෙනත් සැපයුම්කරුවන් සඳහා අත්තිකාරම්	587,032	-
	1,759,470	324,359

13. වෙනත් ලැබිය යුතු

	2019 (රු)	2018 (රු)
කාර්ය මණ්ඩල ණය ගැතියෝ	3,560,793	3,956,573
අය විය යුතු වෙනත් මුදල් (සටහන (13.1)	17,955,067	53,233,753
	21,515,860	**57,190,326**

13.1 අය විය යුතු වෙනත් මුදල්

	2019 (රු)	2018 (රු)
ආයෝජන භාර අරමුදලෙන් ලැබිය යුතු මුදල්	**17,955,067**	53,233,753

14. දේපළ, පිරියත සහ උපකරණ

පිරිවැය	ඉඩම් (රු)	ගොඩනැගිලි (රු)	පරිගණක උපකරණ (රු)	මෝටර් වාහන (රු)	ලීබඩු සහ සවිකිරීම් (රු)	කාර්යාල උපකරණ (රු)	පුස්තකාල පොත් (රු)	එකතුව (රු)
2019 ජනවාරි 01 දිනට ශේෂය	156,000,000	324,428,666	85,317,962	23,525,945	19,944,261	23,739,225	1,726,313	634,682,372
එකතු කිරීම්	-	430,070	12,505,751	-	12,650	540,644	4,000	13,493,118
අඩුකළා - බැහැර කිරීම් (සටහන 01)	-	-	-	-	-	(484,510)	-	(484,510)
අඩුකළා - වත්කම් කපාහැරීම් (සටහන 02)	-	-	-	-	-	-	-	-
2019 දෙසැම්බර් 31 දිනට ශේෂය	**156,000,000**	**324,858,736**	**97,823,713**	**23,525,945**	**19,956,911**	**23,795,358**	**1,730,313**	**647,690,976**
සමුච්චිත ක්ෂය								
2019 ජනවාරි 01 දිනට ශේෂය	-	51,370,264	74,857,991	6,938,900	19,236,674	22,113,946	1,714,158	176,231,933
අගය ක්ෂය කිරීම් ගාස්තු	-	6,461,056	9,946,193	2,115,726	84,975	255,024	8,118	18,871,092
අඩුකළා - බැහැර කිරීම්	-	-	-	-	-	(484,510)	-	(484,510)
අඩුකළා - වත්කම් කපාහැරීම්	-	-	-	-	-	-	-	-
2019 දෙසැම්බර් 31 දිනට ශේෂය	-	**57,831,320**	**84,804,184**	**9,054,626**	**19,321,649**	**21,884,460**	**1,722,277**	**194,618,516**
2019 දෙසැම්බර් 31 දිනට	**156,000,000**	**267,027,416**	**13,019,529**	**14,471,319**	**635,262**	**1,910,898**	**8,036**	**453,072,460**

සටහන්: මෙම වර්ෂය තුළදී ආයතනය සම්පූර්ණයෙන්ම ක්ෂය වී තිබූ අධි ශීතකරණය සහ පිඟන් සෝදන යන්ත්‍රය රු 45,000 ක මුදලකට බැහැර කරන ලද අතර එමගින් බැහැර කිරීම් ලාභයක් අත් විය.

14. දේපළ, පිරියත සහ උපකරණ

පිරිවැය	ඉඩම් (රු)	ගොඩනැගිලි (රු)	පරිගණක උපකරණ (රු)	මෝටර් වාහන (රු)	ලීබඩු සහ සවිකිරීම් (රු)	කාර්යාල උපකරණ (රු)	පුස්තකාල පොත් (රු)	එකතුව (රු)
2018 ජනවාරි 01 දිනට ශේෂය	156,000,000	324,428,668	81,616,650	19,014,445	19,344,705	22,910,508	1,725,313	625,040,291
එකතු කිරීම්		-	3,915,060	11,500,000	599,556	828,717	1,000	16,844,330
අඩුකළා - බැහැර කිරීම්				(6,988,500)				(6,988,500)
අඩුකළා - වත්කම් කපාහැරීම්			(213,750)					(213,750)
2018 දෙසැම්බර් 31 දිනට ශේෂය	**156,000,000**	**324,428,666**	**85,317,962**	**23,525,945**	**19,944,261**	**23,739,225**	**1,726,313**	**634,682,372**
සමුච්චිත ක්ෂය								
2018 ජනවාරි 01 දිනට ශේෂය		44,881,672	69,766,563	11,937,051	19,185,985	21,946,513	1,601,244	169,319,029
ක්ෂය ගාස්තු		6,488,591	5,178,607	1,745,906	50,689	167,433	112,913	13,744,137
අඩුකළා - බැහැර කිරීම්				(6,744,056)				(6,744,056)

අඩුකළා - වත්කම් කපාහැරීම්			(87,178)					(87,178)
2018 දෙසැම්බර් 31 දිනට ශේෂය	**-**	**51,370,264**	**74,857,991**	**6,938,900**	**19,236,674**	**22,113,946**	**1,714,158**	**176,231,933**
2018 දෙසැම්බර් 31 දිනට	**156,000,000**	**273,058,402**	**10,459,971**	**16,587,045**	**707,587**	**1,625,279**	**12,155**	**458,450,439**

15. ආයෝජන - කෙටි කාලීන

	2019 (රු)	2018 (රු)
ස්ථාවර තැන්පතු - සේවක සුභසාධක අරමුදල	2,294,123	3,262,049
ස්ථාවර තැන්පතු - පාරිතෝෂික අරමුදල	18,296,643	16,450,247
ස්ථාවර තැන්පතු	83,446,179	125,221,128
	104,036,945	144,933,424

ආයෝජන - දිගු කාලීන

දිගු කාලීන ආයෝජන කල්පිරීම දක්වා රඳවා ගනු ලබන ආයෝජන යටතේ වර්ග කර ඇති පහත සඳහන් ආයෝජන වලින් සමන්විත වේ.

	2019 (රු)	2018 (රු)
භාණ්ඩාගාර බැඳුම්කර	99,945,962	99,817,038
සාංගමික ණයකර	71,529,826	76,545,516
	171,475,788	176,362,554

16. ලැබිය යුතු වෙළඳ

	2019 (රු)	2018 (රු)
ලැබිය යුතු වෙළඳ - ව්‍යාපෘති	3,307,711	6,985,114
බොල් ණය සඳහා වෙන් කිරීම්	(488,368)	(372,581)
සහස් කෙරෙමින් පවතින බිල්පත්	1,788,001	3,218,736
	4,607,344	9,831,269

17. වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු

	2019 (රු)	2018 (රු)
උපචිත (සටහන 17.1)	4,892,581	5,063,308
ණයහිමියෝ	-	31,500

සේ.හා.අ. සහ සේ.නි.හා.අ. ගෙවිය යුතු	921,749	804,479
ගෙවිය යුතු උපයන විට බදු	95,271	279,618
ගෙවිය යුතු මුද්දර බදු	3,550	-
ගෙවිය යුතු ආදායම් බදු	795,869	67,328
	6,709,020	6,246,233

17.1 **උපචිත**

	2019 (රු)	2018 (රු)
කාර්යාල පිරිවැය	1,047,166	1,289,819
විගණන ගාස්තු	870,164	1,416,665
විදුලිය ගාස්තු	595,604	572,606
දුරකථන / අන්තර්ජාල ගාස්තු	354,980	376,697
ඉන්ධන	44,772	68,843
දිරි දීමනා	1,752,791	1,338,677
පර්යේෂණ ව්‍යාපෘති වියදම්	227,104	-
	4,892,581	5,063,307

18. ව්‍යාපෘති සඳහා ලැබුණු අත්තිකාරම්

	2019 (රු)	2018 (රු)
ජනවාරි 01 දිනට ශේෂය	12,092,518	33,586,149
වර්ෂය තුළ ලැබීම්	24,692,756	26,317,976
භුක්තිකරණ ආදායම්	(18,859,266)	(47,811,607)
දෙසැම්බර් 31 දිනට ශේෂය	**17,926,007**	12,092,518

19. සේවක ප්‍රතිලාභ

	2019 (රු)	2018 (රු)
ජනවාරි 01 දිනට ශේෂය	13,861,669	12,615,364
වර්ෂය තුළ භුක්තිකරණ වියදම් /ප්‍රතිවර්තනය කරන ලද ප්‍රතිපාදන (සටහන 19.1)	3,563,963	3,388,412
වර්ෂය තුළ සිදු කරන ලද ගෙවීම්	(189,119)	(2,142,106)
දෙසැම්බර් 31 දිනට ශේෂය	**17,236,511**	13,861,669

2019 දෙසැම්බර් 31 දිනට ආයතනයෙහි සේවක සංඛ්‍යාව 41 ක් වේ (2018: 42).
2019 දෙසැම්බර් 31 දිනට ආයතනයෙහි සේවක ප්‍රතිලාභ ලැබීමට සුදුසුකම් ලබන සේවක සංඛ්‍යාව 41 ක් වේ (2018: 40).
මෙම වගකීම් වෘත්තීය ආයුගණක සමාගමක් විසින් තක්සේරු කර ඇත.
මෙම ප්‍රතිලාභ සපයා දීමේ දී ආයතනයට දැරීමට සිදුවන පිරිවැය තීරණය කිරීමේ දී පහත් සඳහන් උපකල්පන යොදා ගෙන ඇත.
වට්ටම් අනුපාතිකය 10.25% (2018:12%)
වැටුප් අනුපාතිකයෙහි වර්ධනය 9.20% (2018: 9.40%)
කාර්ය මණ්ඩල පිරිවැටුම් අනුපාතය 7% (2018: 15%)

19.1 වර්ෂය තුළ හඳුනාගත් වියදම්

	2019 (රු)	2018 (රු)
ප්‍රවර්තන සේවා පිරිවැය	1,594,506	1,297,033
පොළී පිරිවැය	1,663,400	1,387,690
ආයුගණක (ලාභය)/පාඩුව	306,057	703,689
	3,563,963	3,388,412

20. කල් බදු වගකීම්
මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනය වන විට කල් බදු වගකීම් නැත. (2018: නැත)

21. ප්‍රාග්ධන වගකීම්
මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනය වන විට ප්‍රාග්ධන වගකීම් නැත. (2018: නැත)

22. සම්බන්ධිත පාර්ශව ගනුදෙනු
ආයතනයෙහි ආයෝජන භාර අරමුදලෙහි (භාර අරමුදල) 2019 දෙසැම්බර් 31 දිනට රු. 501,804,645/- ක ශුද්ධ වත්කම් වටිනාකමක් තිබුණි. (2018: රු. 501,804,508/-). වෙනම ම විගණනය කරනු ලබන ආයෝජන භාර අරමුදල සඳහා වෙනම ම හිණුම පවත්වාගෙන යනු ලැබේ. මෙම භාර අරමුදල භාරකරුවන් පස් දෙනෙකුගෙන් සමන්විත වන අතර එයින් දෙදෙනෙකු නිල බලයෙන් පත් වන සාමාජිකයින් වේ (ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි සභාපතිවරයා සහ විධායක අධ්‍යක්ෂ). මෙම වර්ෂය තුළ දී පුනරාවර්තන වියදම් සඳහා භාර අරමුදලෙහි දායකත්වය රු. 25,000,000 ක් (2018: නැත) වූ අතර ප්‍රාග්ධන වියදම් සඳහා දායකත්වය රු. 29,482,615/- ක් (2018: 57,832,288/-) විය. තවද, රු. 17,955,067/- ක් ලැබිය යුතුව තිබේ (2018: 53,233,753/-).
පුනරාවර්තන වියදම් සඳහා ශ්‍රී ලංකා රජය විසින් රු. 16,500,000/- ක (2018: රු. 18,000,000/-) මුදලක් ආයතනයට ප්‍රදානය කරන ලදී.
ජාතික ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ සහ ආර්ථික ප්‍රතිසංස්කරණ සහ පොදු සැපයීම් අමාත්‍යාංශයේ ලේකම්, මහ බැංකුවේ අධිපති සහ ජාතික සැලසුම්කරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජෙනරාල් ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පාලක මණ්ඩලයට නිල බලයෙන් පත් වන සාමාජිකයින් වේ.

23. අවිනිශ්චිත වගකීම්
මූල්‍ය ප්‍රකාශන දිනය වන විට අවිනිශ්චිත වගකීම් නොතිබුණි.

24. මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනයෙන් පසුව සිදුවුණු සිදුවීම්
මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනයෙන් පසුව මූල්‍ය ප්‍රකාශනවල හෝ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීම් වල ගැළපීම් සිදුකිරීම අවශ්‍ය කරන සිදුවීම් සිදුවී නැත.

25. පාලක මණ්ඩලයේ වගකීම
ශ්‍රී ලංකා රාජ්‍ය අංශයෙහි හිණුම්කරණ ප්‍රතිපත්ති වලට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කර ඉදිරිපත් කිරීම පාලක මණ්ඩලයේ වගකීම වේ.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } එල්ඊඩබ්/සී/ අයිපීඑස් / 01/ 2019/01

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2020 සැප්තැම්බර් 28 දින

සභාපති

ශ්‍රී ලංකා ජාතික ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය

ශ්‍රී ලංකා ජාතික ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

පිටපත :- ලේකම් - මුදල් අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. | එල්ඊඩබ්/සී/ අයිපීඑස් / 01/ 2019/01 | ඔබේ අංකය உமது இல. Your No. |

දිනය திகதி Date | 2020 සැප්තැම්බර් ෂ දින

සභාපති

ශ්‍රී ලංකා ජාතික ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය

ශ්‍රී ලංකා ජාතික ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කල මතය

ශ්‍රී ලංකා ජාතික ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ආයතනයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.115,931,941 ක්වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණද තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇතිවූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණු අතර මේ පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කරද නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මහහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදි.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදි..

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත්වේ.

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආයතනය පවත්වාගෙන ගොස් තිබුණි.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබාගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණු වලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මගේ අවධානයට ලක් නොවීය.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට මණ්ඩලය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව අනාවාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියාකර ඇති බව.

නීතිරීති / විධානයට යොමුව	විස්තරය
අංක පීඊඩී/12 හා 2003 ජූනි 02 දිනැති දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.1 ඡේදය	ආයතනයේ කටයුතු කෙටිකාලීන සහ දිගුකාලීන දැක්මක් සහිතව කළමනාකරණය කිරීමට අවම වශයෙන් වර්ෂ තුනක කාලයක් සඳහා යෝජිත ඉලක්ක ඇතුළත් සංයුක්ත සැළැස්මක් පිළියෙල කල යුතු වුවද, ආයතනය විසින් සංයුක්ත සැළැස්මක් සකස් කර නොතිබුණි.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

3. අනෙකුත් විගණන නිරීක්ෂණ

(අ) සමාලෝචිත වර්ෂයේදී ආරම්භ කර වර්ෂය තුළදීම අවසන් කිරීමට නියමිතව තිබූ පර්යේෂණ ව්‍යාපෘති 07 ක් අවසන් කිරීමට නොහැකිව තිබුණු අතර ආයතනයේ පර්යේෂණ ව්‍යාපෘති මගින් ආදායම් උපයාගැනීම ඉකුත් වර්ෂයට වඩා සියයට 29 කින් අඩුවී තිබුණි.

(ආ) ආයතනය විසින් සමාලෝචිත වර්ෂයට අදාළව සකස් කරන ලද ක්‍රියාකාරී සැළැස්ම තුළ ඉකුත් වර්ෂය තුළදී අවසන් කිරීමට නියමිත වූ නමුත් අවසන්කර නොතිබූ පර්යේෂණ ව්‍යාපෘති 07 ක් සම්පූර්ණ කිරීම සඳහා රු.11,441,384 ක් වෙන්කර තිබුණි. කෙසේ වුවද ඉහත පර්යේෂණ ව්‍යාපෘති 07 නිම කිරීමට අපේක්ෂිත කාල වකවානු පිළිබඳ විස්තර ක්‍රියාකාරී සැළැස්මට අතුළත් කර නොතිබීම නිසා ක්‍රියාකාරී සැළැස්මේ ප්‍රගතිය ඇගයීමට නොහැකිවිය.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න

විගණකාධිපති

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය

විගණන වාර්තාව සඳහා ප්‍රතිචාර

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණනය

2. අනෙකුත් නීති, රීති, රෙගුලාසි වලට අනුකූල වීම

ආයතනික සැලැස්ම

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි දැක්ම / මෙහෙවර සහ ක්‍රමෝපායයන්ට අනුකූලව, පර්යේෂණ ක්‍රියාකාරකම් සඳහා ඉලක්ක සහ අරමුණු ද සහිතව තුන් අවුරුදු පර්යේෂණ න්‍යාය පත්‍රයක් (2018-2021) සකස් කරන ලදී. ඉන් පසු එක් එක් වර්ෂය සඳහා එම පර්යේෂණ න්‍යාය පත්‍රය මත පදනම්ව සකස් කරන ලද වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම ද සහිතව එම පර්යේෂණ න්‍යාය පත්‍රය 2018 වර්ෂයේදී ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පාලක මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදී.

විගණකවරුන් විසින් ලබා දෙන ලද නිර්දේශය වලට අනුව, වසර තුනක් (2020 - 2022) ආවරණය වන පරිදි සකස් කරන ලද විස්තීර්ණ ආයතනික සැලැස්මක 2020 වර්ෂයේ පැවති 1 වැනි පාලක මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කරන ලදී.

3. වෙනත් විගණන නිරීක්ෂණ

(අ) 2019 දී නිම නොකළ බවට වාර්තා කර ඇති ව්‍යාපෘති හත සම්බන්ධ ව්‍යාපෘති විස්තර පහත වගුවෙහි සඳහන් කර ඇත.

ව්‍යාපෘති කේතය	සටහන්
PJ 314	කොන්ත්‍රාත් කාලය අවසන් වන්නේ 2020/01/31 වන දිනයේදීයි. එහෙයින් 2019 වර්ෂයේදී ව්‍යාපෘතිය අවසන් නොවේ.
PJ 316	ව්‍යාපෘති කටයුතු 2019 දී අවසන් කරන ලදී.
PJ 312	පාස්කු ඉරිදා දින ප්‍රහාරය නිසා ඇතිවූ ගැටළු හේතුවෙන් සහ අරමුදල් සපයන ආයතනයේ ජාත්‍යන්තර උපදේශකයෙකුගේ ප්‍රතිපෝෂණ ලැබීමට ප්‍රමාද වීම හේතුවෙන් ව්‍යාපෘති කාලය දීර්ඝ කරන ලදී. 2020 ජුනි මාසයේදී මෙම ව්‍යාපෘතිය සම්පූර්ණ කර නිම ලදී.
PJ 284	2019 පළමු කාර්තුවේදී සම්පූර්ණ කරන ලදී.
PJ 315 B, C & E	කොන්ත්‍රාත් කාලය අවසන් වන්නේ 2020 අප්‍රේල් මාසයේදී වන බැවින් එම ව්‍යාපෘතිය 2019 වර්ෂයේදී අවසන් නොවේ

2018 වර්ෂයට සාපේක්ෂව 2019 වර්යේදී ආයතනයේ ආදායම 16% ක ප්‍රමාණයකින් අඩු වී ඇත. නොවැළැක්විය හැකි තත්වයන් හේතුවෙන් 2019 වර්ෂයේ දී අපේක්ෂිත නව ව්‍යාපෘති යෝජනා ඉල්ලීම් කැඳවීම් / ප්‍රදානය කිරීම් ප්‍රමාද විය. එහි ප්‍රතිඵලයක් ලෙස නව ව්‍යාපෘති වලින් අපේක්ෂිත ව්‍යාපෘති ආදායම අපේක්ෂා කළ ප්‍රමාණයට වඩා අඩු විය.

(ආ). 2018 සිට ඉදිරියට ගෙන ආ එම ව්‍යාපෘති හත අපේක්ෂිත පරිදි ඉදිරියට සිදු කර ගෙන ගොස් ඇති අතර අපේක්ෂිත ආදායම සපුරාලීමට ආයතනයට හැකි විය. එම ව්‍යාපෘති පිළිබඳ තොරතුරු 2020 අප්‍රේල් 9 වැනි දින විගණකවරුන් වෙත විද්‍යුත් තැපෑලෙන් යවන ලදී.



INSTITUTE OF POLICY STUDIES OF SRI LANKA
100/20, Independence Avenue,
Colombo 7,
Sri Lanka

Tel: +94 11 2143100 Fax: +94 11 2665065
Email: ips@ips.lk, Website: www.ips.lk
Blog: 'Talking Economics' - http://www.ips.lk/talkingeconomics
Twitter: www.twitter.com/TalkEconomicsSL